10 YEARS


IBSL

INSURANCE BOARD OF SRI LANKA

වාර්ෂික වාර්තාව 2011

# අපේක්ෂිත අරමුණු වෙත...





## පටුන

වර්ෂය තුළ වැදගත් සිදුවීම් 3 සභාපතිනියගේ පණිවිඩය 4 අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය 6
මණ්ඩලයේ සාමාජිකයන් 9 මණ්ඩල සාමාජිකයන් පිළිබඳව 10 ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 12
කාර්ය මණ්ඩලය 13 පොදු සමාලෝචනය 16 සංඛ්‍යානමය සමාලෝචනය 22 මෙහෙයුම් කටයුතු සමාලෝචනය 40
ශේෂ පත්‍රය 56 ආදායම් හා වියදම් ප්‍රකාශනය 57 සංචිත වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය 58
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 59 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 60
ගිණුම්කරණ ප්‍රතිපත්ති 61 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 63 විගණකාධිපතිවරයාගේ වාර්තාව 69
විගණකාධිපතිවරයා විසින් මතු කළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම 72 පරිශිෂ්ඨය I 74 පරිශිෂ්ඨය II 75
පාරිභාෂික ශබ්ද මාලාව 76



# අපේක්ෂිත අරමුණු වෙත...

නිවැරදි මාවතේ ගමන් ගන්නා කේන්ද්‍රීය ඒකකයක් ලෙස පසුගිය වසරේදී කර්මාන්තයේ ගමන් මග තහවුරු කරගත් අප, මේ වසරේ අපගේ මංපෙතෙහි තීරණාත්මක සන්ධිස්ථානයක් කරා ළඟා වී සිටින්නෙමු.

කර්මාන්තයෙහි ඇතිවී තිබෙන බොහෝ අභිවර්ධනයන් අනුව යමින්, නියාමන මණ්ඩලයක් ලෙස, අනාගතයේදී මණ්ඩලයට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග සහ අවස්ථාවන් සම්බන්ධයෙන්, මහත් උනන්දුවෙන් සහ සර්වශුභවාදීව ක්‍රියා කිරීමට අපට හැකිවෙනු ඇත. වගකිවයුතු සහ විනිවිද දැකිය හැකි රක්ෂණ කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා වූ අපගේ අරමුණ ඔස්සේ අඛණ්ඩව ගමන් කරමින්, රක්ෂණ කර්මාන්තය මෙන්ම ඒ හා සමාන විශේෂ උනන්දුවක් සහිත පුද්ගලයින් සඳහා ද එකසේ සුරක්ෂිත සහ වෘත්තීමය වටපිටාවක් නිර්මාණය කරන අතරම, මෙම අභිවෘද්ධියේ ගමන් මග කරා ළඟාවීමේ අරමුණ මුදුන් පමුණුවා ගැනීම පිණිස අපි මහත් පරිශ්‍රමයක් දරන්නෙමු.

# දැක්ම

"රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනය
හා ඒ පිළිබඳ මහජන විශ්වාසය
ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක්
නිර්මාණය කිරීම හරහා
රක්ෂණ කර්මාන්තයේ නියාමන
කාර්යරාමුව ශක්තිමත් කර එමගින්
තිරසාර ආර්ථික වර්ධනයට
දායකවීම"



# මෙහෙවර

"ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය
ගෞරවාන්විත ද රක්ෂණ සහතික
දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ
සහතික දරන්නන්ගේ සම්බන්ධතා
ආරක්ෂා වන වෘත්තීමය හා
විචක්ෂණ ආකාරයෙන් ද
කරගෙන යනු ලබන බවට
වගබලා ගැනීම"

# වර්ෂය තුළ වැදගත් සිදුවීම්



- රක්ෂණ සමාගම් 22
- රක්ෂණ තැරැව්කාර සමාගම් 46
- රක්ෂණ නියෝජිතයින් 32,651
- 2015 පෙබරවාරි වනවිට සංයුක්ත රක්ෂණ සමාගම් ඒකකයන් 2ක් බවට වෙන්කරනු ඇත
- සියලුම රක්ෂණ සමාගම් කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම
- අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම
- ආයතනික රක්ෂණ නියෝජිතයින් හඳුනාගැනීම
- රක්ෂණ සමාගම්වල ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ නංවන ලදී
- අවදානම් පාදක ප්‍රාග්ධනය කරා ගමන් කිරීම (RBC)

**රු.බි. 261.78**
රක්ෂණ කර්මාන්තය සතු මුළු වත්කම් ප්‍රමාණය

**රු.බි. 78.51**
රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය

### රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2011 | 2010 | වෙනස% |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය (රුපියල් බිලියන) | 78.51 | 66.25 | 18.5 |
| මුළු වත්කම් (රුපියල් බිලියන) | 261.78 | 219.10 | 19.5 |
| දළ දේශීය නිෂ්පාදිතයේ % ක් ලෙස ඉදිරිපත් කිරීම | 1.20 | 1.18 | 1.7 |
| රක්ෂණ ඝනත්වය (රුපියල්) | 3,762.14 | 3,207.91 | 17.3 |

### මණ්ඩලයේ කාර්යසාධනය

| | 2011 | 2010 | වෙනස% |
|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රුපියල් බිලියන) | 1.28 | 1.01 | 26.4 |
| සෙස් ආදායම (රුපියල් මිලියන) | 216.84 | 144.67 | 50.0 |
| වාර්ෂික ගාස්තු (රුපියල් මිලියන) | 34.58 | 29.19 | 18.5 |

# සභාපතිනියගේ පණිවිඩය



"නව්‍යකරණය වූ රක්ෂණ නිපැයුම් සහ මහජන විශ්වාසය කර්මාන්තයේ වර්ධනය සඳහා ඉවහල්වේ"

2011 වසර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය නියාමනයෙහි ලා දසවසරක් සපිරූ සුවිශේෂී වසරකි. ස්ථාවර හා ක්‍රියාශීලී රක්ෂණ කර්මාන්තයක් රටක ආර්ථික සංවර්ධනයට මහඟු ලෙස දායක වන හෙයින් කර්මාන්තයේ ස්ථිර වර්ධනයක් තිබීම අතිශය වැදගත්ය. මෙම ස්ථිර වර්ධනය තුලින් රක්ෂණ කර්මාන්තයට සහ රක්ෂණ ඔප්පු හිමියන් යන දෙපාර්ශවයටම ඵලදායී වන පරිදි සුදුසු නියාමන හා අධීක්ෂණ රාමුවක් සැකසීමට මණ්ඩලය නිරන්තරයෙන් කැපවිය.

2010 දී 8% ක් වූ වර්ධනයට සාපේක්ෂව 8.3% ක ධනාත්මක වර්ධනයක් මෙම වසර තුලදී ශ්‍රී ලංකා ආර්ථිකයේ පෙන්නුම් කළහ. දීර්ඝ කාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය සඳහා සමස්ත දළ ලිඛිත වාරික ආදායම පසුගිය වසරට සාපේක්ෂව 18.5% ක වර්ධනයක් පෙන්වමින් රුපියල් මිලියන 78,512ක් කරා ලඟා විය. ලියාපදිංචි රක්ෂණ සමාගම් ගණන 22 කි. එනමුත්, 2011 වසරේදී සමාගම් 21 ක් මෙහෙයුම් කටයුතු සිදුකරන ලද අතර ඉන් සමාගම් 3 ක් දීර්ඝකාලීන රක්ෂණය, 6 ක් සාමාන්‍ය රක්ෂණය සහ සමාගම් 12 ක් සංයුක්ත රක්ෂණයෙහි නියුතු විය.

මණ්ඩලයේ නිවැරදි මං පෙතක වූ ගමන් මග අරමුණු කරගෙන කර්මාන්තයේ හා පොදු මහජනතාවගේ විශ්වාසය තවදුරටත් තහවුරු කරගැනීමත් කර්මාන්තයේ වර්ධනයත් උදෙසා ක්‍රියාමාර්ග රාශියක් මෙම වසර තුලදී ගනු ලැබිණ.

"අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය" මත පදනම්ව අධීක්ෂණය කිරීමේ ක්‍රියාමාර්ගයෙහි අත්හදා බැලීම් කටයුතු 2012 වසර තුළදී සිදුකිරීමට නියමිතව ඇත. මෙම ක්‍රියාදාමය උදෙසා ලෝක බැංකුව, ෆස්ට් ඉනිෂියේටිව් සහ උපදේශකවරු වූ ඩිලොයිට් ටච් ටුමට්සු ඉන්දියා සමාගමටද ඔවුන්ගේ තාක්ෂණ දැනීම හා මූල්‍යමය ආධාර වෙනුවෙන් කෘතඥතාවය පළකර සිටීමට කැමැත්තෙමි.

මණ්ඩලය විසින් මෙම වර්ෂය තුලදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යාම පිණිස විදේශ රක්ෂණ සමාගමක 100%ක් පූර්ණ වශයෙන් හිමිකම් සහිත පරිපාලිත සමාගමක් වන ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙත බලපත්‍ර ප්‍රදානය කරන ලදී. ජාත්‍යන්තර සහ දේශීය ප්‍රවීණයින්ගේ සුසංයෝගය තුලින් රක්ෂණ කර්මාන්තයේ වර්ධනය තවදුරටත් ශක්තිමත් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

2011 පෙබරවාරි සිට ක්‍රියාත්මක වූ 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ සංශෝධිත පනත පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීම අදාළ වර්ෂය තුලදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ළඟාවූ තවත් ඉලක්කයක් ලෙස දැක්විය හැක.

රක්ෂණ ඔප්පු දරන්නන් හා අනාගත රක්ෂණ ඔප්පු දරන්නන් ආරක්ෂා කිරීමේ මණ්ඩලය සතු වගකීම තවදුරටත් සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය නියාමනයන් මෙම සංශෝධිත පනතින් ලැබීය. එකී සංශෝධනයට අනුව රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ සමාගම් සහ දිගුකාලීන රක්ෂණ සමාගම් ලෙස වෙන්කිරීම අනිවාර්ය වේ. එය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතියකි.

රක්ෂණ සමාගම්, බලපත්‍රලාභී කොටස් වෙළඳපොළක ලැයිස්තුගත කිරීමද මෙම සංශෝධිත පනතින් හඳුන්වා දෙනු ලැබුවේ කලක සිට පවත්වන ලද සාකච්ඡා වල ප්‍රතිඵලයක් වශයෙනි. 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත යටතේ ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල මේ වනවිට මණ්ඩලයේ නියාමන විෂය පථය යටතට ගෙන තිබේ.

රක්ෂකයෙකු ලෙස ලියාපදිංචි කිරීමට අවශ්‍ය ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 500 දක්වා වැඩි කරන ලදී. කර්මාන්තයෙහි අදහස් විමසීමෙන් සහ අදාල අවදානම් විශ්ලේෂණය කිරීමෙන් පසු නුබුන්වත් ආන්තික (සාමාන්‍ය රක්ෂණය) නීති සහ නුබුන්වත් ආන්තික (දීර්ඝකාලීන) නීති කර්මාන්තයේ අවශ්‍යතා වලට ගැලපෙන අයුරින් සංශෝධනය කරන ලදී.

රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා රක්ෂණයේ මූලධර්ම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම අවශ්‍යය යන සිද්ධාන්තය සැලකිල්ලට බඳුන් කරමින්, මහජනතාව අතර රක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස අප පියවරවල් රැසක් ගන්නා ලදී. ප්‍රවෘත්ති පත්‍ර දැන්වීම්, පුවත්පත් නිවේදන සහ පුවත්පත් ලිපි මාලාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

රක්ෂණ සහතික දරන්නන්ගේ දුක්ගැනවිලි වලට අදාල කරුණු නිරාකරණය කිරීම පිණිස මණ්ඩලයට ව්‍යවස්ථාපිත බලය ලබා දී ඇත. නිවැරදි මං පෙතක් කරා යන අපේ දිගු ගමනේදී මණ්ඩලය විසින් මෙම ක්ෂේත්‍රය පිළිබඳව විශේෂයෙන් අවධාරණය යොමුකරන ලදී.

රටේ පවතින ආර්ථික වර්ධනයත් සමග රක්ෂණ ක්ෂේත්‍රයට අභියෝග මෙන්ම වාසි සහගත අවස්ථාද උදාකරනු ලබයි. මෙම අභියෝගවලට මුහුණදීමට නව්‍යකරණයෙන් යුත් රක්ෂණයන් හඳුන්වාදීමට රක්ෂණ කර්මාන්තය පෙළඹිය යුතුය. තවද, වැඩිවෙමින් පවතින ජනගහනයේ අවශ්‍යතාවයන් ඉටුකරලීමට විශේෂයෙන්ම ජීවිත සහ සෞඛ්‍ය රක්ෂණයන් වර්ධනය කිරීම මෙන්ම ඒවා නව ක්‍රමෝපායන් මගින් දියුණුකිරීම කෙරෙහිද කර්මාන්තයේ අවධානය යොමුවිය යුතුය.

මහජන විශ්වාසයේ සහ රක්ෂණය සම්බන්ධ සමස්ත මහජන දැනුවත්භාවයේ වැදගත්කම පිළිබඳව මණ්ඩලය විසින් ගැඹුරින් සලකා බලා තිබේ. අපි මේ සම්බන්ධයෙන් කර්මාන්තය පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වන්නන්ගේ සහයෝගය ද අපේක්ෂා කරන්නෙමු.

ගෝලීය ආර්ථික අර්බුදයන් හරහා උගත් පාඩම් ඇසුරින්, නියාමකයන් ලෙස අප නව නීතිරීති ගෙන එන්නේ රක්ෂණ නිෂ්පාදනයන්හි සෑම අංගයකින්ම පරිපූර්ණ බව සහතික කරමින්, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස අවදානම් පාලනය කිරීමේ අරමුණ පෙරදැරි කොට ගෙනය.

මෙම සියළු කාර්යයන් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර මහතාට සහ අමාත්‍යාංශයේ අදාල නිලධාරීන්ට මාගේ කෘතවේදීත්වය පළ කර සිටින්නෙමි. තවද පාලක මණ්ඩලයේ සාමාජිකයින් විසින් ලබාදෙන ලද මහඟු දායකත්වයටද මාගේ කෘතඥතාවය පළකර සිටිමි. අවසන් වශයෙන් මාගේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරුන් සහ අනිකුත් කාර්ය මණ්ඩලයේද කැපවීම සහ දායකත්වය මහත්සේ අගයන්නෙමි.



**ඉන්ද්‍රාණි සුගතදාස**
*සභාපතිනි*

2012 අගෝස්තු 30

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය



"2011 වසරේදී වන කැපී පෙනෙන සංවර්ධනය, කර්මාන්තයට අවස්ථා මෙන්ම අභියෝගයන්ද සලසා දෙන ලදී. මෙම අභියෝගයන්ට මුහුණදීමට දක්ෂ, ක්‍රියාශීලී, අභිප්‍රේරිත සේවා නියුක්තිකයන් පිරිසක් ජයග්‍රාහී පසුබිමක නියැලෙමින් අපේ කාර්යභාරය අඛණ්ඩව ඉටුකරලීම සඳහා අවධානය යොමු කර සිටින්නෙමු. කර්මාන්තය හා සම්බන්ධතා දක්වන්නන් සමග සමීපව කටයුතු කිරීමෙන්, ව්‍යාපාරිකයින්ට මෙන්ම පාරිභෝගිකයින්ට ද ආරක්ෂිත හැඟීමෙන් යුතුව වර්ධනයවීම පිණිස සාධාරණ සහ සුරක්ෂිත කර්මාන්තයක් සඳහා අවස්ථාව සලසා දීමට අප උත්සාහ දරන්නෙමු."

මෙම වසර, රටට, රක්ෂණ කර්මාන්තයට මෙන්ම මණ්ඩලයටද අතිශය සුවිශේෂී වසරකි. ප්‍රගතිශීලී වසරක, දශකයක පරිසමාප්තිය සනිටුහන් කරමින්, රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් ඉහල වගකිව යුතු බවක් සහ ස්ථාවරත්වයක් කරා ගමන් කළ හැකි නියාමන සහ අධීක්ෂණ රාමුවක් නිර්මාණය කිරීමේ පදනමකට අප ලඟා වී ඇත. සමාලෝචිත වසර තුළදී ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ විචක්ෂණ නියාමකයෙක් ලෙස කර්මාන්තයට අනුශාසනය සහ මග පෙන්වීම කාර්ය මණ්ඩලය විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

## නියාමනය සහ අධීක්ෂණය

අවදානම් පාදක අධීක්ෂණය ශක්තිමත් කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් සමාලෝචිත වසර තුල වැදගත් සන්ධිස්ථාන දෙකක් කරා ළඟා වී ඇත. 2009 වසරේදී ආරම්භ කරන ලද අවදානම් පාදක ප්‍රාග්ධන ව්‍යාපෘතියෙහි II සහ III අවධීන් සම්පූර්ණ කිරීම ව්‍යාපෘති උපදේශකයන් හා සමීපව කටයුතු කිරීමෙන් සිදුකරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ කර්මාන්තයට ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වාර්තා නිකුත් කිරීම සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය හරහා මණ්ඩලය බලාපොරොත්තු වන්නේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයක් පවත්වා ගැනීම සඳහා අවදානම් පාදක රාමුවක් සපයමින් ඵලදායී ලෙස තම ව්‍යාපාර අවදානම් පාලනය කර ගැනීමට වෙළඳපොළ සහභාගි ක්‍රියාකරුවන්ට හැකියාව ලබා දීමයි.

වාර්ෂික ව්‍යවස්ථාපිත වාර්තා, විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ආයුගණන වාර්තා නිසි කලට ඉදිරිපත් කිරීම පිළිබඳව අප විසින් අධීක්ෂණය කරනු ලබන අතර, රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන්ව ක්ෂේත්‍රගත සහ මණ්ඩලයට ඉදිරිපත් කරන වාර්තා පිළිබඳ සමාලෝචන පරීක්ෂාවට ලක්කර ඒ හරහා පනතෙහි විධිවිධාන වලට ඔවුන්ගේ අනුකූලතාවය පරීක්ෂා කිරීම සහ අවදානම් කළමණාකාර ක්‍රියාවලිය ඇගයීම පිණිස ඔවුනගේ මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ කාර්ය පරිපාටි සමාලෝචනයට ලක්කිරීම සිදු කරයි.

රක්ෂණ කර්මාන්තයේ විචල්‍ය අවශ්‍යතා සහ සමකාලින නියාමන ප්‍රවණතා වලට මුහුණ දෙමින් මණ්ඩලය විසින් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම, නුබුන්වත් ආන්තිකය පිළිබඳ අනුකූලතාව අධීක්ෂණය සංශෝධනය කිරීම, සහ රක්ෂකයින් විසින් ගෙවනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ වාර්ෂික ගාස්තු ඉහළ නැංවීම සිදු කරන ලදී. හඳුන්වා දෙන ලද කැපී පෙනෙන වෙනස්කම් කේන්ද්‍ර කොට, සංයුක්ත රක්ෂකයින් වෙන්කිරීම 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකින් ලැයිස්තුගත කරනු ලැබීම, ආයතනික රක්ෂණ නියෝජිතයින් හඳුනාගැනීම මගින් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ දර්ශන පථය නිර්මාණය කිරීම සිදු කරනු ඇත.

දිර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වාගන යාම පිණිස සමාලෝචිත වසර තුළදී පිළිවෙලින් ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සහ ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙතට මණ්ඩලය වෙතින් ලියාපදිංචිය ප්‍රදානය කිරීම සිදුකරන ලදී. ඒ අනුව ලියාපදිංචි රක්ෂකයින් සංඛ්‍යාව විස්සේ (20) සිට විසිදෙක (22) දක්වා ඉහල ගොස් ඇත. කෙසේ වුවද, 2009 සිට අඛණ්ඩව පැවති සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් ලියාපදිංචිය අත්හිටුවා තිබීම හේතුවෙන් සමාගම් විසි එකක් (21) ක් පමණක් ක්‍රියාත්මක වෙමින් පවතී.

2011 වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචිය අපේක්ෂා කරනු ලබන සමාගම් එකොළහකින් (11) අපට අයදුම්පත් ලැබී ඇත. මණ්ඩලය විසින් සමාගම් පහක් (5) ක් සඳහා ලියාපදිංචිය ප්‍රදානය කර ඇති අතර, ඒ අතරින් දෙකක් (2) දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යපාර යන දෙකම සිදු කරගන යාම සඳහා ද, ඉතිරි සමාගම් තුන (3) සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යපාර සිදු කරගන යාම සඳහා ද ලියාපදිංචි විය.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 98 වන වගන්තිය අනුව රක්ෂණ ඉල්ලීමක් නිරාකරණය කිරීමේදී පැන නගින වියවුලක් සම්බන්ධයෙන්, හිමිකම ඉල්ලුම් කරන්නාගේ මනාපය මත, මණ්ඩලයෙහි තීරණය සඳහා යොමු කරන අතර, පාර්ශවයන්ට සවන් දීමෙන් අනතුරුව සුදුසු යැයි හැඟෙන වැඩිදුර පරීක්ෂණ පවත්වා වියවුලට අදාලව එහි නියෝගය ප්‍රකාශයට පත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ විමර්ශන කාර්යයන් 2009 වර්ෂයේදී ස්ථාපනය කරන ලද අතර, 2010 වසරේදී වෙනම අංශයක් ලෙස ක්‍රියාත්මක විය. මෙම කෙටි කාල පරිච්ඡේදය තුළ රක්ෂණ ඉල්ලීම් වලට අදාලව වියවුල් බේරුම් කිරීමේලා මහජන විශ්වාසය දිනාගෙන ඇති අතර, ලැබී ඇති සහ විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව ඒ බවට සාක්ෂි දරයි.

සමාලෝචිත වසර තුළ එවැනි ගැටළු දෙසිය අසූවකට (280) වැඩි සංඛ්‍යාවකට සාර්ථක ලෙස විමසුමට ලක් කරනු ලැබූ අතර, ඒ අතුරින් ගැටළු දෙසිය හතලිහක් (240) ක් නිරාකරණය කරන ලදී. රක්ෂණ ඔප්පු මගින් උත්පාදිත මුදල් අයකර ගැනීමට අදාල දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අමතරව, නියෝජිතයින්ගේ සුදුසුකම්වලට අදාල පැමිණිලි සහ නියෝජිතයින් විසින් අරමුදල් අයුතු ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් අපගේ විෂය පථය පුළුල් කර තිබේ.

## මහජන දැනුවත් භාවය

සමාලෝචිත වසර තුලදී ජාතික/ අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා අපගේ සහභාගිත්වය මගින් රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය, නියාමනය සහ සංවර්ධනය කිරීමෙහිලා මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය මහජනතාවට අවබෝධ කරවීමට අපට හැකි විය.

දැනට රක්ෂණය සම්බන්ධයෙන් පවතින පාඨමාලා පිළිබඳව සිසුන් දැනුවත් කිරීමටද අපි මෙය අවස්ථාවක් කර ගත්තෙමු.

පුවත්පත් ලිපි, ප්‍රවෘත්ති සම්මුඛ සාකච්ඡා සහ විස්තරාත්මක පුවත්පත් දැන්වීම් වලට අමතරව, "රක්ෂණ ආවරණයක් ලබා ගන්නේ කෙසේ ද" සහ "යෝජනා ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්නේ කෙසේ ද" යන්න පිළිබඳ අප විසින් අත් පත්‍රිකා සහ විස්තර පත්‍රිකා ප්‍රකාශනයට පත් කර ඇත.

## මානව සම්පත

2011 වසර අවසන් වනවිට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ කාර්‍ය මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව තිස් හතක් (37) දක්වා ඉහළ ගොස් ඇත. මෙකී කාල පරිච්ඡේදය තුළදීම රක්ෂකයින් සංඛ්‍යාව දහයේ (10) සිට විසි දෙක (22) දක්වා ද, රක්ෂණ තැරැව්කරුවන් සංඛ්‍යාව තිස් හයේ (36) සිට හතලිස් හය (46) දක්වා ද වැඩි වී තිබේ. සමාලෝචිත වසර තුල පුහුණු වැඩසටහන් විසි පහක් සඳහා සහභාගිවීමට කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට අවස්ථාව හිමි කර දුනි.

## ඉදිරි දැක්ම

ගෝලීය මන්දගාමී බව නොසලකා 2010 වසරට සාපේක්ෂව දළ ලිඛිත වාරිකයට දීර්ඝ කාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණ දායකත්වය පිළිවෙලින් රුපියල් මිලියන 35,181 ක් සහ 43,331 ක් ලෙස දළ ලිඛිත වාරිකය 18.5% කින් ඉහල යමින් රට තුළ රක්ෂණ අංශය සුවිශේෂී වර්ධනයක් පෙන්වා ඇත.

2011 වසරේදී වන කැපී පෙනෙන සංවර්ධනය, කර්මාන්තයට අවස්ථා මෙන්ම අභියෝගයන්ද සලසා දෙන ලදී. මෙම අභියෝගයන්ට මුහුණදීමට දක්ෂ, ක්‍රියාශීලී, අභිප්‍රේරිත සේවා නියුක්තිකයන් පිරිසක් ජයග්‍රාහී පසුබිමක නියැලෙමින් අපේ කාර්යභාරය අඛණ්ඩව ඉටුකරලීම සඳහා අවධානය යොමු කර සිටින්නෙමු. කර්මාන්තය හා සම්බන්ධතා දක්වන්නන් සමග සමීපව කටයුතු කිරීමෙන්, ව්‍යාපාරිකයින්ට මෙන්ම පාරිභෝගිකයින්ට ද ආරක්ෂිත හැඟීමෙන් යුතුව වර්ධනයවීම පිණිස සාධාරණ සහ සුරක්ෂිත කර්මාන්තයක් සඳහා අවස්ථාව සලසා දීමට අප උත්සාහ දරන්නෙමු.

2012 වසර සඳහා ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඇති අතර, ඒ අතරින් ප්‍රධාන කාර්‍යයන් තුන (3) නම් අවදානම් පාදක අධීක්ෂණය ඉහල නංවනු ලබන ආදායම් පාදක ප්‍රාග්ධන ආදර්ශය සඳහා මාර්ග පරීක්ෂාව ආරම්භ කිරීම, රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීමේ අරමුණින් නියාමන රාමුව වැඩිදුරට ශක්තිමත් කිරීම සහ ග්‍රාමීය ප්‍රජාව සමග ගැටෙන කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වේ.

ඵලදායී අධීක්ෂණ පද්ධතියක් තුලින් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ මූල්‍යමය ස්ථාවරත්වය අධීක්ෂණය, රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය සඳහා සවිමත් නියාමන රාමුවක් සැකසීම, නවෝත්පාදන දිරිමත් කරමින් කර්මාන්තයේ සංවර්ධනය පහසුකිරීම, මූල්‍යමය සාක්ෂරතාවය ඉහල නැංවීම හරහා රක්ෂණ සහතික දරන්නන්ගේ/ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ විශ්වාසය වර්ධනය කිරීම යන කරුණු කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කරමින්, මධ්‍යම සිට දීර්ඝ කාලීන දක්වා අප රක්ෂණ කර්මාන්තයේ චිරස්ථායී බව කෙරෙහි අවධානය යොමු කරන්නෙමු.

## නිගමනය

නිවැරදි විධානයන් තුලින් ගනු ලැබූ පියවරයන්හි ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශකයේදී වැදගත් සන්ධිස්ථාන කිහිපයක් කරා ළඟා වීමට අපට හැකිවූ අතර, අපගේ දසවන සංවත්සරයේදී මෙම තීරණාත්මක සැතපුම් කණුවට ලඟා වනවිට ඒවා මුදුන්පත් කරගත යුතු බව විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. විශිෂ්ඨ ලෙස මෙකී කාර්යයන් ක්‍රියාත්මක කිරීමේලා සැබවින්ම උපකාරී වූ, මණ්ඩලයේ සාමාජිකයන් විසින් ලබාදුන් නොමසුරු සහය සහ මගපෙන්වීම පිළිබඳව එම සාමාජිකයන්ට මාගේ කෘතඥතාවය පළ කර සිටින්නෙමි. තවද, 2011 වසරේදී අපගේ අභියෝගාත්මක ඉලක්කයන් කරා ලගාවීම උදෙසා ඉවහල් වූ සභාපතිතුමියගේ තීක්ෂණ බුද්ධියෙන් යුත් නායකත්වය වෙනුවෙන් එතුමියට ද, ඒ සඳහා ඇප කැප වී කටයුතු කළ මාගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමට සහ කාර්ය මණ්ඩලයට ද, මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.



**චන්ද්‍රි ගුණවර්ධන**
*අධ්‍යක්ෂ ජනරාල්*

2012 අගෝස්තු 30

# මණ්ඩලයේ සාමාජිකයන්



1

ඉන්දාණි සුගතදාස මහත්මිය
සභාපතිනිය



2

එස්. ආර්. ආටිගල මහතා
සාමාජික



3

බී. ඩී. ඩබ්ලිව්. ආනන්ද සිල්වා මහතා
සාමාජික



4

ඩී. කේ. හෙට්ටිආරච්චි මහතා
සාමාජික



5

ශ්‍රේෂන් ගුණවර්ධන මහතා
සාමාජික



6

ගාමිණී කොහොන මහතා
සාමාජික



7

මොහමඩ් නවාස් රාජබ්ඩීන් මහතා
සාමාජික

# මණ්ඩල සාමාජිකයන් පිළිබඳව

**(1) ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය**

2010 වසරේ පටන් මණ්ඩලයෙහි සභාපති ධූරය උසුලමින් සිටින්නිය. කොළඹ මියුසියස් විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලද සුගතදාස මහත්මිය, කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබා, අනතුරුව ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය හිමිකරගෙන ඇත. එමෙන්ම ඇය 1990 වසරේ එක්සත් ජනපද රජයෙන් හියුබට් එච්. හම්ප්‍රි අධිශිෂ්‍යත්වයක් ලැබ, එම වර්ෂය තුල නිව්යෝර්ක් නුවර සරසවියේ හන්ටර් විද්‍යාලයට අනුබද්ධිතව අධ්‍යාපනය ලබා ඇත.

මීට අමතරව සුගතදාස මහත්මිය පරිගණක විද්‍යාව, පිරිස් කළමනාකරණය සහ රාජ්‍ය සේවා කළමනාකරණය පිළිබඳව වෘත්තීය පුහුණුවද ලබා සිටින්නීය.

1977 දී ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයට ඇතුලත්ව සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක් ලෙස තම වෘත්තීය දිවිය ඇරඹි ඇය, පරිපාලන ධූරාවලියේ මුදුන් පෙත්තටම ළඟා විය.

රාජ්‍ය අංශයේ ප්‍රධාන ප්‍රවාහයට සම්බන්ධව කටයුතු කරන අතරතුර සුගතදාස මහත්මිය ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂිකා ධූරය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂිකා ධූරය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපති ධූරය සහ ළමා සංවර්ධන සහ කාන්තා බලගැන්වීම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් යන ධූරයන් හෙබවීය.

දශක තුනකට අධික කාලයක් පුරාවට රාජ්‍ය සේවයට සම්බන්ධව කටයුතු කිරීමෙන් පසුව, ඇය 2010 වසරේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ධූරයෙන් විශ්‍රාම ගත්තාය.

විශ්‍රාම ගැනීමෙන් අනතුරුව ඇය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි මෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙහි ද සභාපතිනිය ලෙස තෝරාපත් කර ගන්නා ලදී. 2011 වර්ෂය දක්වා ඇය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි සේවය කළාය.

දේශීය මෙන්ම විදේශීය රටවලද සුගතදාස මහත්මිය සහභාගී වූ සම්මන්ත්‍රණ සහ සම්මේලන වලට අමතරව, ඇය විදේශීය ශ්‍රී ලාංකීය දූත මණ්ඩල සහ ජාත්‍යන්තර සංසදයන් කිහිපයකම සාමාජිකාවක් ද විය.

**(2) එස්. ආර්. ආටිගල මහතා**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෙක් වන එස්. ආර්. ආටිගල මහතා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් සහ වැඩබලන සභාපතිවරයෙක් වශයෙන් ද, ෂෙල් ගෑස් ලංකා සමාගමේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන් ද, සේවය කර ඇත. 2011 වසර අවසානය දක්වාම ඔහු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද කටයුතු කර තිබේ.

ඔහු දැනට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙක් වශයෙන් සේවය කරයි. තවද ඔහු ලංකා බැංකුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යන ආයතනවල මණ්ඩල අධ්‍යක්ෂවරයෙක් ලෙසද සේවය කරමින් සිටී. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිරීක්ෂකවරයෙක් ලෙසින් ද, කටයුතු කරමින් සිටී. ආටිගල මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලැබ, එක්සත් ජනපදයේ වර්වික් සරසවියෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා සිටී.

**(3) බී. ඩී. ඩබ්. ආනන්ද සිල්වා මහතා**

වසර 28 ක කාලයක් තුල මහ බැංකුවේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවල සේවය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 28 ක තම සේවා කාලය තුල ඔහු මූල්‍ය ප්‍රතිපත්ති, බැංකු අධීක්ෂණය, මූල්‍ය පද්ධති ස්ථායිතාව, විනිමය අනුපාත ප්‍රතිපත්තිය, විදේශ වෙළදාම සහ ගෙවුම් ශේෂය යන ක්ෂේත්‍ර කෙරෙහි පුළුල් අත්දැකීම් ලබාගෙන තිබේ. යාපනය විශ්ව විද්‍යාලයෙන් පළමු පෙළ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති ඔහු, ඇමරිකා එක්සත් ජනපදයේ IOWA විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද, ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් ද ලබා සිටියි. කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කරමින් සිටින අතරම ඔහු මහ බැංකුව විසින් පවත්වනු ලබන උසස් පාඨමාලා කිහිපයක සම්පත් දායකයෙක් ලෙසද ක්‍රියාකරමින් සිටියි.

සිල්වා මහතා දැනට ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපති, ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ සභාපති, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සමාජික, "අපි වෙනුවෙන් අපි" අරමුදලේ අධ්‍යක්ෂ, තත්ත්ව සහතික මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ ආයතනයේ අධ්‍යක්ෂ සහ වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ යන ධූරයන් හොබවමින් සිටියි.

**(4) ඩී. කේ. හෙට්ටිආරච්චි මහතා**

වෘත්තියෙන් නීතිඥවරයෙකි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය ලබා ඇත. 1986 වසරේදී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙක් ලෙස සේවයට බැඳුනු ඔහු, 1987 වසරේදී සමාගම් රෙජිස්ට්‍රාර් ධූරයට උසස් කරන ලදී. නව සමාගම් පනත යටතේ ඔහු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ලෙස පත් කර තිබේ. ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරන සහ විගණන ප්‍රමිතීන් අධීක්ෂණ මණ්ඩලයේ නිලබලයෙන් පත්වූ සාමාජිකයෙක් ලෙස කටයුතු කරමින් සිටී.

**(5) ශ්‍රේෂන් ගුණවර්ධන මහතා**
මණ්ඩලයට පත්වූයේ 2010 මැයි මාසයේ දී ය. ඔහු මීට පෙර අපනයනකරුවන්ගේ සංගමයේ හා ශ්‍රී ලංකා තායිවාන මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇත. එමෙන්ම ඇමෙරිකානු වාණිජ මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂවරයෙකි. ඒ මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂකවරයෙක් ද විය.

වර්තමානයේ දී ගුණවර්ධන මහතා සංවිධාන හා පෞද්ගලික සමාගම් කිහිපයක සභාපතිවරයා වෙයි. 1999/2000 වර්ෂයේ හොඳම ව්‍යවසායකයා වශයෙන් සම්මාන ලැබූ හෙතෙම වසර කීපයකදී ම මහා පරිමාණ කාණ්ඩයේ හොඳම අපනයනකරු වශයෙන් ද රන් පදක්කම් ලැබීය.

වර්ෂ 2006 බොස්ටන් ඇකඩමි සම්මාන උළෙලේ දී ලෝකයේ හොඳම ගවනර් (බෙස්ට් ගවනර් ඉන් ද වර්ල්ඩ්) සම්මානය දිනා ගත්තේ ද ඒ මහතා ය.

තර්ස්ටන් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද ගුණවර්ධන මහතා ගුවන්යානා ඉංජිනේරු තාක්ෂණ නිලධාරියකු වශයෙන් රාජකීය ලංකා ගුවන් හමුදාවට බැඳුණි. ඉන්පසු පොලිස් දෙපාර්තමේන්තුවේ අවුරුදු 12 ක් සේවය කළේ ය. ලොව ප්‍රධාන පෙළේ කාර්මික අත්වැසුම් නිෂ්පාදකයකු හා අපනයනකරුවකු වන හැන්ඩ්ස් ඉන්ටර්නේෂන් සමාගමේ ආරම්භක සභාපතිවරයා වූයේ ද ඔහු ය.

**(6) ගාමිණී කොහොන මහතා** 2010 ජුලි මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් විය. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද කොහොන මහතා වතු ක්ෂේත්‍රයේ තිස් වසකට අධික අත්දැකීම් ලද කෘතහස්ත පාලකයෙකි. තේ, රබර්, පොල් හා පාම් වතු පාලනයෙහි යෙදුණු ඒ මහතා සෙන්ට්‍රල් හිල්ස් වැවිලි සමාගමේ හිටපු ප්‍රධාන විධායකයා ය. දැනට හෙතෙම පුලතිසි එක්සපොර්ට්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ය.

**(7) මොහොමඩ් නවාස් රාජබ්ඩීන් මහතා**
අධ්‍යක්ෂක මණ්ඩලයට පත්වූයේ 2010 ජූලි මාසයේදී ය. අලෙවිකරණ හා ගනුදෙනුකාර සබඳතා අංශයෙන් හෙතෙම විශේෂඥතාවක් පෙන්වයි.

හොටෙල් ඩිවෙලොපර්ස් සමාග මේ සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සංගමයේ සභාපති, සාර්ක් වාණිජ මණ්ඩලයේ උප සභාපති, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ සභාපති, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානයේ ජාතික අධ්‍යක්ෂ සහ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ලෝක සම්මේලනයේ උපසභාපති යන තනතුරු ඒ මහතා විසින් දරනු ලැබීය.

රාජබ්ඩීන් මහතා දැනට ශ්‍රී ලංකාවේ සාර්ක් උත්තරීතර ආයතන සම්මේලනයේ උප සභාපති වශයෙන් කටයුතු කරයි. එමෙන්ම රාජාබ්ඩීන් සමාගම් සමූහයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂක වශයෙන් 1984 සිට කටයුතු කරන්නේ ද ඒ මහතා ය.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**චන්ද්‍ර ගුණවර්ධන**
*(අධ්‍යක්ෂ ජනරාල්)*



**දමයන්ති ප්‍රනාන්දු**
*(අධ්‍යක්ෂ නීති)*



**තමරි සේනානායක**
*(අධ්‍යක්ෂ විමර්ශන)*



**පයස් ප්‍රනාන්දු**
*(අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)*



**නිහාල් රාමනායක**
*(අධ්‍යක්ෂ අධීක්ෂණ)*



**චමරි ඒකනායක**
*(සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)*



**රාජන් නිරූබසිංහම්**
*(සහකාර අධ්‍යක්ෂ නීති)*

# කාර්ය මණ්ඩලය



අසුන්ගෙන (වමේ සිට දකුණට) : ඩී. ඩබ්ලිව්. සුපුලී සාරංගා, ශ්‍යාමලී අත්තනායක, රුවිනි ලියනගේ, බිම්සර විජේසිංහ, සාරිකා වත්තුහේවා, ඩෙසිකා රත්නායක, හර්ෂණ වන්නිආරච්චි

සිටගෙන (වමේ සිට දකුණට) : ලක්ෂ්මන් විජේසිංහ, තනූජා ඇන්තනී, චරිත වික්‍රමසිංහ, වීණා දිනේකා, මෙරීනා ඩයස්, එච්. පී. අසංක, උපේන්ද්‍රා සෙනෙවිරත්න

# කාර්ය මණ්ඩලය



අසුන්ගෙන (වමේ සිට දකුණට) : චමින්ද ලාල් කුමාර, ප්‍රියංගි ද සිල්වා, නයනා අමරසිංහ, ඊ. ශ්‍රීකාන්තන්, තුෂාරි විජේගුණවර්ධන, කෝකිලා සිරිවර්ධන

සිටගෙන (වමේ සිට දකුණට) : ලසන්ති තොටහේවා, ජී. එච්. ඉරෝෂන්, කපිල තිලකරත්න, චමේලිකා පීටර්, සුජීවා රණසිංහ, කෞෂලී දයාරත්න, සමන් සේනාධීර, ලක්මාල් කලුබෝවිල, චන්දිමා කඹුරුගමුව



# සමාලෝචනයන්

පොදු සමාලෝචනය 16
සංඛ්‍යානමය සමාලෝචනය 22
මෙහෙයුම් කටයුතු සමාලෝචනය 40



# පොදු සමාලෝචනය

## රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම

### නීති සම්පාදනය

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය නියාමනය හා අධීක්ෂණය කරනු ලබන්නේ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ 2000 අංක 43 දරණ පනතේ (මෙතැන් පටන් පනත යනුවෙන් භාවිතා කෙරෙන) විධි විධානවලට අනුකූලවය. පනත සම්මත කිරීමට පෙර රක්ෂණ කර්මාන්තය නියාමනය කරනු ලැබුවේ 1962 අංක 25 දරණ රක්ෂණ පාලන පනත මගින් පැවරුනු බලතල වලට අනුකූලව රක්‍ෂණ පාලක තැන විසිනි. පනත හඳුන්වාදීමෙන් පසු එකී පනත අකර්මන්‍ය විය.

රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවන ආකාරයෙන් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන් ද වෘත්තීමය හා විචක්‍ෂණ භාවයෙන්ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික වනු පිණිසත්, රක්ෂණ කර්මාන්තයේ නියාමනය, සුපරීක්ෂණය හා සංවර්ධනය අරමුණුකොට එකී පනත මගින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (මෙතැන පටන් "මණ්ඩලය" යනුවෙන් භාවිතා වන) ස්ථාපනය කරනු ලැබුවේය.

රක්ෂණ කර්මාන්තය වඩාත් ශක්තිමත් කිරීම පිණිස ප්‍රධාන පනතටත් ඊට ආදාල උපනිතිවලටත් සංශෝධන කීපයක් වරින්වර හඳුන්වාදෙන ලද අතර මෙම වාර්තාවේ නියාමන සමාලෝචනයෙහි ඒවා පිළිබඳව සවිස්තරාත්මකව කරුණු දැක්වේ.

## වෙළඳ පොල ව්‍යුහය


### රක්ෂණ සමාගම්

පනතේ 13 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාව තුල රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන සමාගමක් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර නියමිත අනෙකුත් ව්‍යස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ රක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි විය යුතුය.

වසර අවසාන වන විට මණ්ඩලය යටතේ සමාගම් 22ක් ලියාපදිංචි වී තිබුණි. මෙයින් 21ක් ක්‍රියාකාරීව පවතින අතර සෙලින්කෝ තකාෆුල් සමාගමේ ලියාපදිංචිය 2009 වසරේ සිට අත්හිටුවා ඇත. වසර තුලදී නව රක්ෂණ සමාගම් දෙකක් ලියාපදිංචි වී ඇත. සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලියාපදිංචිය ලැබූ ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2011 දෙසැම්බරයේදී එහි ව්‍යාපාර කටයුතු ආරම්භ කළේය. ජීවිත රක්‍ෂණ ව්‍යාපාර කටයුතු සඳහා ලියාපදිංචිය ලැබූ ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සිය මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ 2012 ජනවාරි මාසයේය. පහත දැක්වෙන්නේ එම රක්‍ෂණ සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන්ය. සමාගම් 22න් 12ක් දිගුකාලීන හා සාමාන්‍ය යන දෙආකාරයේම රක්‍ෂණ කටයුතු කරන සංයුක්ත සමාගම් වශයෙන් ලියාපදිංචි වී ඇති අතර දීර්ඝ කාලින රක්‍ෂණ ව්‍යාපාර සඳහා සමාගම් 3 ක් ද සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර කටයුතු සඳහා සමාගම් 7 ක්ද ලියාපදිංචි වී ඇත.

*රූප සටහන 1*

**රක්‍ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්**





### රක්‍ෂණ තැරව්කරුවෝ

පනතේ 80 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාව තුල රක්‍ෂණ තැරව්කාර ව්‍යාපාරයෙහි නිරතවීමට උනන්දුවන සමාගම් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සමාගමක් වශයෙන් ලියාපදිංචි විය යුතු අතර අනෙකුත් ව්‍යවස්ථාමය අවශ්‍යතා සපුරාලීමෙන් පසු පනත යටතේ රක්‍ෂණ තැරව්කරුවකු වශයෙන් ලියාපදිංචිය ලබාගත යුතුය. 2011 වසර අවසානයේදී රක්ෂණ තැරව්කාර ව්‍යාපාරයෙහි නියුතු සමාගම් 46 ක් තිබුණි. එකී සමාගම් අතුරින් සමාගම් 35ක් දිගුකාලින සහ සාමාන්‍ය රක්‍ෂණ තැරව්කාර ව්‍යාපාර යන දෙකෙහිම යෙදී සිටි අතර 11ක් සාමාන්‍ය තැරව්කාර ව්‍යාපාර කටයුතු වල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූපසටහනේ දැක්වෙන්නේ රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන්ය.

*රූප සටහන 2*

**රක්ෂණ තැරව්කරුවන් විසින් කෙරෙන රක්ෂණ තැරව්කාර ව්‍යාපාර පන්තීන්**




### රක්ෂණ නියෝජිතයෝ

මූලික පනතට අනුව රක්‍ෂණ සමාගම් හා රක්ෂණ තැරව්කාර සමාගම්වල නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට අවසර ලබන්නේ තනි පුද්ගලයින් පමණි. 2011 අංක 3 දරණ පනත (මෙහි මින්මතු සංශෝධිත පනත යනුවෙන් හඳුන්වනු ලබයි) මගින් පනතට කරන ලද සංශෝධන හේතුවෙන් තනි පුද්ගලයින් නොවන ආයතන වලටද රක්ෂණ නියෝජිතයින් ලෙස ක්‍රියා කරන්නට අවසර ලැබේ.

පනතේ 34 වන වගන්තියට අනුව රක්‍ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම් වලටත් රක්‍ෂණ තැරව්කාර සමාගම්වලටත් ව්‍යාපාර සොයා දෙන ප්‍රධාන ප්‍රවාහයන්ගෙන් එකක් සේ සැලකේ.


රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව වසර තුලදී රක්ෂණ නියෝජිතයන් වශයෙන් පුද්ගලයින් 11,112 ක් පමණ බඳවාගෙන ඇති අතර එම සමාගම් විසින් අපලේඛණ ගතකොට ඇති සංඛ්‍යාව 144 කි.

2011 දෙසැම්බර් 31 වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු නියෝජිත සංඛ්‍යාව 32,651 ක් පමණ විය.

පහත 3 වන රූපසටහනේ දැක්වෙන්නේ රක්ෂණ සමාගම් සමග ලියාපදිංචි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව වේ.

*රූප සටහන 3*

**රක්ෂණ සමාගම් හි ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්**




## සමාගම්වල තත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

### රක්‍ෂණ සමාගම්

එක් රක්‍ෂණ ව්‍යාපාර පන්තියක් සඳහා ලියාපදිංචිවීමේදි රක්‍ෂණ සමාගමකින් අපේක්‍ෂිත අවම ප්‍රාග්ධනය රු මිලියන 100 සිට 500 දක්වා ඉහල නංවන ලදි.

### අවදානම් පාදක ප්‍රාග්ධනය (RBC)

රක්‍ෂණ සමාගම් සඳහා වන අවදානම් පාදක ප්‍රාග්ධනයක් හඳුන්වාදීම මණ්ඩලය විසින් පනත යටතේ සිදුකරමින් පවතී.

අවදානම් පාදක ප්‍රාග්ධනය සාර්ථක අන්දමින් ක්‍රියාවට නැංවීමෙන් පහත දැක්වෙන වාසි රක්‍ෂණ කර්මාන්තයට ලැබෙනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

- අවදානම් පාදක ප්‍රාග්ධනය අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා සමතුලිත ප්‍රවේශයක් ලබාදෙන අතර අවදානම ක්‍රියාකාරී ලෙසම පාලනය වන බවට මණ්ඩලයටත්, බාහිර අයෝජකයන්ටත් (හවුල්කරුවන්ටත්) පහසුවක් හා ආරක්ෂාකාරී හැඟීමක් ලබාදේ.
- නිෂ්පාදනවල ලාභය වැඩිදියුණු කිරීම: අවදානම් පාදක ප්‍රාග්ධය තුළින් වඩා අවදානම් සහිත හා ප්‍රාග්ධන සූක්ෂම නිමැවුම් කෙරෙහි අවධානයක් යොමු කෙරේ. මෙමඟින් කාර්යභාරය ප්‍රශස්තිකරණය, ඉතා තියුණු මිලකරණය සඳහා අවස්ථා සැලසීම සිදුකළ හැකිය. එමඟින් සමාගම් අතර වැඩි නිමැවුම් ලාභදායීත්වයක් සඳහා අවස්ථා සැලසීම ද සිදුකළ හැකිය.
- වෙළඳපොළ දක්ම තියුණු කරයි: එමඟින් අවදානම් කළමනාකරණ කාර්යය සඳහා කීර්තිනාමය යොදාගනී.
- වියදම් අඩුකිරීම: හොඳ අවදානම් කළමනාකරණයක් කිරීම තුළින් මෙහෙයුම් කාර්ක්ෂමතාවය වැඩිවේ.
- උචිතම ක්‍රියා පිළිවෙල: අවදානම් හා ප්‍රාග්ධන කළමනාකරණය, විශේෂයෙන්ම සමස්ත අවදානම පිළිබඳ සලකා බැලීමේ ප්‍රවේශයක් ඇතිකිරීම.

එසේම රක්ෂකයාගේ මූල්‍ය ශක්තිය සහ වන්දි ගෙවීමේ හැකියාව පිළිබඳව දර්ශකයක් ලබාගතයුතු බවට මණ්ඩලය සියළු රක්ෂක සමාගම් වලින් ඉල්ලීමක් කොට ඇත. ඒ අනුව පහත 1 වන වගුවෙන් රක්ෂකයින් ලබාගෙන ඇති තත්ත්ව දර්ශක පෙන්නුම් කෙරේ.

*වගුව 1*

**රක්ෂකයින් විසින් ලබා ඇති තත්ත්ව දර්ශකය**


| රක්ෂකයාගේ නම | තත්ත්ව දර්ශකය | දර්ශක සැකසු නියෝජිත ආයතනය | දර්ශක සඳහා පදනම්කරගත් නිර්ණායක | දර්ශක තත්ත්ව ගතකල දිනය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | AA (lka) | ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | - දිගුකාලීන ජාතික තත්ව දර්ශකය<br>- නිගමනය : ස්ථාවරයි | 2011 ජුනි |
| | AA (lka) | ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | - රක්‍ෂකයාගේ මූල්‍ය ශක්ති තත්‍ව දර්ශකය | 2011 ජුනි |
| | AAA | රැම් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | - නිගමනය : ස්ථාවරයි<br>දිගුකාලීන වන්දිගෙවීමේ හැකියාව<br>- නිගමනය : ස්ථාවරයි | 2011 අගෝස්තු |
| | P1 | රැම් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | - කෙටිකාලීන වන්දිගෙවීමේ හැකියාව | 2011 අගෝස්තු |

| රක්ෂකයාගේ නම | තත්ත්ව දර්ශකය | දර්ශක සැකසූ නියෝජිත ආයතනය | දර්ශක සඳහා පදනම්කරගත් නිර්ණායක | දර්ශක තත්ත්ව ගතකල දිනය |
|---|---|---|---|---|
| එච්.එන්.බී. ඇෂුවරන්ස් පීඑල්සී | රක්ෂකයාගේ මූල්‍ය ශක්ති තත්ත්ව දර්ශකය A(lka) | ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | දක්වනු ලබන ඕනෑම රටක සියළු කර්මාන්තයන් හා වගකීම් වර්ගයන් සඳහා වන "හොඳම" ණය අවදානම සාපේක්ෂව ගත්කල යම් රක්ෂකයකු සතුව සිය ඔප්පු හිමියන් හා සබැඳි වගකීම් වලට මුහුණදීමට ඇති හැකියාව | 2011 මැයි |
| | ජාතික දිගුකාලීන දර්ශකයඃ A (lka) | ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | රටක "හොඳම" ණය අවදානමේ ප්‍රමාණීකරණයට ව්‍යවසායකත්ව ණයෙහි ගුණාත්මකභාවය | 2011 මැයි |
| ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන හා කෙටිකාලීන වන්දිගෙවීමේ හැකියාව A- සහ P2 අනුපිලිවෙලින් | රෑම් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | මූල්‍යමය වගකීම් දැරීමට ඇති හැකියාවේ ප්‍රමාණවත් බව ක්‍රියාකාරී පරිසරයේ සහ ආර්ථිකමය කොන්දෙසි වලදී සිදුවන බරපතල වෙනස්වීම් වලට නම්‍යශීලී වියහැකි බව, | 2011 දෙසැම්බර් |
| කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | BB+ | රෑම් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | වන්දිගෙවීම් හැකියාව | 2011 නොවැම්බර් |
| ඒෂියන්ස් එලයන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | BBB- | රෑම් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන හා කෙටිකාලීන වන්දිගෙවීමේ හැකියාව | 2011 නොවැම්බර් |

රක්ෂණ සමාගම් අතුරින් රක්‍ෂණ සමාගම් හතක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගතකොට ඇත, නම් වශයෙන් ඒවා සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, අව්වා එන්.ඩී.බී. ඉන්ෂුවරන්ස් පීඑල්සී, යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී. ඒෂියන්එලායන්ස් පීඑල්සී, එච්.එන්.බි, ඇෂුවරන්ස් පීඑල්සී, අමානා ටකාෆුල් පී එල් සී සහ ජනශක්ති ඉන්ෂුවරන්ස් පී එල් සී වේ. 4 වන රූප සටහනේ දක්වෙන්නේ ලයිස්තුගත/ලයිස්තුගත නොවූ රක්ෂණ සමාගම් වේ.

*රූප සටහන 4*

**ලයිස්තුගත කරන ලද /ලයිස්තුගත නොකරන ලද රක්‍ෂණ සමාගම්වල තත්ත්වය**




සංශෝධිත පනතින් ඒ වනවිට ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින රක්‍ෂකයකු සංශෝධිත පනත ක්‍රියාත්මක වූ දින සිට වසර පහක් ඇතුලතදි කොටස් හුවමාරුවේ ලයිස්තුගත වී තිබිය යුතුය.

ලයිස්තු ගතකිරීමට පෙරාතුව, සංශෝධිත පනත ක්‍රියාත්මක වූ දින සිට වසර හතරක කාලයක් ඇතුලත සංයුක්ත රක්ෂණ සමාගම් ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන්කල යුතුය.

මෙසේ වෙන්කිරිමේදී පැනනැගිය හැකි අභියෝගයන් සහ ඒ සඳහා පිළියම් හඳුනාගැනීමේ අරමුණින් මණ්ඩලය ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL) සමග එක්ව කටයුතු කරයි.

සංශෝධිත පනත බලාත්මක වුවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් මණ්ඩලය මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලය ඇතුලතදී කොටස් හුවමාරුවේ ලැයිස්තුගත විය යුතු බවට නියම කෙරේ.

2002 අප්‍රේල් 19 දින විනිමය පාලක දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අංක 1232/14 දරණ ගැසට් දැන්වීම ප්‍රකාර විදේශ ව්‍යාපාර කොටස් 100% දක්වා රක්‍ෂණ සමාගම්වලට තබාගැනීමට අවසර දී ඇත. අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියානස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්, යන සමාගම් දෙකෙහි 100% විදේශ කොටස් සහභාගිත්වයක් ඇත. එම සමාගම් අලියාන්ස් SE හි ව්‍යාපාරයේ අනුබද්ධ සමාගම්ය.

### රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අයකිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අයකිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජුලි 9 දින දරණ අංක 1244/5 ගැසට් නිවේදනය මගින්, දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2%ක්ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.4%ක්ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කල යුතු බව පැහැදිලිකොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මකවූ අතර 2011 වසරේ එසේ එකතු කරන ලද මුදල රුපියල් මිලියන 217 කි.

### ඔප්පු හිමියන් ආරක්ෂණ අරමුදල


පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුනු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ.

වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේද යහපත උදෙසා මෙම අරමුදල් පහත දැක්වෙන ආකාරයට යොදවා ගත හැක.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේදීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම් කටයුතු වලදීත් සිදුවන වියදම් පියවාලීම; සහ
ආ) මණ්ඩලය එහි බලතල, වගකීම්, හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරනු ලබන වියදම් පියවාගැනිම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙහි ඇති වත්කම් රජයේ සුරැකුම්පත්හි අයෝජනය කෙරේ. 2011 දෙසැම්බර් 31 දිනට එම අරමුදලෙහි සංචිතය රුපියල් බිලියන 1.279 ක් විය. මෙය 2010 දෙසැම්බර් 31 දී රුපියල් බිලියන 1.012 ක මුදලෙන් 26.38% වර්ධනයකි.

*වගුව 2*




### රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතු වල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මකවන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණ සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසිකරන ලදී.

### බද්දෙන් නිදහස් කිරීම

2011 අංක 9 දරණ අගය එකතු කරන ලද (සංශෝධිත) බදු පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව, ප්‍රතිරක්ෂණයේදී, දේශීය රක්ෂණ සමාගමක් ව්‍යාපාර කටයුත්තෙන් කොමිස් වශයෙන් හෝ වන්දි වශයෙන් ලබන මුදල් 2011 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි අගය එකතු කරන ලද (VAT) බද්දෙන් නිදහස් කරන ලදී. මෙම බදු නිදහස ලබාගනු ලැබුයේ රක්ෂණ කර්මාන්තයේ යහපත පතා මණ්ඩලය මගින් කරන ලද ඉල්ලීම් හේතුවෙනි.

### එතෙර රක්ෂණ - සංචාරක, සෞඛ්‍ය සහ ණයගැති රක්ෂණය

පනතේ 101 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඕනෑම පුද්ගලයකුට, එතෙර ලියාපදිංචි හෝ බලපත් ලද, (ශ්‍රී ලංකාව තුල පනත යටතේ ලියාපදිංචියක් ලබා නොමැති වුවද) රක්ෂකයකුගෙන් ඍජු හෝ වක්‍ර මාර්ගයකින් සෞඛ්‍ය හා සංචාරක රක්ෂණයක් ලබාගැනීම සඳහා මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත. තවද පනත යටතේ ලියාපදිංචියක් ලබා නොමැති වුවද එතෙර ලියාපදිංචි හෝ බලපත් ලත් රක්ෂකයකුගෙන්, සේවාවන් ලබාදීමේදී පැන නගින වන්දිගෙවීම් වලින් තමන්ගේ අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් ආරක්ෂා කර ගැනිම සඳහා අවශ්‍ය ණයගැති රක්ෂණ සහතිකයක් ලබාගැනිමට ලියාපදිංචිය ලත් රක්ෂකයිනට අනුමැතිය ලබාදී ඇත. එබඳු ක්‍රියාමාර්ගයකදී දේශීය පාර්ශවකරුවනට ලැබෙන වන්දි ශ්‍රී ලංකාව තුළට විදේශ මුදල් වශයෙන් ගෙනඒම කළයුතුය.

### පනතේ බලපෑමෙන් නිදහස්වීම

පනතෙන් පැනවෙන නීති රීති පහත දැක්වෙන රක්ෂණ ආයතන වලට බල නොපැවත්වේ, 1999 අංක 20 දරණ කෘෂි හා වගා රක්ෂණ පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරණ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත විසින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 1996 අංක 17 දරණ සමාජ රක්ෂණ මණ්ඩල පනත යටතේ ස්ථාපිත සමාජ රක්ෂණ මණ්ඩලය.

### ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

පනතේ 12 වන වගන්තියට කරන ලද සංශෝධනයෙන් 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, "මණ්ඩලයේ" විෂය පථය තුලට ග්‍රහනය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ "වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අරමුදල" ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල

වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම්, අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කලයුතුය.

සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ ප්‍රතිරක්ෂණ වගකීමෙන් 20%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබාදිය යුතු බව මණ්ඩලය විසින් තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් පනතෙහි 31 වන වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් නියෝගයක් පනවා ඇත.

## අනෙකුත් අදාළ කරුණු

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථවාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම්වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවති. මෝටර් රථවාහන රක්ෂණ ආවරණ ලබාදෙන රක්ෂකයින් සෑමකෙනෙකුම තෙවන පාර්ශ්වික රක්ෂණ වාරිකයකින් 1%ක් මාර්ග ආරක්ෂක අරමුදලට දායක කලයුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහිද රක්ෂණ මණ්ඩලයට නියෝජනයක් ඇත.

### අන්තර් නියාමන ආයතන සභාව (IRIC)

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දකි. ඉහල මට්ටමේ කමිටුවක් වන මෙහි ප්‍රධානත්වය ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබන අතර මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළෙඳපලෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියළු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ මණ්ඩලය අන්තර් නියාමන ආයතන සභාවේද නියෝජනය වෙයි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබාගතහැක. ජාතික රක්ෂණ භාර අරමුදල හැර අනෙක් සියළු රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය. මෙම සංගමය මණ්ඩලය සමග ඉතා සමීපව කටයුතු කරයි. මෙම සංගමයෙහි විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම දරයි. ජීවිත රක්ෂණ සංසදය, පොදු රක්ෂණ සංසදය, සහ මූල්‍ය හා ජීවගණකඥ අනුකමිටුව විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාලවන්නාවූ විෂය ක්ෂේත්‍ර පිළිබඳව විධායක කමිටුවට නිර්දේශ ඉදිරිපත් කරයි.

සංගමයේ ප්‍රධාන අරමුණු :-

රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනුවස් ශ්‍රී ලංකාව තුල රක්ෂණ සහ/හෝ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයෙහි නිරතව සිටින සියළු රක්ෂකයින් එකමුතු කිරීම.

රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියාපිළිවෙතක් හා උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සේම, අදාළ ව්‍යවස්ථාවන් අධීක්ෂණය කිරීම සඳහා අදාළ වගකිවයුතු අධිකාරීන් වෙත නියෝජනයන් සිදුකිරීම මගින්ද රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව රක්ෂණය වන ජනතාවගේ දැනුමත්, විශ්වාසයත් වර්ධනය කිරීම.

ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද තාක්ෂණික උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණ කිරීම සහ අවශ්‍ය වේ නම් පවත්නා ප්‍රතිපත්ති සහ/හෝ බදුවලට එකී ක්‍රම සංශෝධන හෝ වෙනස්කිරීම් වලට පසු නිර්දේශ නිකුත් කිරීම.

අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීය භාවය ප්‍රවර්ධනය දිරිගැන්වීම හා ඊට සක්‍රියව සහයවීම, ඒ සඳහා පන්ති, සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන රැස්වීම් පැවැත්වීම.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරව්කරුවන්ගේ සංගමය (SLIBA)

මණ්ඩලය විසින් අනුමත කරන ලද එකම රක්ෂණ තැරව්කරුවන්ගේ සංගමය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ තැරව්කරුවන්ගේ සංගමයයි. පනතේ 79 වන වගන්තිය අනුව සියළුම ලියාපදිංචි රක්ෂණ තැරව්කාර සමාගම් මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගැනීම අනිවාර්ය වන අතර රක්ෂණ තැරව්කාර සමාගමක් ලෙස ක්‍රියාත්මක වන්නට අපේක්ෂා කරන සෑම සමාගමක්ම මණ්ඩලයේ අනුමැතිය සඳහා අයදුම්කරන්නට පෙර මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගැනීම අවශ්‍යවේ. සංගමය විසින් සකස් කරනු ලැබූ එහි කටයුතු සඳහා අදාල රීති මාලාව සාමාජික සමාගම් විසින් පිළිපදිනු ලැබිය යුතු වන්නේය.

**ශ්‍රී ලංකා රක්ෂණ තැරව්කරුවන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු:**

රක්ෂණ තැරව්කරුවන්ගේ කාර්යභාරය පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කිරීම.

සාමාජිකයින් අතර තාක්ෂණික දැනුම වැඩිකිරීම සහ ඉහල මට්ටමක නිපුනතාවයක් සහ වෘත්තීයභාවයක් ගොඩනැගීම.

රක්ෂණ පාඨමාලාවන් හැදෑරීමට සහ වෘත්තීය සුදුසුකම් ලබාගැනීමට සාමාජිකයින්ව දිරිමත් කිරීම සහ සහයෝගය ලබාදීම.

නියාමකයන්, රක්ෂකයින් සහ මහජනතාව සමගින් හොඳහිත සහ හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේදී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්ත වන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයාගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනැමෙන දායකත්ව තුලින් හා සාමාජිකයින්ගේ වාර්ෂික සාමාජික මුදල් වලිනි.

**ශ්‍රී ලංකා රක්‍ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු:**

රක්‍ෂණ ක්‍ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනයත් කාර්යක්ෂමතාවත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම. ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්‍ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීමටත් කර්මාන්තය පිළිබඳව වෘත්තිකත්වය ලබාදීම පිණිස;

රක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳව දැනුම වර්ධනය කිරීම.

ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්‍ෂණ ක්‍ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීමට සහය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විභාග පැවැත්වීම.

වෘත්තීය කරුණු පිළිබඳව සාකච්ඡා සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත් සාමාජිකයිනට වැදගත් වන්නාවූ සිදුවීම් වාර්තා, හෝ ලැයිස්තු වැනි දෑ සංස්කරණයටත් ඉඩ සැලසීම.

ශ්‍රී ලංකා රක්‍ෂණ ආයතනයේ සමාජිකයින්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්‍ෂා කිරීමටත්, ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත්කල රක්‍ෂණ නිලධාරීන්ගේත්, ආයතනික සාමාජිකයන්ගේත් තත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇතිකිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්‍ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර, ඕස්ට්‍රේලියාවේ රක්‍ෂණ ආයතනය, ඉන්දියාවේ රක්‍ෂණ ආයතනය, සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාගද මෙහෙයවනු ලබයි. රක්‍ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා සංගමය විසින් කෙටිකාලීන රක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාද පවත්වනු ලැබේ.

රක්‍ෂණ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවාගැනීම් පරීක්‍ෂණ සිදුකිරීමේ වගකීම මණ්ඩලය විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්‍ෂණ ක්‍ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවාගැනීමේ පරීක්‍ෂණ පවත්වනු ලැබේ.

## රක්‍ෂණ අධීක්‍ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්‍ෂණ අධීක්‍ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයකු වශයෙන්, ඔවුන් විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්‍ෂණ ක්‍රියාපිලිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු ද නිතිපතා මණ්ඩලයට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන වැදගත් ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ රක්‍ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්‍ෂණය කරනු හා මෙහෙයවනු පිණිස මණ්ඩලය විසින්ද පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

### සමස්ත කාර්යසාධනය

1 වන වගුවෙහි දැක්වෙන ආකාරයට රක්ෂණ කර්මාන්තය 2011 වසරේ දී රු. මිලියන 78,512ක දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් 18.5%ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ. (2010 : රුපියල් මිලියන 66,253). ඉහත වර්ධනය සඳහා දීර්ඝකාලීන රක්ෂණ කටයුතුවලින් දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 35,181ක් (2010: 31,152) ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 43,331ක් (2010: 35,101) දායකත්වයක් ද දක්වා ඇත.

ආර්ථිකයේ ඇති වූ සීඝ්‍ර වර්ධනය මෙම කාර්යසාධනය සඳහා වැඩි වශයෙන් හේතු විය. තවද, ශ්‍රී ලංකා ආර්ථිකය ද වඩා අභියෝගාත්මක දේශීය හා බාහිර අභියෝග හමුවේ 2011 වසරේ දී 8.3%ක ආර්ථික වර්ධනයක් ලඟා කර ගනිමින් එහි ඇති ප්‍රත්‍යස්ථිතිකභාවය ප්‍රදර්ශනය කරන ලදී. සමුච්චිත දළ ලිඛිත වාරික ආදායමෙන් 55%ක් (2010: 53%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් වූ අතර සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 45% ක් (2010: 47%) දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු විය.

රක්ෂණ අංශයේ ව්‍යාප්තිය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1.2%ක් වූ (2010: 1.18%) අතර දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාප්තිය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 0.54% ක් විය (2010: 0.55%). එමෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාප්තිය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 0.66%ක් විය (2010: 0.63%).

වගුව 1
**වාරික ආදායම හා ව්‍යාප්තිය**

| | 2007 (අ) | 2008 (අ) | 2009 (අ) | 2010 (අ) | 2011 (ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 20,706 | 23,613 | 24,005 | 31,152 | 35,181 |
| සාමාන්‍ය රක්ෂණය (රුපියල් මිලියන) | 31,184 | 34,558 | 33,548 | 35,101 | 43,331 |
| මුළු වාරික ආදායම (රුපියල් මිලියන) | 51,890 | 58,171 | 57,553 | 66,253 | 78,512 |
| දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් බිලියන)* | 3,579 | 4,411 | 4,835 | 5,604 | 6,543 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය- කර්මාන්තය | 1.45 | 1.32 | 1.19 | 1.18 | 1.20 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය- දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු | 0.58 | 0.54 | 0.50 | 0.55 | 0.54 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය-සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු | 0.87 | 0.78 | 0.69 | 0.63 | 0.66 |
| රක්ෂණ ඝණත්වය- (සමස්ත වාරික ආදායම/ජනගහනය) රුපියල් | 2,589.45 | 2,877.33 | 2,814.33 | 3,207.91 | 3,762.14 |
| ජනගහනය 000 (වර්ෂය මැද)* | 20,039 | 20,217 | 20,450 | 20,653 | 20,869 |
| මුළු වාරිකවල වර්ධන අනුපාතය (%) | 20.58 | 12.10 | (1.06) | 15.12 | 18.50 |

*මූලාශය ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා
(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

සටහන:

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ද.ලි.වා. සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

*වගුව 2*
**රක්ෂණ සමාගම් සතු වත්කම්**

| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
|---|---|---|---|---|---|
| වත්කම්: දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 84,822 | 97,730 | 118,305 | 139,647 | 165,669 |
| වත්කම්: සාමාන්‍ය රක්ෂණය සහ කොටස්හිමියන් (රුපියල් මිලියන) | 50,054 | 58,263 | 62,740 | 82,450 | 99,744 |
| **එකතුව** | **134,876** | **155,993** | **181,045** | ***219,102** | ***261,778** |

**සංයුක්ත රක්ෂණ සමාගම්වල අන්තර්කොටස් ගනුදෙනු (ජීවිත හා සාමාන්‍ය) ඉවත් කර ඇත.*

*(අ) පුනර්යුක්ත විගණනය කරන ලද සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන:*
1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

2 වන වගුවෙහි දැක්වෙන අන්දමට අන්තර් අංශ (දීර්ඝකාලීන රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය) ගනුදෙනු වටිනාකම් ඉවත් කිරීමෙන් පසු, රක්ෂණ සමාගම් සතු සමස්ත වත්කම් ප්‍රමාණය 2011 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 261,778 විය (2010 : රුපියල් මිලියන 219,102). පසුගිය වසර හා සැසඳීමේ දී රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම් 2011 වසරේ දී 19.5%කින් ඉහළ ගොස් ඇත.

2011 දෙසැම්බර් 31 වැනි දින වනවිට දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සතු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 165,669 (2010: රුපියල් මිලියන 139,647) වූ අතර කොටස්හිමියන් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සතු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 99,744 (2010: රුපියල් මිලියන 82,450) විය.

## දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

**දළ ලිඛිත වාරික ආදායම (ද.ලි.වා.ආ)**

2011 වසර තුළ දී දිගු කාලීන රක්ෂණ අංශයෙහි දළ ලිඛිත ආදායම පෙර වසරට සාපේක්ෂව 12.93%ක වර්ධනයක් ලඟා කරගත් අතර දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 35,181 ක් විය (2010: රුපියල් මිලියන 31,152). සමස්ත දළ ලිඛිත වාරික ආදායම, සමස්ත දළ ලිඛිත වාරික ආදායම සඳහා එක් එක් රක්ෂකයාගේ දායකත්වය හා පසුගිය වසර පහ තුළ ලිඛිත වාරිකයෙහි වූ වර්ධන අනුපාත 3 වන වගුවේ දැක්වේ.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් 87.5% දළ ලිඛිත වාරිකයක් ප්‍රමුඛතම රක්ෂකයන් පස්දෙනා ලබා ගත් අතර ඉතිරි 12.5% අනෙකුත් දිගුකාලීන රක්ෂණ සමාගම් අතර බෙදී යන ලදී. 3 වන වගුවේ 1 වන රූප සටහනින් පෙන්නුම් කරන ආකාරයට සෙලින්කෝ රක්ෂණ සමාගම පසුගිය වර්ෂයේ මෙන්ම මෙම වසරේද ප්‍රමුඛතම ස්ථානය ලබා ගත් අතර එය දළ ලිඛිත වාරික ආදායමෙන් 27.9% ක වෙළඳ පොල පංගුවක් විය. 22.36% ක වෙළඳ පොල පංගුවක් ලබාගනිමින් අවීවා එන්ඩීබී සමාගම දෙවන ස්ථානය ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම 19.17% ක වෙළඳ පොල පංගුවක් ලබාගනිමින් 2011 වසරේදී තුන්වන ස්ථානය ලබා ගන්නා ලදී. යුනියන් ඇෂූවරන්ස් සමාගම 12.71% වෙළඳ පොල පංගුවක් ලබා ගනිමින් හතරවන ස්ථානයද, ජනශක්ති රක්ෂණ සමාගම 5.32% වෙළඳ පොල පංගුවක් ලබා ගනිමින් පස්වන ස්ථානය ද හිමි කරගන්නා ලදී.

සෙලින්කෝ රක්ෂණ සමාගම, අවීවා එන්ඩීබී රක්ෂණ සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සමාගම හා ජනශක්ති රක්ෂණ සමාගම හැර අනෙකුත් සියළුම සමාගම් වෙළඳ පොල පංගුවේ වර්ධනයක් පෙන්වීය.

*වගුව 3*


## දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම සඳහා සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව

| රක්ෂකයා | 2007(අ) | | 2008(අ) | | 2009(අ) | | 2010(අ) | | 2011(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරික ආදායම (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරික ආදායම (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරික ආදායම (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරික ආදායම (රු.'000) | වෙළෙඳ පොළ පංගුව % | වාරික ආදායම (රු.'000) | වෙළෙඳ පොළ පංගුව % |
| AAIPLC | 890,793 | 4.30 | 970,077 | 4.11 | 1,009,031 | 4.20 | 1,242,608 | 3.99 | 1,579,191 | 4.49 |
| AIL | - | - | - | - | | - | | - | - | - |
| ALILL | - | - | 4,013 | 0.02 | 101,816 | 0.42 | 204,814 | 0.66 | 351,299 | 1.00 |
| ANDBIPLC | 3,788,103 | 18.29 | 4,342,218 | 18.39 | 4,632,490 | 19.30 | 7,783,925 | 24.99 | 7,865,099 | 22.36 |
| ATPLC | 130,986 | 0.63 | 188,676 | 0.80 | 207,097 | 0.86 | 240,156 | 0.77 | 303,786 | 0.85 |
| CIPLC | 6,847,185 | 33.07 | 8,257,279 | 34.97 | 7,522,328 | 31.34 | 8,786,120 | 28.21 | 9,815,943 | 27.90 |
| COICL | 100,393 | 0.48 | 131,004 | 0.55 | 149,401 | 0.62 | 233,540 | 0.75 | 269,579 | 0.77 |
| HNBAPLC | 767,576 | 3.71 | 914,170 | 3.87 | 984,866 | 4.10 | 1,084,480 | 3.48 | 1,290,367 | 3.67 |
| JIPLC | 1,206,033 | 5.82 | 1,426,160 | 6.05 | 1,431,628 | 5.96 | 1,685,409 | 5.42 | 1,871,986 | 5.32 |
| LICLL | 254,238 | 1.23 | 255,099 | 1.08 | 251,150 | 1.05 | 252,656 | 0.81 | 295,859 | 0.84 |
| LOLCICL | - | - | - | - | - | - | - | - | 51,427 | 0.15 |
| MBSLICL | 23,813 | 0.12 | 52,637 | 0.22 | 55,606 | 0.24 | 89,984 | 0.28 | 143,156 | 0.41 |
| SLICL | 4,477,632 | 21.63 | 4,497,919 | 19.05 | 4,819,860 | 20.08 | 6,009,859 | 19.29 | 6,743,073 | 19.17 |
| SSRS | 55,541 | 0.27 | 69,617 | 0.29 | 61,563 | 0.26 | 73,030 | 0.23 | 128,113 | 0.36 |
| UAPLC | 2,163,480 | 10.45 | 2,503,887 | 10.60 | 2,778,184 | 11.57 | 3,465,505 | 11.12 | 4,471,627 | 12.71 |
| **එකතුව** | **20,705,773** | **100** | **23,612,756** | **100** | **24,005,020** | **100** | **31,152,086** | **100** | **35,180,505** | **100** |
| **වර්ධන අනුපාතය %** | **21.06** | | **14.04** | | **1.66** | | **29.77** | | **12.93** | |

*(අ) ප්‍රතිෂ්තාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*රූප සටහන 1*


**දළ ලිඛිත වාරික ආදායම සඳහා සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව- දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය: 2011**



පසුගිය වසර පහ සඳහා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛතම රක්ෂකයන් පස්දෙනාගේ සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව රූප සටහන 2 මගින් දැක්වේ.

*රූප සටහන 2*


**පසුගිය වසර පහ සඳහා ප්‍රමුඛතම රක්ෂකයන් පස්දෙනාගේ සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**




*(අ) ප්‍රතිස්ථාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*රූප සටහන 3*

**නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව**




| | 2007 (අ) | 2008 (අ) | 2009 (අ) | 2010 (අ) | 2011 (ආ) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 490,454 | 567,621 | 468,317 | 516,139 | 587,916 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 1,867,981 | 2,082,358 | 2,068,548 | 2,214,976 | 2,408,202 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස | 9.3 | 10.3 | 10.1 | 10.7 | 11.5 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස | 24.9 | 25.8 | 25.6 | 27.3 | 29.2 |

**මූලාශය: මුළු ජනගහනය සහ මුළු ශ්‍රම බලකාය (ශ්‍රී ලංකා මහ බැංකුව)*
*(අ) මණ්ඩලයට ඉදිරිපත් කරනලද ජීවගණක වාර්තාවලට අනුව*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

## දිගුකාලීන රක්ෂණ ඔප්පු

රූප සටහන 3 හි දැක්වෙන අන්දමට 2011 දෙසැම්බර් 31 වැනි දින වන විට සමස්ත ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2,408,202 ක් ලෙස වාර්තා වී තිබේ. 2010 වසර සමඟ සංසන්දනය කර බැලීමේ දී රක්ෂකයන් විසින් නව ජීවිත රක්ෂණ ඔප්පු 587,916ක් නිකුත් කරනු ලැබ ඇති අතර 2010 දී නිකුත් කරනු ලැබූ නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 516,139 ක් විය. මෙම වර්ධනය සඳහා බලපෑ ප්‍රධාන හේතු වූයේ රට තුළ ඇති වී ඇති යහපත් ආර්ථික තත්ත්වය, නව දිගුකාලීන රක්ෂණ ක්‍රමවේද වෙළඳපොළට හඳුන්වා දීම සහ රක්ෂකයන් විසින් දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයන් ද දියත් කරනු ලැබීමය. ජීවිත රක්ෂණවල ව්‍යාප්තිය සමස්ත ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස සැලකීමේ දී 11.5% ක් (2010: 10.7%) වූ අතර සමස්ත ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස සැලකීමේ දී එය 29.2%ක් (2010: 27.3%) විය.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

**දළ ලිඛිත වාරික ආදායම (ද.ලි.වා.ආ.)**

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශය සමුච්චිත දළ ලිඛිත වාරික ආදායමින් 55%ක වෙළඳපොළ පංගුවක් නිරූපණය කරමින් ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරන ලදී. 2011 වසරේ දී රක්ෂණ සමාගම් විසින් ජනනය කරන ලද සමස්ත දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 43,331ක් (2010: රුපියල් මිලියන 35,101) වූ අතර පසුගිය වසරේ 4.63%ක් වූ වර්ධනයට සාපේක්ෂව එය 23.45%ක වර්ධනයක් පෙන්නුම් කළේය. සමස්ත දළ ලිඛිත වාරික ආදායම, වර්ධන අනුපාතය හා පසුගිය වසර පහ තුළ එක් එක් රක්ෂණ සමාගම්වල දළ ලිඛිත වාරිකයෙහි වූ වෙළඳපොළ පංගුව 4 වන වගුව මගින් දැක්වේ.

*වගුව 4*

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම සඳහා සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව**

| රක්ෂකයා | 2007(අ) | | 2008(අ) | | 2009(අ) | | 2010(අ) | | 2011(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ පංගුව% | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ පංගුව % |
| AAIPLC | 383,590 | 1.23 | 459,771 | 1.33 | 496,749 | 1.48 | 397,789 | 1.13 | 589,534 | 1.36 |
| AILL | 414,017 | 1.33 | 601,103 | 1.74 | 1,174,822 | 3.50 | 1,356,660 | 3.86 | 1,379,406 | 3.18 |
| ANDBIPLC | 1,867,142 | 5.99 | 2,045,252 | 5.92 | 2,503,628 | 7.46 | 2,490,843 | 7.10 | 2,456,348 | 5.67 |
| ATPLC | 678,012 | 2.17 | 835,188 | 2.42 | 953,798 | 2.84 | 908,756 | 2.59 | 934,406 | 2.16 |
| CIL | 706,293 | 2.26 | 932,730 | 2.70 | 879,285 | 2.62 | 890,387 | 2.54 | 942,901 | 2.18 |
| CILL | - | - | - | - | - | - | 359,105 | 1.02 | 1,149,121 | 2.65 |
| CIPLC | 10,350,684 | 33.19 | 11,287,233 | 32.66 | 9,081,297 | 27.07 | 8,724,292 | 24.85 | 9,558,943 | 22.06 |
| COICL | 289,691 | 0.93 | 522,449 | 1.51 | 596,183 | 1.78 | 644,814 | 1.84 | 922,862 | 2.13 |
| CTL | 34,945 | 0.11 | 178,734 | 0.52 | 28,324 | 0.08 | - | - | - | - |
| HNBAPLC | 704,577 | 2.26 | 924,709 | 2.67 | 1,130,781 | 3.37 | 1,255,190 | 3.58 | 1,623,829 | 3.75 |
| JIPLC | 3,678,224 | 11.80 | 3,937,285 | 11.39 | 4,272,926 | 12.74 | 4,324,170 | 12.32 | 5,086,207 | 11.74 |
| LOLCICL | - | - | - | - | - | - | - | - | 364,735 | 0.84 |
| MBSLICL | 230,782 | 0.74 | 294,317 | 0.85 | 271,309 | 0.81 | 467,606 | 1.33 | 658,073 | 1.52 |
| OIL | - | - | - | - | - | - | - | - | 1,759 | 0.00 |
| PIL | - | - | - | - | - | - | 847,064 | 2.42 | 2,284,578 | 5.27 |
| SLICL | 8,845,417 | 28.36 | 9,140,845 | 26.45 | 8,764,539 | 26.13 | 8,766,027 | 24.97 | 11,128,446 | 25.68 |
| SSRS | 186,000 | 0.60 | 216,412 | 0.63 | 184,409 | 0.55 | 234,914 | 0.67 | 232,374 | 0.54 |
| UAPLC | 2,814,654 | 9.03 | 3,182,236 | 9.21 | 3,210,217 | 9.57 | 3,433,830 | 9.78 | 4,017,587 | 9.27 |
| **එකතුව** | **31,184,028** | **100** | **34,558,264** | **100** | **33,548,267** | **100** | **35,101,447** | **100** | **43,331,109** | **100** |
| වර්ධන අනුපාතය % | **20.26** | | **10.82** | | **(2.92)** | | **4.63** | | **23.45** | |


*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

සටහන්:

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

*රූප සටහන 4*

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම සඳහා සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව- 2011**




*සටහන්:*


1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

රූප සටහන 4 හි දැක්වෙන අන්දමට ප්‍රමුඛතම රක්ෂකයන් පස්දෙනා 74%ක ප්‍රතිශතයකින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරිකයට දායක වූ අතර සෙසු පිරිස 26% ක ප්‍රතිශතයකින් එයට දායක විය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් 25.68%ක වෙළඳපොළ පංගුවක් ලබා ගනිමින් පෙර වසරේ දී පරිදිම සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ තුළ ඉදිරියෙන් සිටියේය. සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී හා ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී පිළිවෙලින් 22.06%ක හා 11.74%ක වෙළඳපොළ පංගුවක් ලබා ගනිමින් පසුගිය වසරට සමානවම දෙවැනි හා තෙවැනි ස්ථාන ලබා ගෙන ඇත. යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී සහ අවීවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී, පිළිවෙලින් 9.27%ක හා 5.67%ක වෙළඳපොළ පංගුවක් ලබා ගනිමින් පෙර වසරේ පරිදිම හතරවැනි හා පස්වැනි ස්ථාන හිමි කරගෙන ඇත.

පසුගිය වසර පහ සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛතම රක්ෂකයන් පස්දෙනාගේ සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව රූප සටහන 5 මගින් දැක්වේ.

*රූප සටහන 5*

**පසුගිය වසර පහ සඳහා ප්‍රමුඛතම රක්ෂකයන් පස්දෙනාගේ සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ වර්ග අනුව විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ වර්ග අනුව විශ්ලේෂණය 5 වන වගුවෙහි හා 6 වන රූපසටහනෙහි දැක්වේ. රථවාහන රක්ෂණ උප වර්ගයෙන් ලැබූ වාරික ආදායමින් වාර්තා කළ රුපියල් මිලියන 27,138 (2010: රුපියල් මිලියන 20,949) මගින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විශාලම කොටස නියෝජනය වූ අතර එය සමස්ත සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙන් 62.63%ක් (2010: 59.68%) විය. පසුගිය වසර හා සැසඳීමේ දී මෙය 29.55%ක (2010: 17.05%) වර්ධනයක් පෙන්නුම් කළේය. සහනදායී බදු අනුපාතික යටතේ රජයේ සේවකයන්ට රථවාහන ආනයනය කිරීම සඳහා අවසර පත්‍ර ලබා දීම හේතුවෙන් ලියාපදිංචි කරන ලද රථවාහන සංඛ්‍යාව ඉහළ යාම, අඩු ආනයන තීරුබදු හා වසර තුළ පැවති අඩු පොළී අනුපාතිකය යනාදිය මෙම වර්ධනයට හේතුවිය.

විවිධ රක්ෂණ ව්‍යාපාරයෙන් ලද වාරික ආදායම රුපියල් මිලියන 9,123 ක් (2010: රුපියල් මිලියන 7,614) වූ අතර එය සමස්ත වාරික ආදායමෙන් 21.06%ක් (2010:21.77%) විය. 2010 ට සාපේක්ෂව 2011 වසරේ දී එහි වර්ධනය 19.39%ක් විය. ගිනි රක්ෂණවලින් රුපියල් මිලියන 5,379ක වාරික ආදායමක් ලැබුණු අතර (2010: රුපියල් මිලියන 5,012) එය සමස්ත වාරික ආදායමෙන් 12.41%ක් විය. 2010 වසරට සාපේක්ෂව එය 7.3%කින් ඉහළ ගොස් ඇත. මුහුදු රක්ෂණවල දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 1,691ක් වූ අතර (2010: රුපියල් මිලියන 1,499) එය සමස්ත වාරික ආදායමෙන් 3.9%ක් (2010:4.27%) විය. 2010 වසර සමග සැසඳීමේ දී මුහුදු රක්ෂණ ව්‍යාපාරයෙහි වාරික ආදායම 12.85%කින් ඉහළ ගොස් තිබේ.

*වගුව 5*

**දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප වර්ගය | දළ ලිඛිත වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
| ගිනි | 6,261,802 | 6,826,563 | 7,049,399 | 5,012,443 | 5,378,548 |
| මුහුදු | 1,636,373 | 1,826,549 | 1,442,729 | 1,498,832 | 1,691,386 |
| රථවාහන | 17,049,613 | 18,717,735 | 17,897,763 | 20,948,782 | 27,138,107 |
| විවිධ | 6,236,240 | 7,187,417 | 7,158,375 | 7,641,390 | 9,123,068 |
| **එකතුව** | **31,184,028** | **34,558,264** | **33,548,266** | **35,101,447** | **43,331,109** |
| **උප වර්ගය** | **වර්ධනය (%)** | | | | |
| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
| ගිනි | 35.33 | 9.02 | 3.26 | (28.90) | 7.30 |
| මුහුදු | 5.26 | 11.62 | (21.01) | 3.89 | 12.85 |
| රථවාහන | 21.73 | 9.78 | (4.38) | 17.05 | 29.55 |
| විවිධ | 8.58 | 15.25 | (0.40) | 6.75 | 19.39 |
| **එකතුව** | **20.26** | **10.82** | **(2.92)** | **4.63** | **23.45** |
| **උප වර්ගය** | **ප්‍රතිශතාත්මක කොටස (%)** | | | | |
| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
| ගිනි | 20.08 | 19.75 | 21.01 | 14.28 | 12.41 |
| මුහුදු | 5.25 | 5.29 | 4.30 | 4.27 | 3.90 |
| රථවාහන | 54.67 | 54.16 | 53.35 | 59.68 | 62.63 |
| විවිධ | 20.00 | 20.80 | 21.34 | 21.77 | 21.06 |
| **එකතුව** | **100.00** | **100.00** | **100.00** | **100.00** | **100.00** |

*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණිත සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*


සටහන:

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ වර්ග අනුව විශ්ලේෂණය රූප සටහන 6 හි දැක්වේ.

*රූප සටහන 6*

**උප වර්ග දායකත්වය- සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




සටහන:

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි හිමිකම්පෑම් අනුපාතය**

ඉපැයූ වාරික, දරණ ලද හිමිකම්පෑම් හා පසුගිය වසර පහ සඳහා හිමිකම්පෑම් අනුපාතය පිළිබඳ තොරතුරු 6 වන වගුවෙන් සහ 7 වන රූප සටහන මගින් දැක්වේ.

එහි දැක්වෙන ආකාරයට ඉපැයූ සමස්ත වාරික රුපියල් මිලියන 31,784 (2010: රුපියල් මිලියන 25,412) ට සාපේක්ෂව දරණ ලද සමස්ත හිමිකම්පෑම් රුපියල් මිලියන 19,882 ක් (2010: රුපියල් මිලියන 15,571) ක් වූ අතර ඒ හේතුවෙන් 62.55%ක (2010: 61.27%) සමස්ත හිමිකම්පෑම් අනුපාතයක් ඇතිවිය.

වගුව 6 හි දැක්වෙන අන්දමට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි උප වර්ගවලින් වැඩිම හිමිකම්පෑම් අනුපාතයක් වාර්තා වූයේ රථවාහන රක්ෂණවලින් වූ අතර එය 65.43%ක් (2010: 63.92%) විය. අඩුම හිමිකම්පෑම් අනුපාතය වාර්තා කර ඇත්තේ මුහුදු රක්ෂණය වන අතර එය 33.68%. (2010: 32.05%) ක් විය. ගිනි රක්ෂණවල හිමිකම්පෑම් අනුපාතය 40.41%ක් වූ අතර (2010: 48.21%) එය 7.8%කින් පහළ ගොස් ඇත. විවිධ රක්ෂණවල හිමිකම්පෑම් අනුපාතය 59.14% (2010: 58.52%) විය. පසුගිය වර්ෂය හා සැසඳීමේ දී ගිනි රක්ෂණය හැර අනෙක් සියලුම උප වර්ගවල හිමිකම්පෑම් අනුපාතයේ වර්ධනයක් නිරූපණය විය.

ඉපැයූ වාරික, දරණ ලද හිමිකම්පෑම් හා පසුගිය වසර පහ සඳහා හිමිකම්පෑම් අනුපාතය රූප සටහන 7 මගින් දැක්වේ.

*වගුව 6*

## ඉපැයූ වාරික ආදායම, දරන ලද හිමිකම්පෑම් සහ හිමිකම්පෑම් අනුපාතය


| වර්ගය | ඉපැයූ වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
| ගිනි | 1,035,661 | 1,068,721 | 1,199,158 | 1,098,186 | 1,137,413 |
| මුහුදු | 544,592 | 692,776 | 580,333 | 674,476 | 736,204 |
| රථවාහන | 14,150,869 | 16,596,674 | 17,593,582 | 18,356,887 | 23,591,963 |
| විවිධ | 4,535,912 | 5,486,205 | 5,200,212 | 5,282,148 | 6,318,299 |
| **එකතුව** | **20,267,034** | **23,844,376** | **24,573,285** | **25,411,697** | **31,783,879** |
| **වර්ගය** | **දරන ලද හිමිකම්පෑම් (රුපියල් '000)** | | | | |
| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
| ගිනි | 877,654 | 879,742 | 953,478 | 529,448 | 459,599 |
| මුහුදු | 201,865 | 250,938 | 221,210 | 216,143 | 247,946 |
| රථවාහන | 9,282,407 | 11,240,430 | 11,680,229 | 11,733,879 | 15,437,337 |
| විවිධ | 2,692,368 | 3,372,917 | 4,166,757 | 3,091,110 | 3,736,891 |
| **එකතුව** | **13,054,294** | **15,744,027** | **17,021,674** | **15,570,580** | **19,881,773** |
| **වර්ගය** | **හිමිකම්පෑම් අනුපාතය (%)** | | | | |
| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
| ගිනි | 84.74 | 82.32 | 79.51 | 48.21 | 40.41 |
| මුහුදු | 37.07 | 36.22 | 38.12 | 32.05 | 33.68 |
| රථවාහන | 65.60 | 67.73 | 66.39 | 63.92 | 65.43 |
| විවිධ | 59.36 | 61.48 | 80.13 | 58.52 | 59.14 |
| **එකතුව** | **64.41** | **66.03** | **69.27** | **61.27** | **62.55** |

*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*සටහන:*

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

### රූප සටහන 7




*සටහන:*

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

වගුව 7

## දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම

| උප වර්ගය | දළ ලිඛිත වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
| ගිනි | 6,261,802 | 6,826,563 | 7,049,399 | 5,012,443 | 5,378,548 |
| මුහුදු | 1,636,373 | 1,826,549 | 1,442,729 | 1,498,832 | 1,691,386 |
| රථවාහන | 17,049,613 | 18,717,735 | 17,897,763 | 20,948,782 | 27,138,107 |
| විවිධ | 6,236,240 | 7,187,417 | 7,158,375 | 7,641,390 | 9,123,068 |
| **මුළු දළ ලිඛිත වාරිකය** | **31,184,028** | **34,558,264** | **33,548,266** | **35,101,447** | **43,331,109** |
| උප වර්ගය | ප්‍රතිරක්ෂණ වාරිකය (රුපියල් '000) | | | | |
| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
| ගිනි | 4,847,948 | 5,861,973 | 5,904,806 | 4,233,236 | 4,185,810 |
| මුහුදු | 1,021,126 | 1,174,809 | 892,411 | 813,665 | 860,614 |
| රථවාහන | 643,556 | 655,220 | 533,720 | 316,594 | 443,326 |
| විවිධ | 1,985,204 | 2,482,405 | 1,918,389 | 2,020,031 | 2,306,222 |
| **මුළු ප්‍රතිරක්ෂණ වාරිකය** | **8,497,834** | **10,174,407** | **9,249,326** | **7,383,526** | **7,795,972** |
| උප වර්ගය | රඳවා ගැනීම (රුපියල් '000) | | | | |
| | 2007(අ) | 2008(අ) | 2009(අ) | 2010(අ) | 2011(ආ) |
| ගිනි | 1,413,853 | 964,590 | 1,144,593 | 779,208 | 1,192,738 |
| මුහුදු | 615,247 | 651,740 | 550,318 | 685,167 | 830,772 |
| රථවාහන | 16,406,057 | 18,062,516 | 17,364,043 | 20,632,188 | 26,694,781 |
| විවිධ | 4,251,036 | 4,705,012 | 5,239,986 | 5,621,359 | 6,816,846 |
| **මුළු ශුද්ධ ලිඛිත වාරිකය** | **22,686,193** | **24,383,858** | **24,298,940** | **27,717,922** | **35,535,137** |
| උප වර්ගය | රඳවා ගැනීම දළ ලිඛිත වාරිකයෙන් ප්‍රතිශතයක් ලෙස | | | | |
| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
| ගිනි | 22.58 | 14.13 | 16.24 | 15.55 | 22.18 |
| මුහුදු | 37.60 | 35.68 | 38.14 | 45.71 | 49.12 |
| රථවාහන | 96.23 | 96.50 | 97.02 | 98.49 | 98.37 |
| විවිධ | 68.17 | 65.46 | 73.20 | 73.56 | 74.72 |
| **සමස්ත රඳවා ගැනීම** | **72.75** | **70.56** | **72.43** | **78.97** | **82.01** |

*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

සටහන:

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*


## දළ ලිඛිත වාරික ආදායම රඳවා ගැනීම සහ ප්‍රතිරක්ෂණය

පසුගිය වසර 5 සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ ශුද්ධ ලිඛිත වාරික ආදායම හා සමස්ත රඳවා ගැනීමේ අනුපාතය රූප සටහන 8 හා වගුව 7 මගින් දැක්වේ. 2011 වසරේ දී රුපියල් මිලියන 43,331ක් වූ සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් රුපියල් මිලියන 7,796 ක් (2010: රුපියල් මිලියන 7,384) ප්‍රතිරක්ෂණ වාරික ලෙස ගෙවා ඇත. මෙමගින් රුපියල් මිලියන 35,535ක (2010: රුපියල් මිලියන 27,718) රඳවා ගැනීමක් (ශුද්ධ ලිඛිත වාරික ආදායම) ඇති වී ඇත. 2011 වසරේ සමස්ත රඳවා ගැනීමේ අනුපාතය 82.01%ක් වූ අතර (2010: 78.97%) පෙර වසරට සාපේක්ෂව එහි වර්ධනයක් පෙන්නුම් කෙරේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි අනෙකුත් උප වර්ගයන් හා සැසඳීමේ දී රථවාහන රක්ෂණය තවදුරටත් 98.37%ක (2010: 98.49%) ඉහළම රඳවා ගැනීමේ අනුපාතයක් පවත්වා ගැනීමට සමත් වී ඇත. 2011 වසරේ දී ගිනි රක්ෂණවල රඳවාගැනීමේ අනුපාතය 22.18%ක් (2010: 15.55%) වූ අතර මුහුදු රක්ෂණයේ හා විවිධ රක්ෂණවල රඳවාගැනීමේ අනුපාතිකයන් පිළිවෙලින් 49.12%ක් (2010: 45.71%) හා 74.72% ක් (2010: 73.56%) නිරූපණය කළේය. ගිනි, විවිධ හා මුහුදු යන රක්ෂණවල රඳවා ගැනීමේ අනුපාතය වර්ධනයක් දැකිය හැකි අතර 2010 වසර සමග සසඳා බැලීමේ දී රථවාහන රක්ෂණවල රඳවා ගැනීමේ අනුපාතය අඩු වී ඇත.

*රූප සටහන 8*

**ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම**




සටහන:

1. *2010 හා 2011 වසර සඳහා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

### රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම්

2011 දෙසැම්බර් 31 වන විට රක්ෂණ සමාගම් සතු සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 3,634ක අන්තර් අංශ ශේෂය ඉවත් කළ පසු රුපියල් මිලියන 261,778 ක් ලෙස වාර්තා කරනු ලැබ තිබේ. 2011 දෙසැම්බර් 31 වැනිදා වන විට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 165,669 ක් (2010: රුපියල් මිලියන 139,647) විය. 2011 දෙසැම්බර් 31 වැනිදා වන විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශයේ වත්කම් හා කොටස්හිමියන්ගේ වත්කම් ප්‍රමාණය හා සමග රුපියල් මිලියන 99,744ක් (2010: රුපියල් මිලියන 82,450) දක්වා වැඩි විය. රක්ෂකයන්ගේ වත්කම් සංකේන්ද්‍රගතවීම සමාගම් මට්ටමින් විශ්ලේෂණය වගුව 8 සහ රූප සටහන 9 මගින් නිරූපණය වේ.

*වගුව 8*

### රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම්

| රක්ෂකයා | වත්කම් ව්‍යාප්තිය 2010 (අ) දිගුකාලීන රක්ෂණය රුපියල් '000 | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් රුපියල් '000 | අන්තර් අංශ ගණුදෙනු ඉවත් කිරීම රුපියල් '000 | එකතුව රුපියල් '000 | % | 2011 (ආ) දිගුකාලීන රක්ෂණය රුපියල් '000 | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් රුපියල් '000 | අන්තර් අංශ ගණුදෙනු ඉවත් කිරීම රුපියල් '000 | එකතුව රුපියල් '000 | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| AAIPLC | 2,230,622 | 2,119,712 | - | 4,350,334 | 1.99 | 2,739,921 | 1,990,623 | - | 4,730,544 | 1.81 |
| AIL | - | - | - | - | - | 513,804 | - | - | 513,804 | 0.20 |
| AILL | - | 1,586,020 | - | 1,586,020 | 0.72 | - | 1,799,715 | - | 1,799,715 | 0.69 |
| ALILL | 282,365 | - | - | 282,365 | 0.13 | 486,094 | - | - | 486,094 | 0.19 |
| ANDBIPLC | 25,608,474 | 6,068,488 | - | 31,676,962 | 14.46 | 29,711,684 | 6,707,067 | - | 36,418,751 | 13.91 |
| ATPLC | 486,077 | 1,022,356 | 60,910 | 1,447,523 | 0.66 | 601,531 | 1,360,591 | 9,555 | 1,952,567 | 0.75 |
| CIL | - | 730,196 | - | 730,196 | 0.33 | - | 891,357 | - | 891,357 | 0.34 |
| CILL | - | 754,788 | - | 754,788 | 0.34 | - | 1,192,349 | - | 1,192,349 | 0.46 |
| CIPLC | 34,071,282 | 17,269,800 | 2,525,580 | 48,815,502 | 22.28 | 44,670,243 | 19,854,742 | 3,155,408 | 61,369,577 | 23.44 |
| COICL | 482,753 | 1,087,949 | - | 1,570,702 | 0.72 | 602,303 | 1,474,160 | - | 2,076,463 | 0.79 |
| CTL | - | - | - | - | - | - | - | - | - | - |
| HNBAPLC | 2,558,981 | 1,990,382 | 1,159 | 4,548,204 | 2.08 | 3,219,639 | 2,817,245 | 980 | 6,035,904 | 2.31 |
| JIPLC | 4,546,591 | 7,319,753 | - | 11,866,344 | 5.42 | 5,147,107 | 7,825,564 | - | 12,972,671 | 4.96 |
| LICLL | 978,637 | - | - | 978,637 | 0.44 | 1,189,152 | - | - | 1,189,152 | 0.45 |
| LOLCICL | - | 209,393 | - | 209,393 | 0.10 | 64,320 | 598,610 | 3,405 | 659,525 | 0.25 |
| MBSLICL | 85,341 | 548,698 | - | 634,039 | 0.29 | 131,706 | 849,287 | - | 980,993 | 0.36 |
| OIL | - | - | - | - | - | - | 776,924 | - | 776,924 | 0.30 |
| PIL | - | 870,141 | - | 870,141 | 0.40 | - | 2,441,020 | - | 2,441,020 | 0.93 |
| SLICL | 55,162,701 | 34,116,290 | - | 89,278,992 | 40.75 | 61,069,552 | 41,630,922 | - | 102,700,474 | 39.23 |
| SSRS | 165,510 | 433,842 | - | 599,352 | 0.26 | 230,967 | 563,436 | - | 794,403 | 0.30 |
| UAPLC | 12,987,843 | 6,322,550 | 407,765 | 18,902,628 | 8.63 | 15,290,943 | 6,970,169 | 464,977 | 21,796,135 | 8.33 |
| **එකතුව** | **139,647,178** | **82,450,358** | **2,995,414** | **219,102,122** | **100** | **165,668,966** | **99,743,781** | **3,634,325** | **261,778,422** | **100** |


*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*සටහන:*

1. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
2. *සංයුක්ත රක්ෂණ සමාගම්වල අනෙකුත් අංශවලින් ලැබිය යුතු ප්‍රමාණයන් (දීර්ඝකාලීන රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණ අංශයන්) අන්තර් අංශ ශේෂවලට ඇතුලත් වේ.*
3. *ALILL, AIL සහ LICLL හි කොටස්හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*
4. *JIPLC සහ NICL එකට වාර්තා කර ඇත.*
5. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

**රූප සටහන 9**

**සමාගම් මට්ටමින් වත්කම් සංකේන්ද්‍රගතවීම -2011**




## රක්ෂණ සමාගම්වල දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රගත වීම

2011 දෙසැම්බර් 31 දින වනවිට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි විවිධ වත්කම් කාණ්ඩවල සංකේන්ද්‍රගතවීම 9 වන වගුව සහ 10 වන රූප සටහන මගින් නිරූපණය වේ. රජයේ සුරැකුම්පත්වල කරන ලද ආයෝජන රුපියල් මිලියන 83,944ක් වූ අතර එය සමස්ත වත්කම්වලින් 50.67%ක් විය.

පනතින් නියම කර ඇති පරිදි සෑම රක්ෂකයකු විසින්ම තම දීර්ඝකාලීන රක්ෂණ අරමුදලින් 30% ක් වූ අවම ව්‍යවස්ථාපිත ආයෝජන සීමාව ඉක්මවා රජයේ සුරැකුම්පත්වල ආයෝජන කර ඇති බවත් දීර්ඝකාලීන රක්ෂණ අරමුදලේ ඉතිරි අනෙකුත් වත්කම් මණ්ඩලය විසින් 2011 වර්ෂයේදී නියම කර ඇති නිර්නායක අංක 01 ට (Determination No. 1) අනුකූල වන පරිදි 2011 වර්ෂය තුළදී ආයෝජනය කරනු ලැබ ඇති බවටත්, මණ්ඩලය විසින් තහවුරු කරගෙන ඇත.

තවද 9 වන වගුව හා 10 වන රූප සටහන මගින් පෙන්නුම් කරන ආකාරයට දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් රක්ෂකයන් විසින් ස්කන්ධ, තැන්පතු හා සංස්ථා ණය (Corporate debt) යනාදී වත්කම් වර්ගවල යොදවා ඇති බව නිරූපණය කෙරේ.

*වගුව 9*


### දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රගත වීම- 2011

| වත්කම් වර්ගය | රුපියල් '000 | % |
|---|---|---|
| රජයේ ණය සුරැකුම් | 83,944,280 | 50.67 |
| ස්කන්ධ | 23,339,196 | 14.09 |
| සංස්ථා ණය | 10,598,987 | 6.40 |
| ඉඩම් හා ගොඩනැගිලි | 5,918,594 | 3.57 |
| තැන්පතු | 25,627,511 | 15.47 |
| ඒකක භාර | 1,292,158 | 0.78 |
| රත්රන්වල ආයෝජන | 110,916 | 0.07 |
| ඔප්පු ණය | 4,186,821 | 2.53 |
| වෙනත් වත්කම් | 8,902,230 | 5.36 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 1,748,273 | 1.06 |
| **එකතුව** | **165,668,966** | **100** |

*සටහන:*
*ALILL, AIL සහ LICLL හි කොටස්හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*

*රූප සටහන 10*

**දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රගත වීම- 2011**



## රක්ෂණ සමාගම්වල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රගත වීම (කොටස්හිමියන් ද ඇතුළුව)

10 වන වගුව සහ 11 වන රූප සටහන මගින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට සහ රක්ෂකයන්ගේ කොටස් හිමියන්ට අදාළ වත්කම් සංකේන්ද්‍රගතවීම නිරූපණය කරයි. එමගින් ස්කන්ධවල කරනු ලැබූ ආයෝජනය (එයට පරිපාලිත සමාගම්වල හා ආශ්‍රිත සමාගම්වල කරන ලද ආයෝජන ද ඇතුලත් වේ.) රුපියල් මිලියන 27,174ක් වූ අතර එය සාමාන්‍ය රක්ෂණවල සමස්ත වත්කම්වලින් 27.24%ක් විය. රජයේ ණය සුරැකුම්වල කරනු ලැබූ ආයෝජනය රුපියල් මිලියන 24,804ක් වූ අතර එය සාමාන්‍ය රක්ෂණවල සමස්ත වත්කම්වලින් 24.87%ක් විය. මෙම ආයෝජන අංශ දෙක සමස්ත වත්කම්වලින් 52.11%ක් නිරූපණය කළේය. සාමාන්‍ය රක්ෂණයෙහි හා කොටස්හිමියන්ගේ වත්කම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රතිරක්ෂකයන්ගෙන්, ඔප්පුහිමියන්ගෙන් සහ අතරමැදියන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණයන්, ඉඩම් හා ගොඩනැගිලි, තැන්පතු හා අනෙක් වත්කම් වශයෙන් පවතී. පනත අනුව රක්ෂකයන් සිය තාක්ෂණික සංචිතයෙන් අවම වශයෙන් 20%ක ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි නියුතු රක්ෂකයන් කටයුතු කළා ද යන්න සහ 2011 අංක 1 දරණ නිර්ණායකයෙහි සඳහන් කර ඇති ආකාරයට රක්ෂකයන් විසින් ඉතිරි අනෙකුත් වත්කම් ආයෝජනය කරනු ලැබුවා ද යන්න මණ්ඩලය විසින් දැඩි සැලකිල්ලෙන් විමර්ෂණය කරනු ලැබීය.

*වගුව 10*


**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රගත වීම (කොටස්හිමියන් ද ඇතුළුව) - 2011**

| වත්කම් වර්ගය | රුපියල් '000 | % |
|---|---|---|
| රජයේ ණය සුරැකුම් | 24,804,466 | 24.87 |
| ස්කන්ධ | 27,173,716 | 27.24 |
| සංස්ථා ණය | 3,655,418 | 3.66 |
| ඉඩම් හා ගොඩනැගිලි | 7,915,779 | 7.94 |
| තැන්පතු | 6,679,485 | 6.70 |
| ඒකක භාර | 1,012,129 | 1.01 |
| රත්රන්වල ආයෝජන | 344,224 | 0.35 |
| ප්‍රතිරක්ෂකයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණ | 5,355,937 | 5.37 |
| ඔප්පුහිමියන්ගෙන් සහ අතරමැදියන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණ | 8,484,116 | 8.51 |
| දේපල, පිරියත සහ උපකරණ | 1,912,810 | 1.92 |
| වෙනත් වත්කම් | 11,291,960 | 11.31 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 1,113,741 | 1.12 |
| **එකතුව** | **99,743,781** | **100** |

සටහන්:
1. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*
3. *ALILL, AIL සහ LICLL හි කොටස්හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*

*රූප සටහන: 11*

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස්හිමියන්ගේ වත්කම්වල සංකේන්ද්‍රගත වීම - 2011**




සටහන්:
1. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*
3. *ALILL, AIL සහ LICLL හි කොටස්හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*

## ප්‍රධාන මූල්‍ය ආයතන අතර මුළු වත්කම් බෙදීයාම

ප්‍රධාන මූල්‍ය ආයතන සතු වූ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 7,703.1 ක් වූ (2010: රුපියල් බිලියන 6,574.4) අතර රක්ෂණ සමාගම් සතු වූ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 261.8 (2010: රුපියල් බිලියන 219.1) විය. 2007 සිට 2011 දක්වා ප්‍රධාන මූල්‍ය ආයතන අතර මුළු වත්කම් බෙදීයාම 11 වන වගුව මගින් නිරූපණය වේ.

*වගුව 11*

### ප්‍රධාන මූල්‍ය ආයතන අතර මුළු වත්කම් බෙදීයාම


| මූල්‍ය ආයතනය | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | | 2008 | | 2009 | | 2010 | | 2011 | |
| | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % |
| බැංකු අංශය | 3,065.6 | 71.1 | 3,294.6 | 68.1 | 3,832.0 | 68.2 | 4,527.3 | 68.9 | 5,367.8 | 69.7 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 175.3 | 4.1 | 285.9 | 5.9 | 315.1 | 5.6 | 295.0 | 4.5 | 427.0 | 5.5 |
| අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන | 180.8 | 4.2 | 239.7 | 5.0 | 265.3 | 4.7 | 354.3 | 5.4 | 340.8 | 4.4 |
| ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන | 754.5 | 17.5 | 863.8 | 17.8 | 1,022.6 | 18.3 | 1,178.7 | 17.9 | 1,305.7 | 17.0 |
| රක්ෂණ සමාගම් | 134.9(අ) | 3.1 | 156.0(අ) | 3.2 | 181.0(අ) | 3.2 | 219.1(අ) | 3.3 | 261.8(ආ) | 3.4 |
| **එකතුව** | **4,311.1** | **100** | **4,840.0** | **100** | **5,616.0** | **100** | **6,574.4** | **100** | **7,703.1** | **100** |

**මූලාශ්‍රය:- ශ්‍රී ලංකා මහ බැංකුව (රක්ෂණ සමාගම් සහ ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතනවල වත්කම් ප්‍රතිෂ්ඨාපිත කරන්නේ මණ්ඩලයේ දත්ත පදනම් කරගෙනය.)*

*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

2011 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රධාන මූල්‍ය ආයතන අතර මුළු වත්කම් බෙදීයාම 12 වන රූප සටහන මගින් නිරූපණය වේ.

*රූප සටහන 12*



### රක්ෂණ සමාගම්වල කොටස්හිමියන්ගේ මුළු අරමුදල්

2011 දෙසැම්බර් 31 වන දිනට කොටස් හිමියන්ගේ අරමුදල් රක්ෂණ සමාගම් අතර බෙදීයාම 12 වන වගුව මගින් නිරූපණය වන අතර රක්ෂණ කර්මාන්තයේ කොටස් හිමියන්ගේ මුළු අරමුදලෙන් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයකට (70.72%) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ අවීවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී යන සමාගම් තුන දායක වන බව මෙයින් පෙනීයයි.

*වගුව 12*

**රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල්**

| රක්ෂකයා | 2010 (අ) | | 2011 (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | කොටස්හිමියන්ගේ මුළු අරමුදල් රුපියල් '000 | % | කොටස් ප්‍රාග්ධනය රුපියල් '000 | මුළු සංචිතය රුපියල් '000 | කොටස්හිමියන්ගේ මුළු අරමුදල් රුපියල් '000 | % |
| AAIPLC | 1,560,860 | 3.95 | 1,062,500 | 183,131 | 1,245,631 | 2.40 |
| AIL | - | - | 503,000 | - | 503,000 | 0.97 |
| AILL | 599,255 | 1.52 | 250,000 | 430,780 | 680,780 | 1.31 |
| ALILL | 140,654 | 0.36 | 492,499 | (269,955) | 222,544 | 0.43 |
| ANDBIPLC | 2,907,477 | 7.35 | 300,000 | 3,030,326 | 3,330,326 | 6.42 |
| ATPLC | 134,508 | 0.34 | 1,250,001 | (508,662) | 741,339 | 1.43 |
| CIL | 196,157 | 0.50 | 536,669 | (321,203) | 215,466 | 0.42 |
| CILL | 428,594 | 1.08 | 500,000 | (40,061) | 459,939 | 0.89 |
| CIPLC | 7,415,916 | 18.76 | 1,324,822 | 7,428,994 | 8,753,816 | 16.87 |
| COICL | 613,963 | 1.55 | 563,409 | 225,249 | 788,658 | 1.52 |
| CTL | - | | - | - | - | - |
| HNBAPLC | 1,016,340 | 2.57 | 1,171,875 | 437,841 | 1,609,716 | 3.10 |
| JIPLC | 2,701,755 | 6.83 | 1,496,000 | 1,479,041 | 2,975,041 | 5.73 |
| LICLL | 329,700 | 0.83 | 373,000 | 62,200 | 435,200 | 0.84 |
| LOLCICL | 203,352 | 0.51 | 300,000 | (62,305) | 237,695 | 0.46 |
| MBSLICL | 140,446 | 0.37 | 779,487 | (386,756) | 392,731 | 0.75 |
| OIL | - | - | 750,000 | (16,261) | 733,739 | 1.41 |
| PIL | 219,356 | 0.55 | 550,000 | 44,593 | 594,593 | 1.15 |
| SLICL | 18,138,985 | 45.88 | 6,000,000 | 18,609,429 | 24,609,429 | 47.43 |
| SSRS | 262,395 | 0.66 | 314,215 | 55,742 | 369,957 | 0.71 |
| UAPLC | 2,524,790 | 6.39 | 388,433 | 2,601,236 | 2,989,669 | 5.76 |
| **එකතුව** | **39,534,503** | **100** | **18,905,910** | **32,983,359** | **51,889,269** | **100** |

*(අ) ප්‍රතිෂ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

**සටහන්:**

1. *අවශ්‍ය කළ සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම CTL වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් යොමු කර නොමැත.*

### රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්යසාධනය

2011 වසර තුළ දී රක්ෂණ වෙළඳපොළ තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් 46 ක් ක්‍රියාත්මක වූ අතර මෙය 2010 වසර තුළදී 42 ක් ලෙස වාර්තා විය. 2011 වසර තුළදී තැරැව්කාර සමාගම් විසින් සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර මගින් ජනනය කරන ලද මුළු දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 10,489 ක් (2010: රුපියල් මිලියන 9,560) විය. එය රක්ෂණ කර්මාන්තයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 13.36% ක් (2010: 14.42%) ලෙස වාර්තා වේ. තැරැව්කරුවන් විසින් සමස්ත කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම සඳහා ජනනය කරන ලද ප්‍රමාණයෙන් රුපියල් මිලියන 296 ක් (2010: රුපියල් මිලියන 243) දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් ජනනය වූ අතර එය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි මුළු ලිඛිත වාරික ආදායමෙන් 0.84% ක් (2010: 0.78%) විය. රුපියල් මිලියන 10,193 ක් (2010: රුපියල් මිලියන 9,317) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙන් ජනනය වූ අතර එය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායමෙන් 23.52% ක් (2010: 26.54%) ලෙස වාර්තා විය.

රුපියල් මිලියන 100 කට වැඩි දළ ලිඛිත වාරික ආදායම් දායකත්වයක් ලබාදුන් රක්ෂණ තැරැව්කාර සමාගම් 19 ක් 2011 වසර තුළදී වාර්තා වූ අතර, එම සමාගම් 19 රුපියල් මිලියන 9,825 ක දළ ලිඛිත වාරික ආදායමක් ජනනය කරන ලදී. 13 වන වගුවෙහි දැක්වෙන අන්දමට එම රක්ෂණ තැරැව්කාර සමාගම් 19 විසින් 2011 වසර සඳහා සියළු රක්ෂණ තැරැව්කාර ආයතන විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායමෙන් 93.66% ක දායකත්වයක් සැපයීය.

*වගුව 13*


**රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම- 2011**

| දළ ලිඛිත වාරික ආදායම (රුපියල් '000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | | දිගුකාලීන | | සාමාන්‍ය | | එකතුව | |
| | | රුපියල් '000 | % | රුපියල් '000 | % | රුපියල් '000 | % |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,191 | 1.75 | 240,111 | 2.36 | 245,302 | 2.34 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 991 | 0.33 | 331,115 | 3.25 | 332,106 | 3.17 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 379 | 0.13 | 407,711 | 4.00 | 408,090 | 3.89 |
| 4 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | - | - | 693,406 | 6.80 | 693,406 | 6.61 |
| 5 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 22 | 0.01 | 1,182,254 | 11.60 | 1,182,275 | 11.27 |
| 6 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 78,263 | 26.42 | 1,460,833 | 14.33 | 1,539,096 | 14.67 |
| 7 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,482 | 2.19 | 693,143 | 6.80 | 699,625 | 6.67 |
| 8 | එසාජ් කරීම්ජී ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,140 | 2.07 | 270,365 | 2.65 | 276,505 | 2.64 |
| 9 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,875 | 2.32 | 1,115,613 | 10.94 | 1,122,488 | 10.70 |
| 10 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | - | 472,998 | 4.64 | 472,998 | 4.51 |
| 11 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,852 | 0.63 | 413,142 | 4.05 | 414,994 | 3.96 |
| 12 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 8,431 | 2.85 | 605,404 | 5.94 | 613,835 | 5.85 |
| 13 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,235 | 0.42 | 147,051 | 1.44 | 148,286 | 1.41 |
| 14 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 399 | 0.13 | 617,683 | 6.06 | 618,082 | 5.89 |
| 15 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,395 | 1.15 | 151,564 | 1.49 | 154,959 | 1.48 |
| 16 | සේනාරත්න ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 11,066 | 3.74 | 241,612 | 2.37 | 252,678 | 2.41 |
| 17 | ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 825 | 0.28 | 244,950 | 2.40 | 245,775 | 2.34 |
| 18 | සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 116,863 | 39.46 | 120,953 | 1.19 | 237,816 | 2.27 |
| 19 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,020 | 0.68 | 164,304 | 1.61 | 166,324 | 1.59 |
| | **උප-එකතුව** | **250,429** | **84.55** | **9,574,213** | **93.93** | **9,824,642** | **93.66** |
| | **අනෙකුත් රක්ෂණ තැරැව්කාර සමාගමේ (27)** | **45,753** | **15.45** | **618,703** | **6.07** | **664,456** | **6.34** |
| | **මුළු එකතුව** | **296,182** | **100** | **10,192,916** | **100** | **10,489,098** | **100** |

2002 වර්ෂයේ සිට රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම රූප සටහන 13 මගින් නිරූපණය වේ.

*රූප සටහන: 13*

**රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම - 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා**




| | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දීර්ඝකාලීන රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම (රුපියල් මිලියන) | 50 | 76 | 88 | 103 | 144 | 158 | 195 | 188 | 243 | 296 |
| සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම (රුපියල් මිලියන) | 2,765 | 3,573 | 4,117 | 5,208 | 6,028 | 7,393 | 8,781 | 8,698 | 9,317 | 10,193 |
| තැරැව්කරුවන්ගේ දායකත්වය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස | 13.88 | 15.11 | 14.22 | 14.26 | 14.34 | 14.55 | 15.43 | 15.44 | 14.42 | 13.36 |

## රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

AAIPLC : ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී
AIL : ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
AILL : ඇලියෙන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
ALILL : ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
ANDBIPLC: අවීවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී
ATPLC : අමානා තකාෆුල් පීඑල්සී
CIL : චාටිස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
CILL : කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
CIPLC : සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී
COICL : කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්
CTL : සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ්
HNBAPLC : එච්එන්බී ඇෂුවරස්න් පීඑල්සී
JIPLC : ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී
LICLL : ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ්
LOLCICL : එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්
MBSLICL : එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්
NICL : නැෂනල් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්
NITF : ජාතික රක්ෂණ භාර අරමුදල
OIL : ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
PIL : පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
SLICL : ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්
SSRS : සීමාසහිත සණස රක්ෂණ සමාගම
UAPLC : යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමාලෝචනය - 2011

### රක්‍ෂණ සමාගම්

1. මණ්ඩලයට ඉදිරිපත් කරනලද වාර්තා පිළිබඳ සමාලෝචනය

**වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණන මූල්‍ය ප්‍රකාශන, සහ ජීවගණකඥ වාර්තා**

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂකයන් විසින් අදාල මූල්‍ය වර්ෂය අවසන් වී හය මසක් ඇතුලත ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණන මූල්‍ය ප්‍රකාශන මණ්ඩලයට ඉදිරිපත් කලයුතු වේ. තවද දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරවල නියුක්තව සිටින රක්‍ෂකයින් විසින් ජීවගණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්තයක්ද වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තාව සමග ඉදිරිපත් කිරීම අවශ්‍යය.

මණ්ඩලය විසින් මෙම වාර්තාවල නිරවද්‍යතාව හා පනතේ අඩංගු නියමයනට හා රෙගුලාසි වලට ඇති අනුකූලතාව ඉතා සමීප සමාලෝචනයකට ලක්කරන ලදී. ව්‍යවස්ථානුකූල අවශ්‍යතා වලින් බැහැර වු වාර්තා පිළිබඳව අදාල සමාගම් දැනුවත් කර ඒවා නිශ්චිත කාලසීමාවක් තුලදී නිවැරදි කිරීම පිණිස උපදෙස් ලබාදෙන ලදි. තවද අදාල වාර්තා පරීක්‍ෂා කිරීමේදි හඳුනාගත් සෙසු විෂමතා සමාගම් සමග පැවති රැස්වීම් වලදීත්, ක්ෂේත්‍රගත පිවිසුම් වලදීත්, අවධානයට ලක් කර අදාල රක්ෂකයින් වෙත නිවැරදි කිරීම් කලයුතු ආකාරය පිළිබඳව මගපෙන්වන ලදී.

**කාර්තුමය වාර්තා**

පනතේ විධිවිධාන ප්‍රකාරව එක් එක් කාර්තුව අවසාන වී දින 45ක් ඇතුලත සියළුම රක්ෂණ සමාගම් තමන්ගේ කාර්තුමය වාර්තා ඉදිරිපත් කල යුතුය. 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ සියළුම කාර්තුමය වාර්තා, ඔවුන්ගේ කාර්තුමය කාර්යයසාධනය සහ මූල්‍ය තත්ත්වය තක්සේරු කර ගැනිම සඳහා විමර්ශණයට ලක් කෙරිණි.

එක් එක් රක්ෂකයාගේ කාර්තුමය කාර්යයසාධනය, දිගු කාලීන හා සාමාන්‍ය යන රක්‍ෂණ ව්‍යාපාර දෙකෙහිම වාරික ආදායම, ප්‍රාරක්ෂණ ලාභය, සහ ශුද්ධ ලාභය පදනම් කොටගත් අවබෝධාත්මක විශ්ලේෂණයකට ලක් කරනුයේ සමස්ථ කර්මාන්තයේම කාර්යයසාධනය මැනබැලීම පිණිසය. අනුපාත ගණනය කොට ලාභදායිත්වය, වියදම, හා වන්දි විශ්ලේෂණය කර වසරේ සෑම කාර්තුවකදීම එක් එක් රක්‍ෂකයාගේ කාර්යයසාධනය අවබෝධ කර ගැනිම සඳහා පෙර කාර්තුවල අනුපාතයන් සමග ඒවා සසඳ බලන ලදී. කාර්තු අගදී එක් එක් රක්‍ෂකයාගේ මූල්‍ය තත්ත්වය නිරීක්‍ෂණය කරනු ලැබුයේ ඔවුන්ගේ වත්කම් වගකීම් තත්ත්වය හා ණයගැති භාවය විශ්ලේෂණය කිරීමෙනි. එසේම ඔවුන්ගේ ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිළිබඳ අනුපාත විශ්ලේෂණය කිරීමෙනි.

කාර්තුමය වාර්තා නිරීක්‍ෂණය කිරීමේදී හඳුනාගන්නා අනුකුල නොවීම්, අක්‍රමිකතා හා සාවද්‍යතා කෙරෙහි එම සමාගම් වල අවධානය යොමුකරවා, නිශ්චිත කාලසීමවක දී ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ද සපයන ලදි.

**මාසික වාර්තා**

රක්ෂකයින් තිදෙනකු විසින් ඉදිරිපත් කරන ලද මාසික වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනයට ලක් කරනු ලැබුයේ ඔවුන්ගේ මූල්‍ය තත්ත්වයත් ව්‍යාපාර කටයුතුත් වඩාත් සමීපව හා නිරතුරුව විමර්ශනය කිරීමේ අදහසිනි. මණ්ඩලයෙන් නිකුත් කරනු ලබන නියෝග අනුව එබඳු සමාගම් එක් එක් මාසය අවසානවී දින 15 ක් ඇතුලතදී ඔවුන්ගේ මාසික වාර්තා මණ්ඩලයට ලබාදිය යුතුය. අදාල වාර්තා සමාලෝචනයේදී අනුකූලතා නොවීම හෝ අක්‍රමිකතා හඳුනා ගනු ලැබුවහොත් ඒවා නියමිත කාලසීමාවක් තුලදී නිවැරදි කරන ලෙස අදාල සමාගම්වලට උපදෙස් සපයන ලදී.

2. ණය ගෙවීමේ හැකියාවේ සීමාව පිළිබඳ අනුකූලතාව අධීක්‍ෂණය කිරීම

රක්ෂණ කර්මාන්තය තුල සිදුවන්නාවූ වර්ධනයන් සැලකිල්ලට ගත් මණ්ඩලය විසින් 2011 වර්ෂයේදී දිගුකාලීන රක්‍ෂණය සඳහා වන 2002 නුබුන්වත් ආන්තික නීතිය ද සාමාන්‍ය රක්‍ෂණය සඳහා වන 2004 නුබුන්වත් ආන්තික නීතිය ද සංශෝධනයට ලක් කරන ලදි. 2011 වර්ෂයේදී සංශෝධනයට ලක් කරන ලද සාමාන්‍ය හා දිගු කාලීන රක්ෂකයන් සඳහා වන නුබුන්වත් ආන්තික නීතීන් 2011 අප්‍රේල් පළමු වනදා සිට බලාත්මක වු අතර එහි විධිවිධාන වලට අනුව සියළුම රක්‍ෂකයින් සෑම අවස්ථාවකදීම රක්‍ෂණ පංති දෙක සඳහා අවම නුබුන්වත් ආන්තික පවත්වා ගෙන යායුතුය. ඒ අනුව මණ්ඩලය නව නුබුන්වත් ආන්තික නීතියට හා නිර්ණායකයන්ට ගැළපෙන ආකාරයෙන් නව කෙටුම්පත් වාර්තා ආකෘති සියළු රක්‍ෂණ සමාගම් වෙත නිකුත් කලේය.

පෙර වසරවල මෙන් 2011 වර්ෂයේදීද මණ්ඩලය දීර්ඝ කාලීන මෙන්ම සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරවල යෙදී සිටින සියළු රක්‍ෂකයින්ගේ නුබුන්වත් ආන්තික ඉතා සියුම්ව අධීක්‍ෂණයට ලක් කලේය. සියළුම රක්‍ෂකයින් විසින් ඔවුන්ගේ මාසික/කාර්තුමය සහ වාර්ෂික ව්‍යවස්ථාමය වාර්තා සමග ගණනය කිරීම් ඉදිරිපත් කළයුතු අතර මණ්ඩලය එම ගණනය කිරීම් නුබුන්වත් ආන්තික නියමයනට අනුකුලව ගණනය කොට ඇත්දැයි විමර්ශනය කරන ලදී. අපේක්ෂිත නුබුන්වත් ආන්තික ඉෂ්ඨ කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ නුබුන්වත් ආන්තිකය ගණනය කිරීම සාවද්‍යවන්නේ නම් ඒවා නියමිත කාලසීමාවක් තුලදී නිවැරදි කරන ලෙසට අදාල සමාගම්වලට උපදෙස් ලබාදෙන ලදී.

3. රක්‍ෂණ කර්මාන්තය අධීක්‍ෂණය සඳහා වන අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතිය

2009 වසරේදි ලෝක බැංකුවේ සහ FIRST INITIATIVE ආයතනයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ රක්‍ෂණ කර්මාන්තය උදෙසා මණ්ඩලය විසින් අවදානම් සංවේදි අවම ප්‍රාග්ධන ආකෘතියක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලදි. අවදානම් සංවේදී ප්‍රාග්ධන ආකෘතියක් සැකසීමට උපදෙස් දීම සඳහා ලෝක බැංකුව සහ FIRST INITIATIVE ආයතනය විසින් Deloitte Touche Tohmatsu India (Pvt) Ltd. සමාගම පත්කරන ලදි. මෙම ව්‍යාපෘතිය තුලින් මණ්ඩලය සිය අධීක්‍ෂණ ක්‍රියාවලිය වඩාත් උසස් කිරීමත්, වෙළඳපල හවුල්කාරයින්ට ඔවුන්ගේ ව්‍යාපාරවල ඇති ව්‍යාපාර අවදානම ඵලදායි ලෙස කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය හැකියාවන් ලබාදිමත්

අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතිය සැපයීමෙන් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියර ලෙස ශ්‍රී ලංකාවේ රක්‍ෂණ වෙළඳපොල පිළිබඳ හැදෑරීමක් කිරීමත් අදාල ගැටළු හඳුනා ගැනීමත් සඳහා වන වෙළඳපොල විශ්ලේෂණ අධ්‍යයන වාර්තාව 2010 දී අවසන් කරන ලදී. තවදුරටත් මෙම වාර්තාව රක්‍ෂණ කර්මාන්තය කෙරෙහි බලපෑම් කරන්නාවූ හෝ අනාගතයේ බලපෑම්කරන්නට ඉඩ ඇති වර්ධන සාධක සහ සීමා කිරීම් හෙළිදරව් කිරීමට සමත්විය.

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වන ගුණාත්මක වාර්තාව 2011 පෙබරවාරියේදී රක්ෂණ කර්මාන්තය වෙත ඉදිරිපත් කෙරිණි. එමගින් අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතියට අදාල පුළුල් මූලධර්ම හා ව්‍යුහය යෝජනා කරන ලදී. මෙම ගුණාත්මක වාර්තාවේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ රක්‍ෂණ ක්ෂේත්‍රයේ සුවිශේෂ ව්‍යුහයට ගැලපෙන්නාවූ අවදානම් සාධක හඳුනාගැනීමත් එවා පැහැදිලි කිරීමත්ය.

ප්‍රමාණාත්මක වාර්තාව රක්‍ෂණ කර්මාන්තය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2011 ඔක්තෝම්බර් මාසයේදීය. එය ගුණාත්මක වාර්තාව විසින් නිර්දේශ කරන ලද විවිධ අවදානම් කාණ්ඩ සඳහා වන ප්‍රාග්ධන අයකිරීම් සුදුසු අන්දමින් හඳුනාගැනීමත් යෝග්‍ය පරිදි ප්‍රමාණාත්මක කිරීමත් කලේය. රක්ෂකයින්ගේ වගකීම් හා වත්කම් හා වත්කම් තක්සේරු කිරීමේ ක්‍රමවේදයන්හි ඇතිවන වෙනස්වීම්ද මෙම වාර්තාව විසින් හෙළිදරව් කරන ලදී. ලෝක බැංකුවෙන් පැමිණි ව්‍යාපෘති ප්‍රධානියාද ඩිලොයිට් ඉන්දියා සමාගම් උපදේශකයින්ද, රක්‍ෂකයින්ගේ නියෝජිතයින්ද බාහිර විගණන නිලධාරීන්ද, ජීවගණකඥයින් සහ මණ්ඩලයේ කාර්යයමණ්ඩලයේ ද
සහභාගිත්වය ඇතිව ප්‍රමාණාත්මක වාර්තාව රක්‍ෂණ කර්මාන්තයට හඳුන්වාදීම සඳහා වු පිරිනැම්මේ හමුවක් මණ්ඩලය විසින් සංවිධානය කරනලදී. මෙහිදී ඉහත සඳහන් වාර්තා දෙකම සම්බන්ධයෙන් තම තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාවක්ද සහභාගී වූවන්ට ලබාදෙන ලදි. රෙගුලාසි කෙටුම්පත් කිරීම, රක්‍ෂණ මණ්ඩලයේ කාර්යයමණ්ඩලට පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහ 2012 දී දියත් කිරීමට නියමිත එහි පෙරහුරු පරීක්‍ෂණ (road test) සම්බන්ධයෙන් අවසන් නිගමනයකට පැමිණීම උදෙසා ලෝක බැංකු ව්‍යාපෘති උපදේශකයින් සමග මේ වන විට සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

## 4. නව බලපත්‍ර ලබාදීම

2011 වසරේදී සීමාසහිත ඔරියන්ට් ඉන්ෂුවරන්ස් සහ සීමාසහිත ආර්පිකෝ ඉන්ෂුවරන්ස් යන සමාගම්, රක්‍ෂකයින් වශයෙන් ලියාපදිංචි කිරිමට පෙරාතුව ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය පිළිබඳව මණ්ඩලය විසින් තක්සේරුවක් කරනලදී. එකී සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ලිපිලේඛණ, එනම් සවිස්තරාත්මක ව්‍යාපාර සැලැස්ම සහ සංවිධානමය ව්‍යුහය, පුරෝකතනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ඔවුන්ගේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සනාථ කිරිම සදහා සමාගම්වල බාහිර විගණක නිලධාරින් විසින් නිකුත්කරන ලද සහතික, ප්‍රතිරක්‍ෂණ හා ඔවුන්ගේ මූල්‍ය ශක්ති අනුපාත, ණය අනුපාත විස්තර, යනාදිය මණ්ඩලයේ දැඩි විමර්ශනයට ලක් කරන ලදී. අනතුරුව, ඔවුන් විසින් මණ්ඩලයේ අපේක්‍ෂිත අවශ්‍යතා සම්පූර්ණකොට තිබු බැවින්, සීමාසහිත ඔරියන්ට් ඉන්ෂුවරන්ස් සහ සීමාසහිත ආර්පිකෝ ඉන්ෂුවරන්ස් යන සමාගම් වෙත ලියාපදිංචිය පිරිනමන ලදි.

## 5. නිශ්චිත ආයෝජනවල අනුකූලතාව අධීක්‍ෂණය කිරීම

**රජයේ සුරැකුම්පත් හි ආයෝජනය කිරිම**

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 25වන පරිච්ඡේදයට අනුව සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර සඳහා වු තාක්‍ෂණික සංචිත වත්කම් වලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලින රක්‍ෂණ ව්‍යාපාර සඳහා වු දිගු කාලින රක්‍ෂණ අරමුදල් වත්කම්වලින් 30% කට නොඅඩු ප්‍රමාණයක් රක්‍ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජන ලෙස පවත්වාගෙන යා යුතු වේ. මණ්ඩලය විසින් සියළුම රක්‍ෂකයින්ගේ 2011 වර්ෂයේ සෑම කාර්තුවකම, මාසික අධීක්‍ෂණයට යටත්වු රක්‍ෂකයින් මාසිකවත්, වාර වාර්තා විමර්ශණයට ලක්කරමින් ඉහතකී රෙගුලාසි වලට ඔවුන්ගේ ඇති අනුකූලතා අධීක්‍ෂණය කරන ලදි. එසේම, ඔවුන්ගේ වාර්තාවල සඳහන් රාජ්‍ය සුරැකුම්හි කරන ලද ආයෝජනයන්ගේ නිරවද්‍යතාවත්, එම ආයෝජනයන්හි අයිතිය හා හිමිකාරත්‍වයත් සහතික කරගැනීම වස් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරනු ලබන තැන්පතු පිළිබඳ ප්‍රකාශ මණ්ඩලය විසින් විමර්ශණයට ලක්කෙරින. රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනයේ විෂමතා දක්නට ලැබුණු කල්හි එවා නිවැරදි කරනු පිණිස අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී.

**නිර්ණයන් අනුව කෙරෙන වෙනත් ආයෝජන**

සියළුම රක්‍ෂකයින් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංතයන්හි ශේෂව තිබෙන වත්කම් හා ඔවුන්ගේ දීගුකාලීන රක්‍ෂණ අරමුදලෙහි ශේෂව තිබෙන වත්කම් පනත යටතේ ප්‍රකාශයට පත්කොට ඇති 2011 මාර්තු 01 දින දරණ නිර්ණය කිරිම් අංක 1 (2011 ඔක්තෝම්බර් 20 දින සංශෝධිත) ට අනුව ආයෝජනය කිරිම අවශ්‍යය වේ. රක්‍ෂණ සමාගම් විසින් කරනලද ආයෝජනයන් නිර්ණය කිරීම් අංක 1 ට අනුකූලව පවතීදැයි මණ්ඩලය විසින් අධීක්‍ෂණය කොට, නිර්ණය කිරීම් වලින් බැහැරව ක්‍රියාකල අවස්ථා නිවැරදි කරන ලෙස අදාල සමාගම්වලට උපදෙස් දෙන ලදී.

## 6. ක්ෂේත්‍රගත (on-site) විමර්ශන

2011 වසර තුලදී මණ්ඩලය විසින් රක්‍ෂණ සමාගම් තුනක කරන ලද ක්ෂේත්‍රගත විමර්ශන වලදී ඔවුන්ගේ මෙහෙයුම්, පද්ධතීන්, ප්‍රතිපත්ති හා පටිපාටින් අධීක්‍ෂණය කොට පනතේ වගන්තීන් වලට එවායේ ඇති අනුකූලතාව තහවුරු කරගන්නා ලදී. තවදුරටත් වැඩිදියුණු කලයුතු අංශ පිළිබඳව අවශ්‍ය නිර්දේශයන් මෙම ක්ෂේත්‍රගත විමර්ශන වාර්තා මගින් ඉදිරිපත් කරන ලදි. සංවිධාන ව්‍යුහය හා හිමිකම, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමණාකරණ ව්‍යුහය, අලෙවිකරණය හා බෙදාහැරිම, වන්දි පරිපාලනය, අවදානම් කළමණාකරණ ක්‍රියාවලිය, යනාදී රක්ෂකයින් හා බැඳුණු විවිධ තොරතුරු දැනුම් දීම සඳහා වාර්ෂිකව මණ්ඩලය වෙත රක්‍ෂකයින් විසින් ඉදිරිපත් කෙරෙන අවදානම් තක්සේරු සංක්ෂිප්ත වාර්තාද මෙහිදී මණ්ඩලය විසින් සමාලෝචනයට ලක්කෙරිණ.

### 7. සමාගම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම

2011 වසරේ සෑම කාර්තුවකදීම මණ්ඩලය විසින් රක්‍ෂණ කර්මාන්තයේ කාර්යයසාධනය හඳුනාගැනීම සඳහා රක්‍ෂකයින්ගේ වාරික ආදායම්, ලාභදායීත්වය, ද්‍රවශීලතාවය, ප්‍රාග්ධනය, රඳවාගැනීම් යනාදිය පිළිබඳව විශ්ලේෂණයක් කරන ලදී. රක්‍ෂණ කර්මාන්තයේ සමස්ථ කාර්යයසාධනය අවබෝධ කරගැනීම සඳහා රක්‍ෂකයින් වෙතින් ලබාගත් තොරතුරු පදනම් කොටගෙන අනුපාතයන් ගණනය කරනලදී. රක්‍ෂණ සමාගම් වල මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු කාර්තුමය පදනමින් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

### 8. ප්‍රතිරක්‍ෂණ ක්‍රියාපටිපාටි සමාලෝචනය

පනතේ විධිවිධාන වලට අනුකූලව තම තමන්ගේ ප්‍රතිරක්‍ෂණ ගිවිසුම්, කොන්ත්‍රාත්තු හා ක්‍රියාපටිපාටීන්හි සහතික කරන ලද පිටපත් සෑම රක්‍ෂකයකු විසින්ම වාර්ෂිකව මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. ඔවුන්ගේ අවදානම් අවම කරගැනීමට ප්‍රමාණවත් තරමින් ප්‍රතිරක්‍ෂකයින් වෙතින් ප්‍රතිරක්‍ෂණාවරණ ලබාගෙන ඇතිදැයි තහවුරු කරගැනීම පිණිස මණ්ඩලය විසින් එම ලියකියවිලි පරීක්‍ෂා කරනු ලැබීය. රක්‍ෂකයින් විවිධ ප්‍රතිරක්‍ෂකයින් සමග ප්‍රතිරක්‍ෂණ ක්‍රියාපටිපාටියකට ඇතුළුවන විට ආදාල රක්‍ෂණ සමාගම් පනතේ 3(1) වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත්කරනු ලැබ ඇති මාර්ගෝපදේශ අනුගමනය කලයුතුය.

### 9. චක්‍රලේඛ අංක 18 ප්‍රකාරව වාර්ෂික අනුකූලතා සහතිකය ඉදිරිපත් කිරීම

සෑම වසරකම පෙබරවාරි හා අගෝස්තු 15 වන දිනට හෝ ඊට පෙර අර්ධවාර්ෂික පදනමින් තම තමන්ගේ අර්ධ වාර්ෂික අනුකූලතා සහතිකය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සෑම රක්‍ෂකයකුම වගබලාගත යුතුය. පනතෙහි සියළු නෛතික හා නියාමන විධිවිධානවලට අනුකූලව සියලු රක්‍ෂකයින් කටයුතු කරන බවට තහවුරු කරගැනීම් වස් ඔවුන් විසින් 2011 වසරේදී මණ්ඩලය වෙත ඉදිරිපත්කරන ලද අනුකූලතා සහතික සමාලෝචනයට ලක්කරන ලදී. මෙහිදී ඔවුන් අනුමැතියලත් ප්‍රතිරක්‍ෂකයින් සමග ගිවිසුම් සහ අවබෝධාත්මක ප්‍රතිරක්‍ෂණ ක්‍රියාපටිපාටීන්වලට ඇතුලත්වීමේදී මණ්ඩලයේ මාර්ගෝපදේශ අනුගමනය කරන බවත්, නුඹුන්වත් ආන්තික නියමයනට අනුකූලවන බවටත්, සාමාන්‍ය රක්‍ෂණ ඔප්පු වාරික ගෙවීම් සහතික වලට අනුකූලවන බවටත්, මණ්ඩලය විසින් වගබලා ගැනේ.

## රක්‍ෂණ තැරව්කරුවෝ

### 1. කාර්තුමය වාර්තා අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

රක්‍ෂණ තැරව්කරුවන් විසින් ඉදිරිපත් කෙරෙන කාර්තුමය වාර්තා, අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම ඉතා වැදගත් ක්‍රියාදාමයකි. 2010 පෙබරවාරි 25 දින දරණ අංක 1642/16 ගැසට් නිවේදනයේ (පළමු උපලේඛණය) වගන්ති ප්‍රකාරව සියළුම රක්‍ෂණ තැරව්කරුවන් ඔවුන්ගේ කාර්තුමය වාර්තා ඉදිරිපත් කලයුතු අතර එක් එක් කාර්තුව අවසන්වී දින 45ක් ඇතුලතදී ඔවුන්ගේ අන්තර්වාර මූල්‍ය ප්‍රකාශනයද ඉදිරිපත් කල යුතුය. 2011 වසර තුලදී සියළු රක්‍ෂණ තැරව්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කොට එම සමාලෝචනයේදී හඳුනාගත් අක්‍රමිකතා (උදාහරණ ලෙස අසම්පූර්ණ අංශයන්, වැරදි සහගත ගණනය කිරීම්, වෙනස්වූ ආකෘතීන් යනාදිය) අදාල රක්‍ෂණ තැරව්කරුවන්ගේ අවධානයට යොමුකොට නිවැරදි කරවන ලදී.

රක්‍ෂණ තැරව්කරුවන් සිය මූල්‍ය වර්ෂය අවසන්ව සය මසක් ඇතුලත ඔවුන්ගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. වර්ෂය තුල රක්‍ෂණ තැරව්කරුවන්ගේ කාර්යයසාධනය මූල්‍ය තත්‍වයත් අවබෝධ කරගැනීම පිණිස එම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී.

### 2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.

පනතේ 89 වන පරිච්ඡේදයට අනුව රක්‍ෂකයන් වෙනුවෙන් රක්‍ෂණ තැරව්කරුවන් විසින් එකතු කරනු ලබන වාරික, එකතුකොට දෙසතියක කාලය ඇතුලත ඒ ආදාල රක්‍ෂකයාවෙත ප්‍රේෂණය කලයුතුය. මෙම විධිවිධානවලට තැරව්කරුවන්ගේ ඇති අනුකූලතාව මණ්ඩලය විසින් කාර්තුමය වාර්තා හරහාත් ක්‍ෂේත්‍රගත නිරීක්‍ෂණ තුලිනුත් අධීක්‍ෂණය කරන ලදි. ඉහත විධිවිධානය හා අනනුකූලතාවය නොදැක්වූ රක්‍ෂණ තැරව්කරුවන්ට එරෙහිව අවශ්‍ය පියවර ගනුලැබිණි.

### 3. ක්‍ෂේත්‍රගත විමර්ශන

මණ්ඩලයේ නීති රීතීන්ට අනුකූල ආකාරයෙන් රක්‍ෂණ තැරව් ව්‍යාපාරය ක්‍රියාත්මක කරන්නේද යන්න තහවුරු කර ගැනීම් වස් 2011 වසරේදී මණ්ඩලය රක්‍ෂණ තැරව්කරුවන් දොළොස් දෙනෙකුගේ පරිශ්‍රයන් තුලදීම ක්‍ෂේත්‍රගත විමර්ශනවල යෙදුනේය. මෙම ක්‍ෂේත්‍රගත විමර්ශනවලදී හඳුනාගත් අනුකූලතාවයෙන් බැහැරවුනු අවස්ථා නිශ්චිත කාලසීමාවක් තුලදී නිවැරදි කිරීමේ උපදෙස් මණ්ඩලය විසින් ඔවුන් වෙත සපයන ලදි.

### 4. බලපත්‍ර අළුත්කිරීම

රක්‍ෂණ තැරව්කරුවන්ගේ බලපත්‍ර 2012 වසර සඳහා අළුත්කිරීම සඳහා මණ්ඩලය කාර්තුමය වාර්තා හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඇගයීමට ලක්කොට ඔවුන්ගේ මූල්‍යමය තත්ත්වය තහවුරු කරගන්නා ලදී.

### 5. නව බලපත්‍ර ලබාදීම

ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලද නව රක්‍ෂණ තැරැව්කරුවන් එකොලොස් දෙනකුගේ ව්‍යාපාර සැලසුම්, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශුද්ධ ප්‍රාග්ධන තත්ත්වය යනාදිය මණ්ඩලය විසින් මෙම වසර තුලදී සමාලෝචනය කොට ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය තක්සේරු කර ගන්නා ලදි. අනතුරුව මණ්ඩලය විසින් අපේක්ෂිත අවශ්‍යතා සම්පූර්ණ කොට තිබූ රක්‍ෂණ තැරව්කරුවන් පස්දෙනකුට ලියාපදිංචිය ලබා දීම සිදුකරන ලදී.

## නියාමන සමාලෝචනය

### රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු හා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා සීමාසහිත ආර්පිකෝ රක්ෂණ සමාගමට සහ සීමාසහිත ඔරියන්ට් රක්ෂණ සමාගමට මෙම වසරතුලදී මණ්ඩලය විසින් ලියාපදිංචිය ලබාදෙන ලදී.

ඒ අනුව 2010 සිට 2011 වනවිට ලියාපදිංචිය ලැබූ රක්ෂකයන්ගේ සංඛ්‍යාව 20 සිට 22 දක්වා ඉහල ගියේය.

ඇමුණුම 1: මණ්ඩලය මගින් ලියාපදිංචි කරන ලද සියළු රක්ෂණ සමාගම්වල නාමලේඛණය හා ඔවුනට ක්‍රියාකිරීමට අවසර ලබාදී ඇති රක්ෂණ ව්‍යාපාර පන්ති.

### නව රක්ෂණ තැරව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම

මෙම වසර තුලදී රක්ෂණ තැරව්කරුවන් වශයෙන් ලියාපදිංචිවීම සඳහා සමාගම් 11ක් ඉල්ලුම්කොට තිබුණි. මණ්ඩලය ඉන් සමාගම් 5කට ලියාපදිංචිය ලබාදුනි. ඉන් සමාගම් දෙකක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරව් ව්‍යාපාර කටයුතුවල නියැලීමට ලියාපදිංචිය ලැබූ අතර අනෙක් සමාගම් තුන සාමාන්‍ය රක්ෂණ තැරව්කාර ව්‍යාපාර කටයුතු කරගෙනයාමට ලියාපදිංචිය ලැබූවෝය.

2012 වසරට ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරව්කාර සමාගම් 41කින් ඉල්ලීම් ලැබුණු අතර, ඉන් පනතේ අවශ්‍යතා සම්පූර්ණ තර තිබූ සමාගම් 40ක ලියාපදිංචිය අළුත් කිරීමට පියවර ගන්නා ලදී.

2011 දෙසැම්බර් 31 දිනට කලින් පනතේ 80 වැනි වගන්තියේ, 2 වන උප වගන්තියට අනුකූලවන්නට අසමත්වූ බැවින් 2012 ජනවාරි 1 වනදා සිට බලපැවැත්වෙන පරිදි වොලන්කා ඉන්ෂුවරන්ස් සර්විසස් (පුද්) සමාගමට රක්ෂණ තැරව්කරුවකු වශයෙන් ක්‍රියාකිරීම තහනම් කරන ලදි. එකී වගන්තිය ප්‍රකාරව (i) රක්ෂණ තැරව්කරුවකු රක්ෂකයකුගේ කොටස් හිමිකරුවකු වීම හෝ (ii) රක්ෂණ තැරව්කරුවකුගේ, අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධාරියා හෝ රක්ෂණ තැරව්කරුවකුගේ උප සමාගමක, හවුල්කාර සමාගමක හෝ පාලිත සමාගමක අධ්‍යක්ෂකවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියා, රක්ෂකයෙකුගේ අධ්‍යක්ෂවරයකු, කොටස් හිමියකු හෝ සේවකයකු වීම තහනමට ලක්කරයි.

ඇමුණුම II: මණ්ඩලයේ ලියාපදිංචි සියළු රක්ෂණ තැරව්කාර සමාගම් වල නාමලේඛණය හා ඔවුනට ක්‍රියාකරීමට අවසර දී ඇති රක්ෂණ තැරව්කාර පන්ති/ පන්තිය

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

**අත්හිටුවීම්**

මේ වසර තුලදී මණ්ඩලය විසින් කිසිදු නව අත්හිටුවීමක් පනවා නැත. එහෙත් සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත පනවා ඇති අත්හිටුවීම තවදුරටත් ක්‍රියාත්මකව පවතී.

**විධාන**

පනතේ 57 වන වගන්තියට අනුව මණ්ඩලය විසින්, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි ද්‍රවශීලතා තත්‍වය සම්බන්ධයෙන් සමාගම් බාහිර විගනන නිලධාරියාගේ සහතිකය හා ජීවගණකඥයාගේ සහතිකය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මෙන් දන්වා එක් රක්ෂණ සමාගමකට විධානයක් නිකුත් කරන ලදී.

තවද එක්තරා රක්ෂණ සමාගමක ව්‍යාපාර කටයුතු ඇරඹූ මාසයේ සිට, ආදායම් හා වියදම් ප්‍රකාශයේ ප්‍රක්ෂේපිත හා සැබෑ ප්‍රතිඵලවල සැසඳුමක් මාසිකව ඉදිරිපත්කලයුතු බව දන්වා විධානයක් නිකුත් කරන ලදී.

මහජනතාවට හෝ ජාතික වශයෙන් හෝ ඔප්පු හිමියන්ගේ හෝ අයිතිවාසිකම්වලට හෝ හානිදායකවන්නාවූ ආකාරයකින් කිසියම් රක්ෂකයකු කටයුතු කරන්නේ නම් ඔවුනට විධාන නිකුත් කරන්නට පනතේ 57 වන වගන්තියෙන් මණ්ඩලයට බලය පැවරේ.

ඉහත සඳහන් කරුණුවලට අමතරව, රක්ෂණ සමාගම්වලට මින්පෙර නිකුත්කොට ඇති විධානයන්ට අනුව එවා කටයුතු කරන්නේද යන්න විමර්ශනය කිරීම මණ්ඩලය විසින් නිරන්තරයෙන් හා දැඩිව කරනු ලැබේ.

### රක්ෂණ තැරව්කාර සමාගම්

**අවවාද කිරීම්**

පනතේ 89 වන වගන්තියට අනුකූලව ක්‍රියාකරන්නට අසමත් වූ රක්ෂණ තැරව්කාර සමාගමකට පනතේ 84(1) (ඇ) වගන්තිය යටතේ මණ්ඩලය විසින් අවවාද ලිපියක් යවා ඇත.

රක්ෂණ සමාගම් වෙනුවෙන් රක්ෂණ තැරව්කාර සමාගම් විසින් එකතු කරනු ලබන වාරික මුදල් එසේ එකතු කිරීමෙන් සති දෙකක් ඇතුලතදී අදාල රක්ෂණ සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබීමේ අවශ්‍යතාව 89 වන වගන්තියේ වෙනත් කරුනු අතර දක්වා ඇත.

පනතේ 84(1) (ඇ) වගන්තිය අනුව යම්කිසි තැරව්කාර සමාගමකට මණ්ඩලය විසින් යටත් පිරිසෙයින් වෙන් වෙන් අවස්ථා තුනකදී අවවාද කරනු ලැබ තිබේනම් එම සමාගමේ ලියාපදිංචිය අත්හිටුවීම, අවලංගු කිරීම හෝ ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා බලය මණ්ඩලය සතුවේ.

## නියාමන/උපදේශනාත්මක ක්‍රියාමාර්ග

1. රක්ෂණ තැරව්කරුවෙකුගේ පාලිත සමාගමක ප්‍රධාන විධායක නිලධාරියා, හෝ අධ්‍යක්ෂවරයකු, රක්ෂකයකුගේ අධ්‍යක්ෂවරයකු, කොටස් හිමියකු හෝ සේවකයකු වීම, සංශෝධිත පනතේ 84(1) (ඇ)(ii) වගන්තියට අනුව තහනම් වේ. සංශෝධිත පනතේ (2011 අංක 03 දරණ) 51 වන වගන්තිය ප්‍රකාර ලියාපදිංචි රක්ෂණ තැරව්කරුවකුගේ පාලිත සමාගමක අධ්‍යක්ෂකවරයකු හෝ ප්‍රධාන විධායක නිලධාරියකු වන අයෙක් රක්ෂකයකුගේද අධ්‍යක්ෂකවරයකු, කොටස් හිමියෙකු හෝ සේවකයකුව සිටින අවස්ථාවක, එම හිමිකම් දරණ කොටස් හෝ අධ්‍යක්ෂ ධූර, හෝ සේවය, එයට අදාල පරිදි අත්හැරීම සඳහා සාධාරණ කාලයක් ලෙස 2011 අගෝස්තු 12දා සිට මාස තුනක කාලයක් ඉඩදීමට මණ්ඩලය තීරණය කොට ඇත. බොහෝ ඉල්ලීම් හේතුවෙන් එකී කාලච්ඡේදය මණ්ඩලය විසින් 2011 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

2. 2010 ජුනි 9 වන දින ඇති 1929 (2010) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සම්මුතියද ඇතුළුව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් ඉස්ලාමීය ඉරාන ජනරජය මත පනවන ලද සම්බාධක හා සම්බන්ධ ලිපිලේඛණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත යොමු කර ඇත. ඉහත කී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල සම්මුතියේ 21 වන ව්‍යවස්ථාව රක්ෂණ ව්‍යාපාරය හා සෘජුවම බැඳීමක් දක්වන බැව් පෙනීගොස් ඇත.

   එබැවින් මණ්ඩලය විසින් එම සම්බාධක පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ සංගමය වෙත දැනුම් දෙනු ලැබුයේ එහි සාමාජික සමාගම් විසින් අනුකූලතාව දැක්වීම සඳහාය.

3. ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් මණ්ඩලයේ අවධානය යොමුකොට ඇත. ලිපිලේඛණවලින් පෙනි යන පරිදි එම සමාගම රක්ෂණ/ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතු වල යෙදීමට අදහස් කරන බැව් විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. එම සමාගම විදේශ මුදල් ගිණුමක් විවෘත කිරීම සඳහා විනිමය පාලකවරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. පනතෙහි ඒ සම්බන්ධ නෛතික විධිවිධානයන් විමසා බැලීමේදී, ඉහත කී සමාගමේ යෝජිත ව්‍යාපාර කටයුතු පනතේ විෂය පථයට අයත් නොවන බැව් පෙනිගිය අතර ඒ බැව් විනිමය පාලකවරයාට දන්වා යවන ලදි.

4. එක් රක්ෂණ සමාගමක්, දුරකථන සමාගම්, බැංකු, මුදල් සම්ප්‍රේෂණ නියෝජිතයන් වැනි වෙනත් ආයතන සමග හවුල්වී ගෙවීම් එකතු කරන්නට / හෝ ඔවුන්ගේ පාරිභෝගිකයින්ට ඒවායේ ශාඛා ඔස්සේ මුදල් ගෙවීමට අනුමැතිය ඉල්ලා සිටියේ ඔවුන්ගේ ශාඛා කරා පැමිණෙන ජන සංඛ්‍යාව වැඩි කර ගැනීමෙන් දැනට ඔවුන් සතු රක්ෂණ ව්‍යාපාර කටයුතු පුළුල් කරගැනිමේ අපේක්ෂාවෙනි. එකී යෝජනාව පනතේ 12(4) වගන්තිය යටතට නොවැටෙන බැවින් එබඳු අනුමැතියක් ලබාදිය නොහැකි බැව් ඔවුන් වෙත දන්වා යවන ලදි.

   පනතෙහි 12(4) වගන්තියට අනුව පනත යටතේ ලියාපදිංචිය ලත් කිසිදු පුද්ගලයකු රක්ෂණ ව්‍යාපාර කටයුතු හැර වෙනත් කිසිදු ආකාරයක ව්‍යාපාර කටයුත්තක නොයෙදිය යුතුය. එසේ වුවද, මණ්ඩලයෙන් ලබාගත් පූර්ව ලිඛිත අනුමැතියක් ඇත්නම් රක්ෂකයකුට පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති රක්ෂණ ව්‍යාපාර කටයුතු හා බැඳුණු හෝ එයට අධාරක වන්නාවූ මූල්‍ය සේවා ව්‍යාපාරයක යෙදීමට අවකාශ ලැබේ.

5. ජාත්‍යන්තර සාමුද්‍රික සංවිධානය විසින් හඳුනාගෙන නම්කරන ලද ඉහල අවදානම් සහිත ප්‍රදේශවල යාත්‍රාකරන වෙළඳ නෞකා සඳහා අවදානම් අවම කරගැනීමේ ක්‍රමෝපායන් සපයන සමාගමක්, පැහැරගැනීම් හා කප්පම් සිද්ධීන් ආවරණය කෙරෙන රක්ෂණයක් විදේශ රක්ෂකයකුගෙන් ලබාගන්නට මණ්ඩලයෙන් අවසර පැතුවේ එවැනි රක්ෂාවරණයක් කිසිදු දේශිය රක්ෂණ සමාගමක් නොසපයන බැවිනි. එම කරුණු ගැන සලකා බැලූ මණ්ඩලය පනතේ 101(2) වගන්තියේ විධිවිධානයන්ට අනුව එම සමාගමට එවැනි ආවරණයක් අවුරුදු දෙකක කාලයක් සඳහා විදේශ රක්ෂකයකුගෙන් ලබාගැනීමට අවසර දීමට තීරණය කලේය.

   විදේශ රක්ෂකයින් සමග රක්ෂණ ව්‍යාපාර කටයුතු වල යෙදීම සඳහා කෙරෙන ඕනෑම ඉල්ලිමකට අනුමැතිය ලබා දීමේදී මණ්ඩලය පනතේ 101(2) වගන්තියට අනුව යමින් ජාතික අවශ්‍යතා හා රක්ෂණ කර්මාන්තය සම්බන්ධව රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගනී.

6. එක්තරා රක්ෂණ සමාගමක් එහි (Unit Linked Funds) ඒකක දාම අරමුදල් එතෙර ආයෝජනවල යෙදවීම සඳහා විමසීමක් කලේය. නිශ්චය අංක 1 ට අනුව ඕනෑම විදේශ රජයක් විසින් හෝ ඕනෑම විදේශ රටක මහ බැංකුවක් විසින් නිකුත්කරන ලද හෝ පූණී වගකීමක් දරණ ණය සුරැකුම් හා තාක්ෂණ සංචිතයන් හෝ දීර්ඝකාලීන රක්ෂණ අරමුදල්වලින් කෙරෙන ආයෝජන ශ්‍රී ලංකාව තුලට පමණක් සීමාවන බැව් මණ්ඩලය ඔවුනට දැනුම් දුන්නේය. තවදුරටත් 2005 ඔක්තෝම්බර් 12 දින අංක 1414/19 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද රක්ෂණ මණ්ඩලයේ රෙගුලාසි වල 4වන රෙගුලාසිය සමග කියවිය යුතු පනතේ 25(3) වගන්තියට අනුව, මණ්ඩලයෙන් ලබා ගන්නා ලද විශේෂිත අනුමැතියක් ඇත්නම්, දිගුකාලීන රක්ෂණ අරමුදල් යටතට නොවැටෙන (Unit Linked Funds) ඕනෑම වත්කමක් එතෙර වත්කම්හි ආයෝජනය කළ හැක.

7. එක්තරා ගිණුම් සමාගමක්, ඔවුන්ගේ වෘත්තීය වන්දි රක්ෂණාවරණ (indemnity) විදේශ රක්‍ෂකයකුගෙන් ලබාගැනීම සඳහා ඉල්ලීමක් කළේය. මෙය එම ආයතනයේ මව් සමාගම විසින් ලෝකය පුරා පිහිටි එහි ශාඛා ආයතන සියල්ල සඳහා සැලසුම් කොට තිබුණකි. ආයතනයේ ගෝලීය සැලැස්ම අවබෝධ කරගත් මණ්ඩලය එම සමාගමේ ශ්‍රී ලංකා මෙහෙයුම් කටයුතු වලට අදාළ වෘත්තීය වන්දි රක්ෂණාවරණය සම්බන්ධයෙන් පනතෙහි 101(2) වගන්තිය යටතේ, විදේශ රක්‍ෂකයකුට රක්‍ෂණ වාරික ප්‍රේෂණය කරන්නට අනුමැතිය ලබාදුන්නේය.

8. රටවල් කීපයකම පිහිටි සිය උප සමාගම් හා එක්ව අවදානම් කළමනාකරණය උපක්‍රම වලින් දිරිගැන්වී ගෝලීය රක්‍ෂණ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම සඳහා එක්තරා කාලාපීය විදුලි සංදේශ නියාමකයකු පිළිගෙන නොමැති සියලුම ගෝලීය රක්ෂණාවරණ වලට සෘජුවම දායකම සඳහා මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය. පනතේ 101(2) වගන්තිය අනුව සමූහ රක්‍ෂණ ආවරණ සැලසුම් යටතේ රක්‍ෂණ ආවරණ ලබාගැනීමට වෙනත් සමාගම්වලට මණ්ඩලය විසින් මීට ඉහතදී අනුමැතිය ලබාදී තිබුණ බැවින් ඒ සඳහා පනතේ 101(2) වගන්තිය ප්‍රකාර අනුමැතිය ලබාදුන්නේය. එම අනුමැතිය වලංගු වන්නේ කාලාපීය විදුලි සංදේශ නියාමකයා දේශීය පාර්ශවයේ පාලිත සමාගම වශයෙන් කටයුතු කරන තෙක් පමණි යන කොන්දේසියට යටත්වය.

9. මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නම්කරනු ලැබූ මණ්ඩලයේ සේවය නියුක්තව සිටි මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු, එම නිලය දැරීමේ හේතුවෙන් 2011 අංක 03 දරණ සංශෝධිත පනතේ 31 A වගන්තියෙන් හඳුන්වා දෙනලද නිර්නායක යටතේ නුසුදුස්සකු වී රක්‍ෂකයකුගේ අධ්‍යක්‍ෂකවරයකු වීම තහනමට ලක්වීමට ඉඩක් තිබේදැයි එක්තරා රක්‍ෂණ සමාගමක් විසින් පැහැදිලිකිරීමක් ඉල්ලා, සිටින ලදී. දෙවන උපලේඛනයේ (ආ) වගන්තියත් සමග කියවිය යුතු පනතේ 31 A වගන්තියට අනුව එබඳු රක්‍ෂකයකුගේ අධ්‍යක්‍ෂධූරයට තෝරාගැනීමට, නම්කිරීමට, හෝ පත්කිරීමට පෙර වසර තුනක කාලයක් තුළ කිසියම් අවස්ථාවකදී මණ්ඩලයේ සාමාජිකයකු හෝ සේවකයකු වශයෙන් සේවා කොට ඇත්තේනම් එම තැනැත්තා රක්‍ෂකයකුගේ අධ්‍යක්‍ෂ තනතුරකට පත්කිරීමට, තෝරා පත්කිරීමට හෝ නම් කිරීමට සුදුසු නොවන්නේය. මෙකී තත්වය එම රක්‍ෂකයා වෙත දැනුම් දෙන ලදී.

10. ඉස්ලාමීය ෂරියා ප්‍රතිපත්තිවලට අනුව වෙනම Takaful Window තම සමාගම තුළ ආරම්භ කිරීම සඳහා එක්තරා රක්‍ෂණ සමාගමක් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය. පනත යටතේ පනවා ඇති අවශ්‍යතා ඉෂ්ට කිරීමේදී අපහසුතා පැන නැගීමට ඉඩඇති බැවින් අනෙකුත් මෙහෙයුම් වලින් වෙන්කොට වෙනම Takaful මෙහෙයුම් කිරීමේ වගකීම රක්‍ෂකයාට දැරීමට මණ්ඩලයට අවසර දිය නොහැකි බැව් එම ඉල්ලීම සලකා බැලූ මණ්ඩලය ඔවුනට දන්වා සිටියේය.

11. එක් රක්‍ෂණ සමාගමක් විසින් රු.මි. 100ක ණයකර (ජීවිත අරමුදල්හි ආයෝජිත) එක්තරා මූල්‍ය ආයතනයක අභිමත කොටස් (voting shares) බවට පරිවර්තනය කොට ජීවිත රක්ෂණ අරමුදලෙහි (Life Fund) ආයෝජනයන් වශයෙන් සැලකිල්ලට ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට මණ්ඩලය එරෙහි නොවූයේ රක්ෂණ සමාගම එකී කොටස්, කොටස් කොටස් වෙළඳ පලෙහි ලැයිස්තුගත වූ පසු ජීවිත රක්ෂණ අරමුදලේ කොටසක් ලෙස සැලකිල්ලට භාජනය කිරීමේ කොන්දේසිය මත වේ. එසේම රක්‍ෂණ සමාගම මණ්ඩලය විසින් පනවා ඇති ද්‍රවශීලී ආන්තික නියමය හා නිර්ණායකවලට අනුකූලව ක්‍රියා කිරීමද කොන්දේසියක් ලෙස පනවන ලදී.

12. එක් රක්‍ෂණ සමාගමක් ZEP-RE ප්‍රතිරක්‍ෂ සුරැකුම් ඔවුන්ගේ ගිවිසුම් පටිපාටියට භාවිතා කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටියේය. මෙම ඉල්ලීමට මණ්ඩලය අනුමැතිය නොදුන්නේ AM Best Rating නියෝජිතායතනය මගින් ZEP-RE සඳහා ලබාදුන් ආරක්ෂන අනුපාතිකය සහ Standard & Poor's මගින් ධාරක රට වන කෙන්යාවට ලබා දුන් ස්වෛරී අනුපාතිකය මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති ආරක්ෂිත අනුපාතික මට්ටම් යටතට නොගැනෙන බැවිනි.

13. 2011 අංක 03 දරණ සංශෝධිත පනත මගින් හඳුන්වාදෙන ලද නව විධිවිධාන ප්‍රකාර අධ්‍යක්‍ෂවරු පත්කිරීම සම්බන්ධයෙන් රක්‍ෂණ සමාගම් වලින් ඉල්ලුම්පත් ගණනාවක්ම මණ්ඩලය වෙත මෙම වර්ෂයේදී යොමුකර ඇත.

14. මණ්ඩලය විසින් වෙළඳපලේ ඇති රක්‍ෂණ නිෂ්පාදනයන්හි දත්ත ගබඩාවක් පිහිටුවීම සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමේ සහ පිළියෙල කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. මේ වැයම සඳහා රක්‍ෂකයන්ගෙන් සියළු රක්‍ෂණ නිමැවුම් පිළිබඳ තොරතුරු ඉල්ලා ඇත. පනත හඳුන්වාදුන් නවවිධිවිධාන ප්‍රකාර රක්‍ෂණ නිමැවුම් (නිෂ්පාදන) 40ක් පමණ මණ්ඩලය වෙත ලැබී ඇත.

## නියාමන ප්‍රතිසංස්කරණ

### 200 අංක 43 දරණ රක්‍ෂණ කර්මාන්ත නියාමන පනතට කරන ලද සංශෝධන

2000 අංක 43 දරණ රක්‍ෂණ කර්මාන්ත නියාමන පනතේ සංශෝධන කෙටුම්පත් 2011 ජනවාරියේ පාර්ලිමේන්තුවෙන් සම්මත විය. ඒ අනුව ප්‍රධාන ආඥාපනත 2011 අංක 3 සංශෝධනයෙන් 2011 පෙබරවාරි 11දා සිට බලපැවැත්වේ. වැදගත් සංශෝධන පහත පරිදි වේ.

- මණ්ඩලයේ සමාජිකයකු වු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා ආදේශ කරන ලදී.

- අලාභ ගලපන්නන් වශයෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමට විධිවිධාන හඳුන්වාදෙන ලදී.

- දිගුකාලීන හා සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර ද්විත්වයේම නිරත සමාගම් විසින් ස්වකීය ව්‍යාපාරය වෙන්වෙන් සමාගම් දෙකකට බෙදනු ලැබිය යුතු අතර අදාල සංශෝධනය බලාත්මක කල දින සිට වසර 4ක් ඇතුලත එය නිමකල යුතුය.

- සංශෝධන පනතේ ඇතුලත් වෙන් කිරීම් අවශ්‍යතා සම්පූර්ණ කල දැනට පවතින රක්ෂණ සමාගම් සහ අනිකුත් රක්ෂකයන් සංශෝධිත පනත ක්‍රියාත්මක වු දිනයේ සිට වසර 5ක් ඇතුලත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුත්තේය

- රක්ෂකයකු වශයෙන් ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන සමාගමකට එක් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක පමණක් නිරතවීමට අවසර ලැබෙන අතර එවන් සමාගමක් එකී ලියාපදිංචියෙන් අවුරුදු 3 ක් ඇතුලත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුත්තේය

- රක්ෂණ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරෙන අධ්‍යක්ෂවරුන් විශේෂිත නිලධාරීන් සහ ප්‍රධාන නිලධාරීන් ඊට විධිමත් නිර්ණායක මත පත් කරනු ලැබීම හා සේවය කරනු ලැබීම අවශ්‍යය

- සංස්ථාපිත සමාගම් රක්ෂණ නියෝජිතයින් වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි

- ලියාපදිංචි රක්ෂණ සමාගම්වල හා තැරැව්කාර සමාග ම්වල ලියාපදිංචියෙන් පසුවද ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා නියමයන් පැනවීමට මණ්ඩලයට බලය ඇත.

- සංශෝධනය ක්‍රියාත්මක වන දිනයේ සිට ජාතික රක්ෂණ භාර අරමුදල මණ්ඩලය යටතේ ලියාපදිංචි රක්ෂකයෙකු වශයෙන් සැලකේ.

### රීති සංශෝධනය

2002 සැප්තැම්බර් 24 දිනැති අංක 1255/12 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ණයගෙවීමේ හැකියාවේ සීමා (දිගුකාලීන රක්ෂණය) රීති සහ 2004 මැයි 17 දිනැති අංක 1341/8 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරන ලද ණයගෙවීමේ හැකියාවේ සීමා (සාමාන්‍ය රක්‍ෂණ) රීති, මණ්ඩලය විසින් ප්‍රතිසංශෝධනයට ලක්කරන ලදී. වේගයෙන් වෙනස්වන්නාවූ ලෝකයේ රක්ෂණ කර්මාන්තයේ සහ වාණිජ කටයුතු ප්‍රවණතාවල වෙනස් වන්නාවූ අවශ්‍යතා සපුරාලීම පිණිස මණ්ඩලය විසින් ණයගෙවීමේ හැකියාවේ සීමා රීති ප්‍රතිශෝධනයට ලක්කොට ඇත. මෙම ප්‍රතිශෝධන 2011 මාර්තු 18 දිනැති අංක 1697/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනලදී. මේ සම්බන්ධයෙන් වැඩිදුර ප්‍රතිශෝධනය කෙරෙහි සැලකිල්ල යොමුවී ඇත.

රක්‍ෂකයින් වශයෙන් ලියාපදිංචිය අපේක්‍ෂා කරන තැනැත්තන්ගේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රක්‍ෂණ ව්‍යාපාරයේ එක් පන්තියකට රු.මි. 100යේ සිට රු. මි. 500 දක්වා වැඩිකරන ලදී. එසේම රක්‍ෂණ තැරැව්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රක්‍ෂණ ව්‍යාපාර පන්තියකට රුපියල් 50,000 සිට රු. 100,000 දක්වා ඉහල නංවන ලදී. මෙම ප්‍රතිශෝධනය 2011 ජුනි 24 දින අංක 1711/25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිදධකරන ලදී.

සංශෝධන පනත මගින් රක්‍ෂණ නියෝජිතයින් වශයෙන් පුද්ගලයින් පත්කරගැනිමට රක්‍ෂකයින්ට හා තැරැව්කරුවන්ට අවකාශ ලැබෙන ආකාරයෙන් පනතේ 78(1) වන වගන්තිය සංශෝධනය කරන ලදී. ඒ අනුව මණ්ඩලය විසින් ආයතන සඳහා ලියාපදිංචියට අවශ්‍යවන්නාවූ රීති කෙටුම්පත් කොට ඇති අතර ඒ පිළිබඳව කර්මාන්තයේ පුද්ගලයන් සමග සංවාද මාලාවක් පවත්වා ඇත. මේ සම්බන්ධයෙන් දැනට භාවිතයේ පවතින "බැංකෂුවරන්ස් ගිවිසුම්" පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් ද මණ්ඩලය විසින් ලබාගෙන ඇත.

2011 අංක 3 දරණ සංශෝධිත පනත මගින් හඳුන්වා දුන් VIII (අ) කොටස මගින් අලාභ ගැලපුම්කරුවන් වශයෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලයට බලය පැවරේ. අනෙකුත් රටවල අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී සලකා බලනු ලබන අවශ්‍යතා පිළිබඳව මණ්ඩලය අධ්‍යයනය කොට ඇති අතර ශ්‍රී ලංකාවේ අලාභ ගලපන්නන් ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන්නා වු රීති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක මණ්ඩලය නිරතව සිටි.

දැනට ලියාපදිංචිව පවතින රක්‍ෂණ සමාගම්වල රක්‍ෂණ ව්‍යාපාර පන්තියක ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 දක්වා වැඩිකරලීමේ ක්‍රියාදාමයක මණ්ඩලය නිරතව සිටි.

### නිශ්චය සඳහා සංශෝධන සහ නව නිශ්චයන් හඳුන්වාදීම

2002 ඔක්තෝම්බර් 30 දින දරන නිශ්චය අංක 01 මගින් දිගුකාලීන රක්‍ෂණ අරමුදල් හා තාක්‍ෂණික සංචිතයන් ගෙන්, අපේක්ෂිත අවම ප්‍රමාණය රජයේ සුරැකුම්හි ආයෝජනය කිරීමෙන් පසුව ශේෂවන වත්කම් අයෝජනය කිරීම සඳහා අනුගමනය කලයුතු ක්‍රියාපිලිවෙල අවධාරණයකොට දක්වනු ලැබේ. 2002 ඔක්තෝම්බර් 30දින දරණ නිශ්චය අංක 01 මගින් හඳුන්වාදෙන ලද එබඳු ආයෝජන සීමාමායිම් (පිරිමිතයන්) ප්‍රමාණය මණ්ඩලය විසින් සංශෝධනය මගින් පුළුල් කොට ඇත. එම සංශෝධනය 2011 අප්‍රේල් 01 දා සිට බලපැවැත්වේ.

2011 අංක 3 දරණ සංශෝධන පනතේ 15 වන වගන්තිය මගින් ප්‍රධාන පනතේ 35 වන වගන්තිය ඉවත්කොට ඇති බැවින් වාරික බේරුම් කිරීමේ කාලසීමාව, වාරිකය ගෙවීමට නියමිත දින සිට දින 60ක් ඇතුලත විය යුතු බවට ප්‍රකාශ කෙරෙන අතර 2002 ඔක්තෝම්බර් 30 දිනැති නිශ්චය අංක 03 අහෝසි වී ඇත.

2011/07/12 දිනැති අංක 9 දරණ නිශ්චය විසින් 2011 පෙබරවාරි 1 දිනැති නිශ්චය අංක 9 අහෝසි කොට ඇති බැවින් රක්ෂණ තැරව්කාර සමාගම් ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තුව පහත දැක්වෙන ආකාරයෙන් වැඩිකොට ඇත.

(අ) පනතේ 83 වන වගන්තියේ අවාධාරණය කොට ඇති පරිදි 2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/15 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවල සඳහන් ආකාරයට ලියාපදිංචිය අළුත් කිරීමේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරිමට නියමිත දිනට ආසන්නතම පූර්ව කාර්තු හතර සඳහා රක්ෂණ තැරව්කරුවකුගේ තැරව් කොමිස් ආදායම, රුපියල් මිලියන 3 හෝ ඊට අඩුවන අවස්ථාවලදි අළුත් කිරිමේ ගාස්තුව රක්ෂණ තැරව් ව්‍යාපාරයේ එක් පන්තියක් සඳහා රු. 30,000.00 බැගින් වේ.

(ආ) පනතේ 83 වන වගන්තියේ අවාධාරණය කොට ඇති පරිදි 2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/15 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවල සඳහන් ආකාරයට ලියාපදිංචිය අළුත් කිරීමේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරිමට නියමිත දිනට ආසන්නතම පූර්ව කාර්තු හතර සඳහා රක්ෂණ තැරව්කරුවකුගේ තැරව් කොමිස් ආදායම, රුපියල් මිලියන 3 ඉක්මවන අවස්ථාවලදි අළුත් කිරිමේ ගාස්තුව රක්ෂණ තැරව් ව්‍යාපාරයේ එක් පන්තියක් සඳහා රු. 50,000.00 බැගින් වේ.

ඉහතින් දැක්වූයේ රක්ෂණ තැරව් ව්‍යාපාර පන්තියක් සඳහා වූ රු. 25,000.00 ක ලියාපදිංචිය අලුත්කිරීමේ ගාස්තුවේ ප්‍රතිශෝධනයකි.

2002 ඔක්තෝම්බර් 30 දිනැති අංක 10 දරණ නිශ්චය 2011 ජූලි මාසයේ සංශෝධනය කරනු ලැබුයේ රක්ෂණ තැරව්කරුවන් විසින් ඔවුන්ගේ රක්ෂණ නියෝජිතයිනට ගෙවිය යුතු උපරිම කොමිස් මුදල්, රක්ෂකයකු විසින් ඔවුන්ගේ රක්ෂණ නියෝජිතයකුට ගෙවිය යුතු උපරිම කොමිස් ප්‍රමාණයට සමාන කිරීම සඳහාය.

පනතේ 49 (ආ) වගන්තිය යටතේ 2011 මැයි 31 දිනැති අංක 12 දරණ නිශ්චය, මණ්ඩලය විසින් පැනවුයේ රක්ෂකයින්ගේ කාර්තුමය වාර්තා ඉදිපත් කල යුතු ආකෘතිය හඳුන්වා දීම සඳහාය. 2011 අප්‍රේල් 1 වනදා සිට බලාත්මක වූ ණයගෙවීමේ හැකියාවේ සීමා රීතියට කළ සංශෝධනයනට ගැලෙපෙනු පිණිස එම වාර්තා ප්‍රතිශෝධනය කරන ලදී.

රක්ෂකයකුගේ අධ්‍යක්ෂවරයකු වශයෙන් අයකු පත්කිරීම, ඡන්දයෙන් තෝරාගැනීම හෝ නම් කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමේදි මණ්ඩලයට තොරතුරු ලබාදීමේ නිවේදනය සම්බන්ධයෙන් පනතේ 33 (ආ) (1) වගන්තිය යටතේ 2011 මැයි 31 දිනැති 13 වන නිශ්චය පනවන ලදී.

### රෙගුලාසි සඳහා සංශෝධන

රක්ෂකයින් විසින් ගෙවිය යුතු වාර්ෂික ගාස්තු හා ලියාපදිංචි ගාස්තු පිළිබඳ අංක 1414/19 දරණ සහ 2005 ඔක්තෝබර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි සංශෝධනය කරන ලදි . එක් රක්ෂණ ව්‍යාපාර පන්තියක් සඳහා ලියාපදිංචි ගාස්තුව රු. 250,000 සිට රු. 500,000ට වැඩිකරන ලදී. එක් රක්ෂණ ව්‍යාපාර පන්තියක් සඳහා වාර්ෂික ගාස්තුව රු. 100,000 සිට රු. 1,000,000 දක්වා හෝ කලින් වසරේ දීර්ඝ කාලින /සාමාන්‍ය රක්ෂණ කටයුතුවල දල ලිඛිත වාරිකයෙන් 0.05% හෝ ප්‍රථම වර්ෂය සඳහා ද, දෙවන ලිත් වර්ෂය ඇරඹීමෙන් පසු එක් ව්‍යාපාර පන්තියකට රු. 200,000 හෝ කලින් වර්ෂයේ එක් එක් ව්‍යාපාර පන්තියේ දළ ලිඛිත වාරිකයෙන් 0.0075% හෝ යන දෙකින් වැඩි ප්‍රමාණය ලෙසට වාර්ෂික ගාස්තු සංශෝධනය කොට ඇත.

### මණ්ඩලය විසින් නිකුත් කෙරුනු විධාන

පනතේ 57 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් එක් රක්ෂණ සමාගමකට එම සමාගම විසින් ඉදිරිපත් කල වාර්තා සම්බන්ධයෙන් විධානයක් නිකුත් කරන ලදි.

## රක්ෂණ කර්මාන්තයේ නියාමන ක්‍රියාවලිය පුළුල් කිරීමෙන්, ශක්තිමත් කිරීමෙන් හා අධීක්ෂණය කිරීමෙන් කර්මාන්තයේ/ පොදු ජනතාවගේ (ඔප්පු හිමියන්ගේ හා අනාගත ඔප්පු හිමියන්ගේ) විශ්වාසය ශක්තිමත් කිරිම සඳහා ගත් ක්‍රියාමාර්ග

- පොදු ජනතාව අතර රක්ෂණ කර්මාන්තය පිළිබඳ දැනුවත් භාවය ඇතිකිරිම උදෙසා ජාතික පුවත්පත්වල ප්‍රවෘත්ති/ලිපි ප්‍රකාශයට පත්කීරීමට පියවරගෙන ඇත.
- රක්ෂණ කර්මාන්තය හා අදාල වැදගත් කර්මාන්ත තොරතුරුත්, ඒ හා සම්බන්ධිත නිතීරීතින් හි සංශෝධන පිළිබඳවත් මණ්ඩලයේ වෙබ් අඩවිය නිරතුරුවම යාවත්කාලින කෙරේ.
- ලියාපදිංචි කිරීම් අළුත් කිරීම සඳහාවූ සංශෝධිත පෝරමය හා ඒ සම්බන්ධ අනෙකුත් තොරතුරු පිළිබඳ වැඩමුළුවක් රක්ෂණ තැරව්කාර සමාගම්වල ප්‍රධාන නිලධරයන් සඳහා මණ්ඩලය විසින් පවත්වන ලදී.

## විමර්ශනාත්මක සමාලෝචනය

පනතේ 98 වන වගන්තිය ප්‍රකාර කිසියම් වන්දි ගෙවීමක් නිරාකරණයේදී ඇතිවන්නාවූ ආරාවුලක් වන්දි හිමිකම්පාන්නාගේ කැමැත්ත මත කිසියම් තීරණයක් ලබාගැනීමට මණ්ඩලයට යොමුකළ හැක. එවිට මණ්ඩලය දෙපාර්ශවයටම කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසමින්, අවශ්‍ය යැයි හැඟේනම් තවදුරටත් විමර්ශනය කිරීමෙන් අනතුරුව එම ආරාවුල පිළිබඳ සිය නියෝග ලබාදෙනු ඇත.


සමාලෝචනයට පාත්‍රවන්නාවූ වර්ෂය තුළදී පහත දැක්වෙන කාණ්ඩයන්හි පැමිණිලි 213 ක් විමර්ශන අංශය විසින් විභාග කොට ඇත:

*වගුව 1*

| සාමාන්‍ය | අංක | ජීවිත | අංක | රක්ෂණ නියෝජිත හා බැඳුනු | අංක |
|---|---|---|---|---|---|
| රථ වාහන රක්ෂණ වන්දි | 76 | රෝහල් ගතවීම | 17 | සේවා කරුණු | 05 |
| මුහුදුරක්ෂණ වන්දි | 01 | මරණ ප්‍රතිලාභ | 12 | සුදුසුකම් | 04 |
| ගිනි රක්ෂණ වන්දි | 22 | ආබාධිතවීම් | 05 | අයුතු මුදල් පරිහරණය | 13 |
| ණය ආරක්ෂණ වන්දි | 01 | ඔප්පු බල රහිතවීම් | 17 | | |
| ගෙවල් බිඳීම් රක්ෂණ වන්දි | 03 | ආවරණ අහෝසි කළ/ ඔප්පු ප්‍රාණවත් නොකිරීම් | 05 | | |
| අත්තිකාරම් ගෙවීම් හා කාර්යසාධන බැඳුම්කර | 05 | පූර්ණත්ව ප්‍රතිලාභ/ ගෙවා නිම අගය | 10 | | |
| කම්කරු වන්දි ඉල්ලීම් | 02 | අනෙකුත් ණය | 02 | | |
| ගංවතුර | 02 | වාරික නැවත ගෙවීම් | 04 | | |
| දේපල රක්ෂණ වන්දි | 04 | | | | |
| මරණ වියදම් (PAFI) | 01 | | | | |
| පෞද්ගලික අනතුරු ආවරණය | 01 | | | | |
| අනියම් අලාභ | 01 | | | | |

*රූප සටහන 1*

2011 වර්ෂය තුළදී සමාගම් වශයෙන් ලැබුණු පැමිණිලි



*වගුව 2*


මණ්ඩලයේ විමර්ශන අංශය වෙත ලැබුණු පැමිණිලි හා ඊට අදාල පැහැදිලි කිරීම් පහත ආකෘතියෙන් දැක්වේ.

| පැමිණිල්ලේ ස්වභාවය | විශේෂිත කරුණු |
|---|---|
| ජීවිත රක්ෂණ වන්දි හා ඒ සම්බන්ධ කාරණා | මෙම කාණ්ඩය යටතේ යොමු කෙරුන කාරණාවලින් වැඩිකොටසක්, ඔප්පු ලබාගැනීමේදී හෙළිදරව් කිරීම වැදගත් වන්නාවූ කරුණු නොසැපයීම හා බැදේ. යම් තීරණයකට එලැඹීමේදී විමර්ශන අංශය විශේෂඥ වෛද්‍ය මතයන් ඇතුළු සියළු අදාල තොරතුරු සැලකිල්ලට ගනි. |
| රථවාහන රක්ෂණ වන්දි | මෙම කාණ්ඩයේදි වන්දි ඉල්ලීම් ප්‍රතික්ෂේප වීමට හේතුවී ඇති කාරණා අතර මුදල් අඩු කරගැනීම් හෙළිදරව් නොවීම, වාරික ගෙවීමේ පොරොන්දු කාල සීමාව තුලදී වාරික නොගෙවීම හේතුවෙන් ඔප්පුව අවලංගුවීම, අවසන් නොවූ උසාවි තීන්දු, අනතුරු හා බැඳුණු සිදුවීම් වල නොගැලපීම, තොරතුරු ලබානොදිම හා ප්‍රමාණවත් රක්‍ෂණාවරණයක් නොමැතිවීම ආදිය වේ. වාහන වන්දි ගැටළු විසඳීමේදි, විමර්ශන වාර්තාව, තක්සේරු වාර්තාව සහ අවශ්‍ය අවස්ථාවන්හිදී වාහන විශේෂඥයින්ගේ අදහස්ද විමර්ශන අංශයේ සම්පූර්ණ පරීක්‍ෂාවට ලක් කෙරේ. |
| ගිනි රක්ෂණ වන්දි | මෙම වර්ගයේ වන්දි ඉල්ලිම් බොහෝවිට ප්‍රතික්ෂේප වන්නේ අදාල රක්‍ෂිතයාගේ සෘජු හෝ අනියම් සම්බන්ධතාව හේතුවෙනි. එබැවින් රක්‍ෂිතයාගේ වුවමනාවෙන්ම එවැන්නක යෙදුනාද යන්න සොයා බැලීමටත්, රක්‍ෂිතයාගේ සෘජු හෝ අනියම් සම්බන්ධයක් ඇතිදැයි සොයා බැලීමටත් තිබෙන සාක්‍ෂි විමර්ශනය කෙරේ. |
| නියෝජිතයාගේ සුදුසුකම් හා ඒ හා බැඳුණු අනෙකුත් කාරණා | නියෝජිතයින්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් මණ්ඩලය සහතිකවල නිරවද්‍යතාවත්, අව්‍යාජත්වයත් තහවුරු කරගැනීමට කටයුතු කරයි. |
| මුහුදු රක්ෂණ වන්දි | සාමාන්‍යයෙන් මෙම කාණ්ඩ යටතේ එතරම් පැමිණිලි සංඛ්‍යාවක් ලැබෙන්නේ නැත. තීරණයක් ගැනිමේදී විමර්ශන අංශය අදාල ලිපිලේඛණ පූර්ණ විශ්ලේෂණයකට ලක්කරයි. |
| ගෙවල් බිඳීම් වන්දි | |
| සංචාරක රක්ෂණ වන්දි | |
| පෙරගෙවුම් හා කාර්ය බැඳුම්කර | |
| ස්වභාවික විපත් | |
| විදුලි උපකරණ | |
| ණය ආවරණ | |
| සංක්‍රමණ | |
| අනෙකුත් (PAFI /වෙළෙඳුන්ගේ සබැඳි) | |


මහජන දැනුවත් කිරිමේ ක්‍රියාකාරකම් සමග විමර්ශන අංශයට ලැබුණු පැමිණිලි පසුගිය වසර 4 පුරා ඉහල නැගී ඇත.

සමාලෝචනයට පාත්‍රවූ වර්ෂය තුළදී විමර්ශන අංශය සාර්ථක ලෙස පැමිණිලි 213 ක් විමර්ශනය කරන ලද අතර පැමිණිලි 240* ක් පැමිණිලිකරු තෘප්තිමත් වන ආකාරයට නිරාකරණය කරනලදී.

*රූප සටහන 2*




*රූප සටහන 3*




* සමථයකට පත් කරන ලද සංඛ්‍යාවට 2010 වසරෙන් ඉදිරියට ගෙන ආ පැමිණිලි සංඛ්‍යාවද ඇතුලත්ය

## වෙළඳපොළ සංවර්ධනය හා බාහිර සම්බන්ධතා

### අරමුණු

දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි මණ්ඩලයේ අරමුණු වන්නේ රක්‍ෂණ විෂයෙහිත්, රක්‍ෂණ කර්මාන්තයෙහිත්, එහි නවතම වර්ධනීය අවස්ථාත් සම්බන්ධයෙන් දැනුම ප්‍රවර්ධනයයි.

### ප්‍රදර්ශනවලදී ඇති සහභාගීත්වය

2011 පෙබරවාරි 4දා සිට 10 දක්වා මොණරාගල බුත්තල දී පවත්වනු ලැබූ "දැයට කිරුළ" ප්‍රදර්ශණයට අඛණ්ඩව පස්වන වරටත් සහභාගිවෙමින් අපගේ කුටියක් තනන ලදී. මෙය රක්ෂණය පිළිබඳවත් මණ්ඩලයේ වගකීම් හා ක්‍රියාකාරීත්වය පිළිබඳවත් මහජනයාට අධ්‍යාපනයක් ලබාදීමට මහඟු අවස්ථාවක් විය. ආසන්න වශයෙන් 10,000ක් පමණ ජනතාවක් අපගේ ප්‍රදර්ශණ කුටිය කෙරෙහි උනන්දුවක් දක්වමින් නැරඹුවෝය.





### මාර්ග සංදර්ශනය (Road Show)

2011 ඔක්තෝම්බර් 22 දින කොළඹ ශ්‍රී ලංකා ප්‍රදර්ශණ හා සම්මේලන ශාලාවේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සංවිධානය කොට පවත්වන ලද "ආයෝජන දිනය" මාර්ග සංදර්ශණයට ඔවුන්ගේ ආරාධනයෙන් මණ්ඩලය සහභාගි විය.



## 2011 වර්ෂයේදී ප්‍රකාශයට පත්කරන ලද අත් පත්‍රිකා



### ප්‍රකාශන

රක්ෂණ නිමැවුම් මිලට ගැනීමට අදහස් කරන මහජනතාවගේ පහසුව සඳහා රක්‍ෂණ සංකල්ප හා අනෙකුත් වැදගත් කරුණු පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ අරමුණින් මෙම වසර තුළදී මණ්ඩලය විසින් ප්‍රකාශන කීපයක් එළි දක්වන ලදී.

මණ්ඩලය විසින් පහත දැක්වෙන පුවත් පත් වෙළඳ දැන්වීම්ද, දැන්වීම් හා නිල නිවේදනද පළ කරනලදී.

(අ) නිදහස් දිනය නිමිත්තෙන් "නිදහස් දින දැයට කිරුළ" පුවත්පත් අතිරේකය සඳහා ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්වල වෙළඳ දැන්වීම් පළ කරන ලදී.

(ආ) පුවත්පත් දැන්වීම් -

- මහජනතාවට දැනුම්දීම – "රක්ෂණ යෝජනා පත්‍ර"
- මහජනතාවට දැනුම්දීම – "ලියාපදිංචි රක්ෂණ සමාගම්වල ලැයිස්තුව"
- මහජනතාවට දැනුම්දීම – "ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලැයිස්තුව"
- "ඩේලි මිරර් බිස්නස්" අතිරේකයේ 10 වන සංවත්සරය වෙනුවෙන් පළ කළ ඩේලි මිරර් පුවත්පත් විශේෂාංගය".

(ඇ) පුවත්පත් නිල නිවේදන -

- "දැයට කිරුළ" ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සහභාගීත්වය පිළිබඳ නිල නිවේදනය.
- "රක්ෂණ නියාමකයා රක්ෂණ කර්මාන්තය හා හමුව" නිල නිවේදනය
- "වසර 2010 තුළදී රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය" පුවත්පත් නිල නිවේදනය
- "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 10 වන සංවත්සරය" වෙනුවෙන් නිකුත් කල පුවත්පත් නිල නිවේදනය
- "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලට නව අධ්‍යක්‍ෂ ජනරාල්වරයකු පත් කිරීම පිළිබඳ පුවත්පත් නිල නිවේදනය"
- "2011 පළමු අර්ධයේ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය" පුවත්පත් නිල නිවේදනය
- "රක්ෂණ කර්මාන්තය උදෙසා වන අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන රීතිය" පිළිබඳ පුවත්පත් නිල නිවේදනය

(ඈ) ප්‍රචාරක අත්පත්‍රිකා-

- රක්ෂණ යෝජනා පත්‍ර
- රක්ෂණ ආවරණ

### පුවත් පත් සාකච්ඡා

ඩේලි මිරර් පත්‍රයේ ව්‍යාපාර කර්තෘවරයාගේ ඉල්ලීම පරිදි එම පුවත්පත සමග මණ්ඩලයේ නව අධ්‍යක්‍ෂ ජනරාල්වරයා පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවක් මෙම අංශය විසින් සංවිධානය කරනලදී.

### අනෙකුත් ක්‍රියාකාරකම්

#### 1. රක්ෂණ නියෝජිතයින්ගේ දත්ත ගබඩාව

පනතේ 78 (1) සහ (2) වගන්ති ප්‍රකාරව ඒ ඒ සමාගම් හි පෞද්ගලික වෙබ් අඩවි නිරන්තරයෙන් පවත්වාගෙන යමින් එහි දත්ත ගබඩාව යාවත්කාලීන කිරීමටත් මණ්ඩලයට එයට පිවිසීමේ පහසුව තකා නියෝජිත තොරතුරු දැක්වීමටත් නියමකෙරේ. මෙම අංශයෙහි මගපෙන්වීම යටතේ මෙම දත්ත ගබඩා තවදුරටත් නවීකරණයකොට භාවිතයට පහසු කරන ලදී.

#### 2. රක්ෂණ ඔප්පු ගොනු කිරීම

2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ විධි විධාන වලට අනුව "සෑම රක්ෂණ කරුවකු විසින්ම රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සුභ සිද්ධිය ප්‍රමාණවත් ලෙස සුරක්ෂිත වන්නේද යන්න පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා එකී රක්ෂණ කරු විසින් නිකුත් කරනු ලැබිය යුතු සියලු රක්ෂණ ඔප්පු ආකෘති නිකුත් කිරීමට පෙර මණ්ඩලය වෙත ගොනු කිරීම කරනු ලැබිය යුතුය".

අදාල කාලය තුළ මණ්ඩලයට රක්ෂණ සමාගම් වලින් නිකුත් කරනලද රක්ෂණ ඔප්පු ආකෘති 36ක් ලැබී තිබුණි. පරීක්ෂා කිරීමෙන් පසු යම් යම් ආකෘති සඳහා වැඩිදියුණු කිරීම් මණ්ඩලය විසින් යෝජනා කොට ඇත.

#### 3. මහජන අදහස් විමසීම

සමාලෝචනය වන්නාවූ වර්ෂය තුලදී ඔප්පු හිමියන් සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් කර්මාන්තයට අදාල හා රක්‍ෂණයට අදාල කරුණු ගැන කරන ලද බොහෝ විමසීම්වලට මණ්ඩලය විසින් සැලකිල්ල යොමුකොට ඇත.

## පරිපාලනමය සමාලෝචනය

### මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරිත්වයට හවුල්වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥාණය මතය. මණ්ඩලයේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්‍ෂණ කර්මාන්තය සියළුම රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතුය යන අභිප්‍රාය සාක්‍ෂාත් කරගැනීම උදෙසා අවශ්‍ය යුතුකම් සහ කාර්යභාරය හඳුනාගැනිම තුලින් මණ්ඩලය සිය සංවිධාන ව්‍යුහය ස්ථාපනය කර ඇත.

අපේක්‍ෂිත වෘත්තීකයින් නිසිකලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරිම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුලදී මණ්ඩලය විසින් ගන්නා ලදී. ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 2011 දෙසැම්බර් 31 දිනට 37 දෙනකුගෙන් සමන්විත වූ අතර ඔවුන්ගෙන් 11 දෙනකු පමණක් විධායක නොවන නිලධාරින් වෙති.

### පුහුණු කිරීම්

නිරන්තරයෙන් වෙනස්වන්නාවූ බාහිර පරිසරයත් එසේම වෙනස්වන රක්ෂණ නීති රීතිත් නිසා අප කාර්ය මණ්ඩලය ව්‍යුහගත පුහුණුවලට යොමුකරවන්නට මණ්ඩලයට සිදුවිය. දීර්ඝකාලීන අභියෝග සහ අපේක්ෂිත ව්‍යාපාර අවශ්‍යතා සමග පුද්ගල හැකියාවන් ගලපාගැනීම උදෙසා පුහුණු අවශ්‍යතා කේන්ද්‍රගත කරන ලදී. මණ්ඩලය ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට පමණක් නොව විධායක ශ්‍රේණියටද පුහුණුවීම් ලබාදුන්නේය. දේශීයව මෙන්ම විදේශියව පවත්වන්නට යෙදුනු පුහුණුවීම් වලට සහභාගිවීමට ඔවුන්ට අවස්ථා සලසන ලදී.

මණ්ඩලය විසින් 2011 වසර තුළදී කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකුට විදේශ පුහුණුව ලබාදෙන ලදී. කාර්ය මණ්ඩලයේ 18 දෙනෙකුට දේශීය පුහුණු අවස්ථා ලබාදෙන ලද අතර 6 දෙනෙකුට උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.

මෙයට අමතරව මෙම වසර තුලදි මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික නේවාසික පුහුණු වැඩසටහනක් පැවැත්වීය.

පහත දැක්වෙන වගුවෙන් 2010 සහ 2011 වසරේ සමස්ථ පුහුණු වැඩ සඳහා වූ වැය සංයුතිය පෙන්නුම් කෙරේ.

| වර්ගය | 2010 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| දේශිය පුහුණුවීම් | 1,648,253 | 1,668,837 |
| විදේශිය පුහුණුවීම් | 2,792,679 | 3,087,200 |

### සුභ සාධනය

මණ්ඩලයේ අරමුණු ඉෂ්ඨකර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලීය චිත්ත ප්‍රසාදය හා අභිප්‍රේරණය සඳහා කාර්ය මණ්ඩලයේ හා ඔවුන්ගේ පවුල්වල උදවියගේ හමුව කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පවත්වන ලදී. නේවාසික මෙන්ම බාහිර වෛද්‍ය පහසුකම්, රක්‍ෂණ ආවරණ සහ මූල්‍ය ආධාර වැඩසටහන් කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු වශයෙන් වසර පුරාම දියත් කෙරිණ.


## මූල්‍ය සමාලෝචනය

### රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)

රක්‍ෂණ පනතේ නියමයනට අනුව ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්) නියම කොට ඇති කටයුතු සඳහා ක්‍ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වර්ෂය තුලදීද රක්‍ෂණ මණ්ඩලය විසින් ආයෝජනය කරන ලද අතර පහත දැක්වෙන ප්‍රස්ථාරය එම සෙස් ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

*සටහන 1*

**2007 - 2011 කාලය තුල සෙස් ආදායම සහ ආයෝජන ආදායම (රුපියල් මිලියන)**





ඉහත ප්‍රස්ථාරය මගින් වසර 2007 සිට 2011 දක්වා පස් අවුරුදු කාලය තුළ සෙස් බදු ආදායමෙහි වූ වර්ධනය පෙන්නුම් කෙරේ. ආයෝජන ආදායම 2007 සිට 2009 දක්වා ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළද 2010 වසරේදී 2009 ට සාපේක්ෂව ආයෝජන ආදායම අඩුවීමක් පෙන්වයි. එය 2010 වර්ෂයේදී පොලී අනුපාතය පහත වැටීම නිසා සිදුවූවකි. එහෙත් 2010 වසරේදී මිලියන 145 ක් වූ සෙස් බදු ආදායම 2011 වසරේදී මිලියන 217 ක් දක්වා වූ 50% ක වර්ධනය හේතුවෙන් 2011 වසරේදී ආයෝජන ආදායම යළිත් හිතකර නැඹුරුවක් දක්වයි.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම ගතවූ පස් වසර තුළ වැඩිවී ඇති අන්දම පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

*සටහන 2*


**2007 - 2011 කාලය තුල ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය (රුපියල් මිලියන)**




2011 දෙසැම්බර් 31 වන දිනට ඔප්පු හිමියන්ගේ ආරක්‍ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

*සටහන 3*

**2011 දෙසැම්බර් 31 දිනට ඔප්පු හිමියන්ගේ ආරක්‍ෂණ අරමුදලේ වත්කම් සංයුතිය**





### මණ්ඩලයේ ආදායම්

මණ්ඩලයේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්වලිනි.

- රක්‍ෂකයින් හා රක්‍ෂණ තැරව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්‍ෂණ සමාගම් වලින් අය කෙරෙන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අලුත්කිරීම සඳහා රක්ෂණ තැරුව්කාර සමාගම් වලින් අයකරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

පහත දැක්වෙන ප්‍රස්ථාරය 2007- 2011 දක්වා කාලපරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ ආදායම බෙදී ඇති ආකාරය දක්වයි.

*සටහන 4*





## මණ්ඩලයේ වියදම්

2007 සිට 2011 වනවිට මණ්ඩලයේ වියදම් ක්‍රමිකව ඉහල ගොස් ඇත. ආදායම් හා වියදම් අතර හිඟය පනතේ විධිවිධානයනට අනුකූලව ඔප්පු හිමියන්ගේ ආරක්‍ෂණ අරමුදලින් පියවාගෙන ඇත.

පහත ප්‍රස්ථාරය 2007 - 2011 කාල පරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ වියදම පෙන්වයි.

*සටහන 5*





# මූල්‍ය තොරතුරු


ශේෂ පත්‍රය 56
ආදායම් සහ වියදම් ප්‍රකාශනය 57
සංචිත වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය 58
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 59
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 60
ගිණුම්කරණ ප්‍රතිපත්ති 61
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 63

# ශේෂ පත්‍රය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 12,368,886 | 16,818,661 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුලී සහ විද්‍යුත් තැන්පතු | 2 | 8,728,590 | 8,728,590 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | 183,131 | 312,131 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 | 1,270,526,277 | 1,003,081,520 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 8,028,124 | 7,211,191 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | - | 5,000,000 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 185,159 | 1,606,284 |
| **මුළු වත්කම්** | | 1,300,020,167 | 1,042,758,377 |
| **සංචිත හා වගකීම්** | | | |
| සංචිත | | | |
| සමුච්චිත අරමුදල | 6 | - | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 7 | 1,279,254,867 | 1,011,810,110 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 8 | 12,368,887 | 15,906,644 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 9 | 1,833,909 | 1,444,533 |
| පොලී දරන ණය ගැණුම් | 10 | - | 361,872 |
| | | 14,202,796 | 17,713,049 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | | 1,400,018 | 2,350,018 |
| අනෙකුත් ජංගම වගකීම් | 11 | 5,162,486 | 10,122,632 |
| පොලී දරන ණය ගැණුම් වල ප්‍රවර්ථන කොටස | 10 | - | 762,569 |
| | | 6,562,504 | 13,235,219 |
| **මුළු සංචිත හා වගකීම්** | | 1,300,020,167 | 1,042,758,377 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වෙත පැවරේ.

ඉහත ශේෂ පත්‍රය පිටු අංක 61 සිට 68 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමග සංයෝජිතව කියැවිය යුතුවේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ඒ වෙනුවෙන්,

**ඉන්ද්‍රාණි සුගතදාස**
සභාපතිනිය

**ඩී. විදානගමාච්චි**
සාමාජික

කොළඹ, ශ්‍රී ලංකාව
2012 මාර්තු 01

# ආදායම් හා වියදම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 12 | 40,498,544 | 31,496,975 |
| රජයේ ප්‍රදාන | - | - | - |
| ප්‍රදාන හඳුනාගැනීම | 8 | 6,040,348 | 7,520,440 |
| පොලී ආදායම | | 144,873 | 3,064,491 |
| වෙනත් ආදායම් | 13 | 415,246 | 224,167 |
| **මුළු ආදායම** | | 47,099,011 | 42,306,073 |
| අඩුකලා: | | | |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 20 | 36,063,408 | 28,974,292 |
| වෘත්තීය ගාස්තු | 21 | 1,619,785 | 1,076,189 |
| මෙහෙයුම් වියදම් | 22 | 36,567,718 | 41,190,501 |
| මූල්‍ය සහ අනෙකුත් | | 99,514 | 242,115 |
| **මුළු වියදම්** | | 74,350,425 | 71,483,097 |
| බදුවලට පෙර ශුද්ධ ඌණතාවය | 14 | (27,251,414) | (29,177,024) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කිරීම් | 7 | 27,262,344 | 30,472,838 |
| බදු | 15 | (10,930) | (1,295,814) |
| බදුවලට පසු ශුද්ධ ඌණතාවය | | - | - |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | | - | - |

පිටු අංක 61 සිට 68 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# සංචිත වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂයේ ආරම්භක ශේෂය | - | 67,828,254 |
| වසර තුල සිදුකරන ලද ගැලපීම් | - | (67,828,254) |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(ඌණතාව) | - | - |
| වර්ෂය අවසානයේදී ශේෂය | - | - |

පිටු අංක 61 සිට 68 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) | | - | - |
| ක්ෂය සඳහා ගැලපීම් | | 6,237,563 | 8,220,340 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | 703,074 | 568,362 |
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | (172,023) | - |
| ප්‍රදාන හඳුනා ගැනීම | | (6,040,348) | (7,520,440) |
| ආදායම් බදු | | 10,930 | 1,295,814 |
| පොලී ආදායම | | (144,873) | (3,064,491) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර ශුද්ධ වැඩිවීම් | | 594,323 | (500,415) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම) /අඩුවීම | | 129,000 | (63,210) |
| ලැබිය යුතු දෑ වල (වැඩිවීම) /අඩුවීම | | (824,969) | 10,990,533 |
| අත්තිකාරම් ලැබීම් වල වැඩිවීම /(අඩුවීම) | | (950,000) | 476,416 |
| ණය හිමියන් සහ උපචිතයන්හි වැඩිවීම/ (අඩුවීම) | | (5,284,774) | 5,878,612 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහය | | (6,930,743) | 17,282,351 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | (6,336,420) | 16,781,936 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත් වල ආයෝජනය | | 5,000,000 | (22,646,824) |
| පොලී ආදායම | | 152,910 | 6,638,036 |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 886,826 | - |
| දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම | | (2,502,591) | (1,478,079) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 3,537,145 | (17,486,867) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරුකිරීම් | | 2,502,591 | 1,478,079 |
| මූල්‍ය කල්බදුවල වැඩිවීම | | (1,124,441) | (740,581) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 1,378,150 | 737,498 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ ( අඩුවීම) | | (1,421,125) | 32,567 |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,606,284 | 1,573,717 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 185,159 | 1,606,284 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 | 185,159 | 1,606,284 |

පිටු අංක 61 සිට 68 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | 267,444,757 | 256,736,567 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 267,444,757 | 256,736,567 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| රජයේ සුරැකුම්පත් වලින් ලද පොලියෙහි (වැඩිවීම) /අඩුවීම | | (8,377,361) | 19,821,348 |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම)/අඩුවීම | | (13,985,183) | 3,636,910 |
| කුලී තැන්පතු වල (වැඩිවීම)/අඩුවීම | | - | (996,474) |
| සෙස් අරමුදලින් මාරු කල යුතු අරමුදල්හි වැඩිවීම/(අඩුවීම) | | 5,458,870 | (17,133,531) |
| | | (16,903,674) | 5,328,253 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 250,541,083 | 262,064,820 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්හි ආයෝජනය | | (250,939,905) | (266,982,177) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (250,939,905) | (266,982,177) |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (398,823) | (4,917,357) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 427,280 | 5,344,637 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 28,457 | 427,280 |
| බැංකුවේ ඇති මුදල් | 2 | 28,457 | 427,280 |

පිටු අංක 61 සිට 68 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 ශේෂ පත්‍ර දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු හටගන්නා සියලුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැළපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.4 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැළපීම් කර ඇත.

### 1.5 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොළී හා ලාභාංශ ආදායම හැර, මණ්ඩලයේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

### 1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියලුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තාකරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම්

### 2.1 දේපල, පිරියත හා උපකරණ දේපල

**ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමග එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

**ක්ෂය**

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික % |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම් සහ සවිකිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ | 25 |
| පුහුණු උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදනය එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ.

### 2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත්හි සහ ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්හි කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට වන අතර, ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයවලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කර ගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ වලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල් ය.

## 3. බැරකම් සහ ප්‍රතිපාදනය

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

#### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 - 'විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය' හා අනුකූලව සේවකයන් සඳහා සේවක පාරිතෝෂික ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කැරෙන ආකාරයට ගිණුම්ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව සේවකයකු පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

#### 3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව මණ්ඩලයේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

### 3.2 බැරකම්

බැරකම් අතරින් ශේෂපත්‍ර දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ ශේෂ පත්‍රයෙහි ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. ශේෂ පත්‍ර දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියලුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියලුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

### 3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් සහ ක්ෂුද්‍ර රක්ෂණ ව්‍යාපෘතියට ලැබෙන සියලුම වත්කම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනාගනු ලැබේ.

## 4. ආදායම් සහ වියදම්

### 4.1 ආදායම් හඳුනාගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 4.2 රාජ්‍ය ප්‍රදාන

සමාලෝචිත වර්ෂය තුළ දී කිසිදු රාජ්‍ය ප්‍රදානයක් ලැබී නැත.

### 4.3 වියදම් හඳුනාගැනීම

මණ්ඩලය පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියලුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

### 4.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | ලී බඩු, වැද්දුම් හා සවිකිරීම් | කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත්) | පුහුණු උපකරණ | මූල්‍ය කල්බදු මත වත්කම්/ මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 9,473,243 | 14,206,234 | 18,058,366 | 141,450 | 2,800,000 | 44,679,294 |
| එකතු කිරීම් | - | 76,775 | 2,425,817 | - | - | 2,502,591 |
| බැහැර කිරීම් | - | - | - | - | (2,800,000) | (2,800,000) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 9,473,243 | 14,283,009 | 20,484,183 | 141,450 | - | 44,381,885 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 7,710,546 | 5,831,228 | 12,289,327 | 141,450 | 1,888,082 | 27,860,633 |
| වර්ෂය සඳහා අයකිරීම් | 1,012,061 | 1,778,607 | 3,249,780 | - | 197,115 | 6,237,563 |
| බැහැර කිරීම් | - | - | - | - | (2,085,197) | (2,085,197) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 8,722,607 | 7,609,835 | 15,539,107 | 141,450 | - | 32,012,999 |
| **ලියා අඩු කල අගය** | | | | | | |
| **2011 දෙසැම්බර් 31 දිනට** | 750,636 | 6,673,174 | 4,945,076 | - | - | 12,368,886 |
| **ලියා අඩු කල අගය** | | | | | | |
| **2010 දෙසැම්බර් 31 දිනට** | 1,762,697 | 8,375,006 | 5,769,040 | - | 911,918 | 16,818,661 |

## 2. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ආයෝජන සහ අනෙකුත්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| කුලී සහ විද්‍යුත් තැන්පතු | | **8,728,590** | 8,728,590 |
| **ජංගම වත්කම්** | | | |
| රජයේ සුරැකුම්හි ආයෝජන | | **1,189,577,848** | 938,637,943 |
| රජයේ සුරැකුම්පත් වලින් ලැබිය යුතු පොලිය | | **31,884,906** | 23,507,545 |
| ලැබිය යුතු සෙස් බදු | | **50,000,000** | 36,014,817 |
| බැංකුවේ ඇති ශේෂය | | **28,457** | 427,280 |
| සෙස් අරමුදලට මාරු කල යුතු අගය | | **-** | 4,493,936 |
| අඩුකලා: | | | |
| සෙස් අරමුදලෙන් මාරු කල යුතු අගය | | **964,935** | - |
| | | **1,270,526,277** | 1,003,081,521 |
| මුළු වත්කම් | | **1,279,254,867** | 1,011,810,111 |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **3. භාණ්ඩ තොග** | | | |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | | 175,871 | 171,186 |
| ප්‍රකාශන | | - | 51,100 |
| මුද්දර | | 7,260 | 89,845 |
| | | 183,131 | 312,131 |
| **4. අනෙකුත් ජංගම වත්කම්** | | | |
| තැන්පතු | | 187,870 | 162,000 |
| වෙනත් ලැබිය යුතු දෑ | | 146,911 | 5,416 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | | 1,055,865 | 841,728 |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම | | 1,182,959 | 1,423,033 |
| ලැබිය යුතු පොළී - භාණ්ඩාගාර බිල්පත් | | - | 8,036 |
| සේවක ණය* | | 3,668,481 | 4,025,086 |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් | | 821,104 | 745,892 |
| සෙස් බදු අරමුදලෙන් මාරු කළ අගය | | 964,935 | - |
| | | 8,028,124 | 7,211,191 |
| *කාර්‍යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | | 4,025,086 | 3,112,003 |
| වර්ෂය තුළදී ප්‍රදානය කල ණය | | 2,305,239 | 3,282,500 |
| | | 6,330,325 | 6,394,503 |
| වර්ෂය තුළදී ණය ආපසු ගෙවීම් | | (2,661,844) | (2,369,417) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 3,668,481 | 4,025,086 |
| **5. මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | |
| **බැංකුවල ඇති මුදල්** | | | |
| ලංකා බැංකුව | | 185,159 | 1,600,315 |
| ඇතැති මුදල් | | - | 5,970 |
| | | 185,159 | 1,606,285 |
| **6. සමුච්චිත අරමුදල** | | | |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී ශේෂය | | - | 67,828,254 |
| වර්ෂය තුල සිදුකරන ලද ගැලපීම් | | - | (67,828,254) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌණතාව) | | - | - |
| කාලපරිච්ඡේදය අවසානයේදී ශේෂය | | - | - |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|

## 7. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය | 1,011,810,110 | 755,073,543 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | 216,837,328 | 144,666,577 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොළී | 44,927,884 | 31,740,107 |
| ප්‍රතිමිලදී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොළී | 35,463,880 | 44,466,546 |
| වර්ෂය තුළදී ගැලපුම් | - | 67,828,254 |
| | 1,309,039,202 | 1,043,775,027 |
| අඩුකළා: | | |
| මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම් | 27,262,344 | 30,472,838 |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | 2,502,591 | 1,478,079 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | 29,764,935 | 31,950,917 |
| බැංකු ගාස්තු | 19,400 | 14,000 |
| | 29,784,335 | 31,964,917 |
| අවසාන ශේෂය | 1,279,254,867 | 1,011,810,110 |

## 8. ප්‍රදාන

| | | |
|---|---|---|
| වසර ආරම්භයේදී ශේෂය | 15,906,644 | 21,949,005 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | 2,502,591 | 1,478,079 |
| අඩුකළා: වර්ෂය තුලදී ක්‍රමක්ෂය කිරීම් | (6,040,348) | (7,520,440) |
| වසර අවසානයේදී ශේෂය | 12,368,887 | 15,906,644 |

**සටහන - ප්‍රදාන හඳුනා ගැනීම්**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 24 හා අනුකූලව ප්‍රදානයන් ගිණුම් ගත කර ඇති අතර ආදායම් ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත.

| | | |
|---|---|---|
| මෝටර් රථවාහන | 25% | වාර්ෂික |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි. ද. සෑ. | 25% | - එම - |
| ලී බඩු වැද්දුම් සහ සවිකිරීම් | 12.5% | - එම - |

## 9. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

| | | |
|---|---|---|
| වසර ආරම්භයේදී ශේෂය | 1,444,533 | 876,171 |
| වසර තුළ ප්‍රතිපාදන | 703,074 | 568,362 |
| වසර තුල සිදුකරන ලද ගෙවීම් | (313,698) | - |
| වසර අවසානයේ ශේෂය | 1,833,909 | 1,444,533 |

## 10. පොලී දරන ණය ගැනුම්

| | | |
|---|---|---|
| මූල්‍ය කල්බදු බැරකම් | | |
| කල් බදු ණය හිමියන් | - | 1,268,352 |
| අඩුකළා අවිනිශ්චිත පොලී | - | (143,911) |
| | - | 1,124,441 |
| මූල්‍ය කල්බදු බැරකමෙහි ප්‍රවර්ථන කොටස | - | (762,569) |
| | - | 361,872 |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| **11. අනෙකුත් ජංගම බැරකම්** | | | |
| වෙනත් | | 5,162,486 | 10,122,632 |
| | | 5,162,486 | 10,122,632 |
| **12. අයභාරය** | | | |
| රක්ෂණ සමාගම් වලින් වාර්ෂික ගාස්තු | | 34,578,544 | 29,186,084 |
| ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ගාස්තු | | 5,920,000 | 2,310,891 |
| | | 40,498,544 | 31,496,975 |
| **13. වෙනත් ආදායම්** | | | |
| මෝටර් වාහන ණය මත පොලී | | 48,055 | 61,934 |
| ආපදා ණය මත පොලී | | 102,196 | 106,300 |
| ප්‍රකාශන අලෙවියෙන් ලැබීම් | | 49,875 | 32,880 |
| ස්ථාවර වත්කම් විකුණුම් ආදායම් | | 172,023 | - |
| වෙනත් ආදායම් | | 43,097 | 23,054 |
| | | 415,246 | 224,168 |

**14. වියදමට වඩා වැඩි ආදායම් අතිරික්තය/ (ඌණතාව)**
වර්ෂය සඳහා ඌණතාව නිශ්චය කිරීමේදී පහත දැ සහිතව සියලුම වියදම් අඩු කර ඇත.

| | 2011 | 2010 |
|---|---|---|
| කාර්ය මණ්ඩල වැටුප් | 18,504,115 | 15,322,247 |
| සේ. අ. අ. සහ සේ. භා. අ. | 2,806,072 | 2,285,409 |
| විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය | 703,074 | 568,362 |
| කාර්‍ය මණ්ඩල පුහුණුව - විදේශීය | 3,087,200 | 2,792,680 |
| දේශීය උපදේශකයන් | 614,167 | 503,511 |
| විදේශීය උපදේශකයන් | 719,121 | 572,678 |
| විගණක පාරිශ්‍රමික | 585,252 | 200,000 |
| ක්ෂය | 6,237,563 | 8,220,340 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | 457,500 | 356,000 |
| සභාපතිනියගේ වියදම් - ඉන්ධන | 268,920 | 158,010 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනා | 1,767,419 | - |
| මණ්ඩල සාමාජික පැමිණීමේ දීමනා | 500,797 | 66,000 |
| මහජනයා දැනුවත් කිරීමේ වියදම් | 3,318,217 | 3,677,305 |
| බැංකු ගාස්තු | 73,534 | 61,101 |
| හර බදු | 25,816 | 151,807 |

**15. බදුකරණය**
2011 දෙසැම්බර් දිනට බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

**15.1 රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳ පල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර**
2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළෙඳපොළ ගනුදෙනු මත උපයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳ ගනුදෙනුවලින් මණ්ඩලය විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රු. 14,392.29 ක් 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල වෙනමම හඳුනාගෙන ඇත.

සෙස් අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳ පල ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

**16. ප්‍රාග්ධන බැඳියාව**

2011 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළඹ නොමැත.

**17. අසම්භාව්‍ය බැරකම්**

2011 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

**18. ශේෂ පත්‍ර දිනෙන් පසු හටගත් සිද්ධි**

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කළයුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් ශේෂ පත්‍ර දිනට පසු සිදුවී නොමැත.

**19. සම්බන්ධිත පාර්ශව අනාවරණ**

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය (සභාපතිනිය), ජී. ගුණවර්ධන මහතා, නවාස් රාජාබ්ඩීන් මහතා සහ ගාමිණී කොහොන මහතා 2011 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සාමාජිකාවන් ලෙස ක්‍රියා කළහ.

ඩී.කේ. හෙට්ටිආරච්චි මහතා 2011 මැයි මස සිට නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කරන ලදී.

පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය 2011 සැප්තැම්බර් මස අවසන් වූ අතර බී.ඩී.ඩබ්ලිව්.ඒ. සිල්වා මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් වැඩ භාරග න්නා ලදී.

සමාලෝචිත වර්ෂය තුලදී වූ මණ්ඩලයේ සමාජිකයින්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපනය කෙරේ.

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සභාපතිනිය (2011 දෙසැම්බර් 05 දක්වා) |
| පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සාමාජික (2011 සැප්තැම්බර් දක්වා) |
| බී.ඩී.ඩබ්ලිව්.ඒ. සිල්වා මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් සාමාජික (2011 සැප්තැම්බර් සිට) |
| ඩී.කේ. හෙට්ටිආරච්චි මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් සාමාජික |
| ඩී. විදානගමාච්චි මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් සාමාජික |

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල සිදුකරන ලද වෙළඳ පොල අනුපාතික පදනම් වූ ගනුදෙනු හැර උක්ත ආයතනය සමඟ සමාලෝචිත වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදුකර නැත.

| 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **20. කාර්ය මණ්ඩල පිරිවැය** | | | |
| ලියාපදිංචි කිරීම සහ නියාමනය | | 7,593,164 | 6,461,546 |
| අධීක්ෂණය | | 11,563,369 | 10,518,351 |
| විමර්ශනය | | 5,746,372 | 2,610,504 |
| මහජන සබඳතා | | 1,646,540 | 1,539,262 |
| මූල්‍ය සහ පරිපාලන | | 9,513,963 | 7,844,629 |
| | | 36,063,408 | 28,974,292 |
| **21. වෘත්තීය ගාස්තු** | | | |
| දේශීය උපදේශකයන් | | 867,167 | 503,511 |
| විදේශීය උපදේශකයන් | | 466,121 | 572,678 |
| වෙනත් | | 286,496 | - |
| | | 1,619,784 | 1,076,189 |
| **22. මෙහෙයුම් වියදම්** | | | |
| ලියාපදිංචි කිරීම සහ නියාමනය | | 9,493,344 | 10,634,394 |
| අධීක්ෂණය | | 9,246,637 | 10,350,944 |
| විමර්ශනය | | 6,848,294 | 7,786,004 |
| මහජන සබඳතා | | 3,384,915 | 4,051,993 |
| මූල්‍ය සහ පරිපාලන | | 7,594,529 | 8,367,167 |
| | | 36,567,719 | 41,190,502 |

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: එෆ්බී/අයි/අයිබීඑස්එල්/ 2/2011/04 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2012 අගෝස්තු 31 දින. |

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2012 අගෝස්තු 15 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(අ) ඉතිරි කරගත් නිවාඩු සඳහා ගෙවනු ලබන දීමනාව මූලික වැටුප පදනම් කරගෙන ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් දළ වැටුප පදනම් කරගෙන එම දීමනාව ගෙවීම නිසා රු. 580,842 ක වැඩිපුර ගෙවීමක් සිදුව තිබුණි.

(ආ) රු. 20,211,966 ක වාර්ෂික කුලී පදනම මත මණ්ඩලය පවත්වා ගෙන යනු ලබන ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි පිහිටි කාර්යාල පරිශ්‍රය බෙදා වෙන් කිරීම සඳහා 2008 සහ 2009 වර්ෂවල දරන ලද රු. 2,701,825 ක වියදම බදු කාල සීමාවට අනුපාතිකව ක්ෂය කළ යුතු වුවත්, ඊට අඩු අනුපාතිකයකට ක්ෂය කර තිබුණි.

**2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 95 ප්‍රකාරව භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන ලද මූල්‍ය ප්‍රතිලාභයන් මණ්ඩලය විසින් සේවකයින්ට ගෙවා තිබුණි.

**2.2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2011 මැයි 11 සහ 12 යන දිනයන්හි පවත්වන ලද ආගමික උත්සවයක් සඳහා දරන ලද රු. 308,019 ක් සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් නිලධාරීන් 4 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණ අතර, ඒ සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු. 607,431 ක් ගෙවා තිබුණි. මේ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ සේවයේ නියුතු සේවකයින් 33 ක් සහ පවුලේ සමාජිකයින් රක්ෂණය කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 513,713 ක් වැයකර තිබුණද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ බදුවලට පෙර ප්‍රතිඵලය රු. 27,251,415 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 29,177,024 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,925,609 ක හෙවත් 7% ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ මුළු ආදායම 11% කින් වැඩි වී තිබුණු අතර, මුළු වියදම 4% කින් වැඩි වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| මුළු ආදායම | 47,099,011 | 42,306,072 |
| මුළු වියදම | (74,350,426) | (71,483,097) |
| බදුවලට පෙර ශුද්ධ ඌනතාවය | (27,251,415) | (29,177,025) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කිරීම් | *27,262,345 | 30,472,839 |
| ආදායම් බදු | (10,930) | (1,295,814) |
| ශුද්ධ අතිරික්තය | -- | -- |

* මූල්‍ය ප්‍රතිඵලයේ අවාසිදායක තත්ත්වය සමනය කිරීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් රු. 27,262,345 ක් ලාභයට මාරුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

**4.1 කාර්ය සාධනය**

2010 සහ 2011 වර්ෂවල නිලධාරීන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා රුපියල් රු. 1,332,015 ක් වැය කර තිබුණු අතර පුහුණුවීම් සම්බන්ධව නිලධාරීන් සමඟ ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාර පුහුණුවෙන් වසරකට පසුව එම නිලධාරීන් සේවයෙන් ඉවත් වුවහොත් පුහුණුව සඳහා දැරූ වියදමේ ප්‍රතිලාභ රක්ෂණ මණ්ඩලයට ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකසා නොතිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2011 වර්ෂයේ දී නේවාසික සේවක පුහුණුවීම් වැඩ සටහන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. 870,000 ක් දක්වා වැඩි කර ගෙන එම මුදලින් රු. 865,355 ක් නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ විනෝද සංචාරයක් සඳහා වැය කර තිබුණි.

**4.3 ආර්ථික නොවූ ගණුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ 11 වන මහලේ වර්ග අඩි 8741 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා කුලී පදනමට ගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 20,211,966 ක කුලියක් ගෙවා තිබුණි. මණ්ඩලයේ නිලධාරීන් 36 ක් පමණක් සිටින බැවින් එක් නිලධාරියෙකු වෙනුවෙන් ඒ අනුව රු. 561,444 ක කුලී පිරිවැයක් දරා තිබුණි. මෙම පිරිවැය අඩු කර ගැනීම හෝ විකල්ප ක්‍රියාමාර්ගයන් ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ ජනවාරි 01 දින සිට ජුනි 30 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලය විසින් පරිහරණය නොකරන ලද දුරකථන සම්බන්ධතා 06 ක් වෙනුවෙන් රු. 36,233 ක ස්ථාවර ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) දේශීය පුහුණුකිරීම් ලෙස සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මුදල් වෙන් කිරීම් කර තිබුණද, 2011 වර්ෂයේ දී නිලධාරීන් 06 දෙනෙකුට අධ්‍යාපන කටයුතු සඳහා රු. 606,881 ක් වැය කර තිබුණි.

(ඈ) 2009 සහ 2010 වර්ෂවලදීද පිළිවෙලින් රු. 60,820 ක් හා රු. 725,134 ක් නිලධාරීන් 11 දෙනෙකුගේ අධ්‍යාපනය සඳහා වැය කර තිබුණ අතර එම වර්ෂවලද සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

මණ්ඩලය අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 07 ක් 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) පුහුණු වැඩසටහන් හා කාර්ය සාධනය
(ආ) ගනුදෙනු සඳහා නිසි අනුමැතින් ලබා ගැනීම



එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

# විගණකාධිපතිවරයා විසින් මතු කළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දක්වීම |
|---|---|
| **2.2.1 ගිණුම්කරණ අඩුපාඩු** | |
| (අ) ඉතිරි කරගත් නිවාඩු සඳහා ගෙවනු ලබන දීමනාව මූලික වැටුප පදනම් කරගෙන ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් දළ වැටුප පදනම් කරගෙන එම දීමනාව ගෙවීම නිසා රු. 580,842 ක වැඩිපුර ගෙවීමක් සිදුව තිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි සේවයේ යොදවා ඇත්තේ ඉතා සීමිත පිරිසක් වන බැවින් ඔවුන් නිවාඩු ගැනීමෙන් වළකාලීමට ප්‍රමාණවත් තරම් දිරි දීමනාවක් නිවාඩු වෙනුවෙන් ගෙවීමට මණ්ඩලයේ කළමනාකරණය තීරණ ගෙන ඇත. 2011 වර්ෂයේ පටන් නිවාඩු දීමනා දළ වැටුප් නොව මූලික වැටුප් පදනම් කරගෙන ගෙවා ඇත. |
| (ආ) රු. 20,211,966 ක වාර්ෂික කුලී පදනම මත මණ්ඩලය පවත්වා ගෙන යනු ලබන ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි පිහිටි කාර්යාල පරිශ්‍රය බෙදා වෙන් කිරීම සඳහා 2008 සහ 2009 වර්ෂවල දරන ලද රු. 2,701,825 ක වියදම බදු කාල සීමාවට අනුපාතිකව ක්ෂය කළ යුතු වුවත් ඊට අඩු අනුපාතිකයකට ක්ෂය කර තිබුණි. | 2005 වසරේ දී පළමුවෙන්ම අත්සන් කරන ලද බදු කුලී ගිවිසුම පසුගිය වසර 7 තුළ වරින් වර දීර්ඝ කිරීමට සිදු විය. ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව මෙම වත්කම්වල ඵලදායී ආයු කාලය වසර 8 ක් ලෙස සලකා ක්ෂය කිරීම සිදු කර ඇත. |
| **2.2.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 95 ප්‍රකාරව භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන ලද මූල්‍ය ප්‍රතිලාභයන් මණ්ඩලය විසින් සේවකයින්ට ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සේවකයන්ට ලබාදෙන ලද සියලුම මූල්‍ය ප්‍රතිලාභයන් අධ්‍යක්ෂ මණ්ඩලීය පූර්ව අනුමැතිය මත ගෙවා ඇත. මෙම ගෙවීම් සඳහා භාණ්ඩාගාර එකඟත්වය ද ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. |
| **2.2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** | |
| (අ) මණ්ඩලය විසින් 2011 මැයි 11 සහ 12 දිනයන්හි පවත්වන ලද ආගමික උත්සවයක් සඳහා දරන ලද රු. 308,019 ක් සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2011 වර්ෂයේ දී ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම සඳහා රජය මගින් විවිධ වැඩ සටහන් සම්පාදනය කරන ලද අතර, ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඊට සහභාගී වෙමින් 2011 මැයි මස 11 දින සර්ව රාත්‍රික පිරිත් පිංකමක් ද මැයි මස 12 දින සංඝගත දක්ෂිණාවක් ද පවත්වා ඇත. |
| (ආ) මණ්ඩලය විසින් නිලධාරීන් 4 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර, ඒ සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු. 607,431 ක් ගෙවා තිබුණි. මේ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | මෙම නිලධාරීන් බඳවා ගෙන ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සේවයේ අවශ්‍යතා සඳහා ය. මෙයින් තනතුරු තුනක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ ඒවා වන අතර, අධ්‍යක්ෂ තනතුරු දෙක සඳහා පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද සුදුසු නිලධාරීන් තෝරා ගත නොහැකි විය. මෙම කොන්ත්‍රාත්තු වලින් දෙකක් 2012 දෙසැම්බර් මස නිම වන අතර, ඉතිරි දෙක 2013 මැයි සහ 2013 දෙසැම්බර් යන මාසවලදී නිමවේ.<br><br>තවද මෙම නිලධාරීන්ට ගෙවන වැටුප් හා ප්‍රතිලාභ ස්ථිර නිලධාරීන්ට ගෙවන වැටුප් හා ප්‍රතිලාභවලට වඩා බෙහෙවින් අඩු බැවින් මේ බඳවා ගැනීම් නිසා ආයතනයට මූල්‍යමය අලාභයක් සිදුව නැත. |
| (ඇ) මණ්ඩලයේ සේවයේ නියුතු සේවකයින් 33 ක් සහ පවුලේ සාමාජිකයින් රක්ෂණය කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු. 513,713 ක් වැය කර තිබුණ ද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | සේවකයන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් රක්ෂණය කිරීම 2005 අප්‍රේල් මාසයේ සිට ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇත. |
| **4.1 කාර්ය සාධනය** | |
| 2010 සහ 2011 වර්ෂවල නිලධාරීන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා රු. 1,332,015 ක් වැය කර තිබුණු අතර, පුහුණුවීම් සම්බන්ධව නිලධාරීන් සමඟ ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාර පුහුණුවෙන් වසරකට පසුව එම නිලධාරීන් සේවයෙන් ඉවත් වුවහොත් පුහුණුව සඳහා දරූ වියදමේ ප්‍රතිලාභ රක්ෂණ මණ්ඩලයට ලබාගැනීමේ ක්‍රමවේදයක් සකසා නොතිබුණි. | අදාළ පුහුණු ගිවිසුම් කාලය වසර 2 ක් දක්වා දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය දැන් තීරණය කර ඇත. අපේක්ෂකයා කුමන හෝ හේතුවක් නිසා පාඨමාලාව සම්පූර්ණ නොකළහොත්, පාඨමාලාවෙන් අසමත් වුවහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ පාඨමාලාව අතහැර දමුවහොත් පාඨමාලාව වෙනුවෙන් මණ්ඩලය වැය කළ මුදල ද ඔහු / ඇය විසින් ආපසු මණ්ඩලයට ගෙවිය යුතු වේ. නිලධාරියා පුහුණු ගිවිසුම් කාලයෙන් කොටසක් පමණක් සේවය සම්පූර්ණ කළහොත් ඉතිරි පුහුණු ගිවිසුම් කාලයට අදාළ අනුපාතික අගය මණ්ඩලයට ආපසු ගෙවිය යුතු වේ. |

| විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|
| **4.2 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා** | |
| 2011 වර්ෂයේ දී නේවාසික සේවක පුහුණුවීම් වැඩ සටහන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. 870,000 ක් දක්වා වැඩි කර ගෙන එම මුදලින් රු. 865,355 ක් නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ විනෝද සංචාරයක් සඳහා වැය කර තිබුණි. | මෙම වියදම පුහුණුවක් හා අභිප්‍රේරණ ක්‍රියාවලියක් වශයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය මත 2006 වර්ෂයේ සිටම සෑම වර්ෂයකම ඉටු කරන වැඩ සටහනක් වෙනුවෙන් දරා ඇත. 2011 වසරේ පුහුණු වැඩ සටහන මෙහෙයවන ලද්දේ ස්මාර්ට් ක්වෙස්ට් පුද්ගලික සමාගම විසිනි. මෙම විෂයය වාර්ෂික අයවැය ලේඛනයට ද ඇතුළත් කර තිබුණි. |
| **4.3 ආර්ථික නොවූ ගණුදෙනු** | |
| (අ) ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ 11 වන මහලේ වර්ග අඩි 8741 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා කුලී පදනමට ගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 20,211,966 ක කුලියක් ගෙවා තිබුණි. මණ්ඩලයේ නිලධාරීන් 36 ක් පමණක් සිටින බැවින් එක් නිලධාරියෙකු වෙනුවෙන් ඒ අනුව රු. 561,444 ක කුලී පිරිවැයක් දරා තිබුණි. මෙම පිරිවැය අඩු කර ගැනීම හෝ විකල්ප ක්‍රියාමාර්ගයන් ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | නියාමන ආයතනයක් වන මෙම ආයතනය සඳහා නිලධාරී කාර්යස්ථාන (work station) සඳහා පමණක් නොව රක්ෂණ ක්ෂේත්‍රයේ රැස්වීම් ආදිය සඳහා ද ඉඩකඩ අවශ්‍ය වේ. මේ අනුව ශ්‍රවණාගාරය, පිළිගැනීමේ කවුන්ටරය, කෑම කාමරය, සභාපති කාමරය, රැස්වීම් කාමරය, පරිගණක සේවා කාමරය (server room)" පරිගණක මේස, ලිපිගොනු තබන කබඩ්, ඡායා පිටපත් යන්ත්‍ර ආදියට ද මේ වර්ග අඩි ප්‍රමාණය උපයෝගී කරගනු ලැබේ.<br><br>අප ආයතනය සඳහා සුදුසු විකල්ප ස්ථානයක් පිරිමැසුම්දායි කුලියකට සොයා ගැනීමට උපරිම උත්සාහය ගත් නමුත් එය අසාර්ථක විය. |
| (ආ) 2011 වර්ෂයේ ජනවාරි 01 දින සිට ජුනි 30 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලය විසින් පරිහරණය නොකරන ලද දුරකථන සම්බන්ධතා 06 ක් වෙනුවෙන් රු. 36,233 ක ස්ථාවර ගාස්තු ගෙවා තිබුණි. | තනතුරු පුරප්පාඩුව පැවතීම වැනි හේතු නිසා කලක් මෙම දුරකථන භාවිත නොකළ නමුත් දැන් මෙම දුරකථන භාවිතයේ පවතී. පුරප්පාඩු පුරවන තෙක් මෙම දුරකථන විසන්ධි කළා නම් මතුවන නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු අවම කර ගැනීමට ස්ථාවර ගාස්තු ගෙවා මෙම සම්බන්ධතා රඳවාගැනීමට සිදුවිය. |
| (ඇ) දේශීය පුහුණු කිරීම් ලෙස සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මුදල් වෙන් කිරීම් කර තිබුණ ද, 2011 වර්ෂයේ දී නිලධාරීන් 06 දෙනෙකුට අධ්‍යාපන කටයුතු සඳහා රු. 606,881 ක් වැය කර තිබුණි. | 2009, 2010 සහ 2011 වර්ෂවල අයවැය ලේඛණයන්හි දේශීය පුහුණු ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් වෙනුවෙන් මණ්ඩලයේ නිලධාරීන් සහභාගී කරවීම සඳහා වන අතර අදාළ නිලධාරීන්ගේ ඉල්ලීම මත, අංශ ප්‍රධානීන්ගේ අනුමැතිය යටතේ, නිලධාරීන්ගේ දෛනික රාජකාරි වඩාත් කාර්යක්‍ෂමව හා ඵලදායීව ඉටු කරනු පිණිස ඔවුන් පුහුණු පාඨමාලා සඳහා යොමු කර ඇත. |
| (ඈ) 2009 සහ 2010 වර්ෂවල දී ද පිළිවෙලින් රු. 60,820 ක් හා රු. 725,134 ක් නිලධාරින් 11 දෙනෙකුගේ අධ්‍යාපනය සඳහා වැය කර තිබුණ අතර එම වර්ෂවල ද සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි. | වසර 3 ක් තුළ රු.250,000/= නොඉක්මවා උසස් අධ්‍යාපන වියදම් නිලධාරීන්ට ප්‍රතිපූරණය කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර, මෙම ප්‍රතිලාභය 2007 වසරේ සිට ම නිලධාරීන් භුක්ති විඳ ඇත.<br><br>මෙම වියදම නිලධාරීන්ගේ ඵලදායකත්වය ද වැඩි කරයි. |
| **4.4 කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 07 ක් 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | සුදුසු නිලධාරීන් සපයා ගත නොහැකිවීම නිසා බඳවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. |

# පරිශිෂ්ඨය I

2011 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 3 | අමානා තකාෆුල් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 4 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 6 | අවිවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී<br>(පෙරදී ඊගල් ඉන්ෂුවරන්ස් පීඑල්සී) | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 7 | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 8 | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ්* | සාමාන්‍ය රක්ෂණය |
| 9 | චාටිස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්<br>(පෙර දී හේලීස් ඒඅයිජී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්) | සාමාන්‍ය රක්ෂණය |
| 10 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 12 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 13 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 14 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 15 | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 16 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 17 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 18 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 19 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 20 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 21 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 22 | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |

* 2009 අගෝස්තු 5 වැනිදා සිට රක්ෂණ ව්‍යාපාරයෙහි යෙදීම තහනම් කර ඇත.

# පරිශිෂ්ඨය II

2011 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 2 | ඒඑස්ජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 3 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 4 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 5 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 6 | ඇලියොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 7 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 8 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 9 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 10 | සීලාන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 11 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 12 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 13 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 14 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 15 | එසාජි කරිම්ජි ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 16 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 17 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 18 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 19 | ජේ ඉන්ෂුවරන්ස් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 20 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 21 | කැළණි යුනි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 22 | එල්එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 23 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 24 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 25 | මැක්වුඩ්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 26 | මැක්ස්වෙල් එන්ටර්ප්‍රයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 27 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 28 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 29 | පයනියර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 30 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 31 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 32 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 33 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 34 | රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 35 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 36 | රෝපා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 37 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 38 | සේනාරත්න ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 39 | ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 40 | සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 41 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 42 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 43 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 44 | වික්ටර් එමැනුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 45 | වොලන්කා ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 46 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |

# පාරිභාෂික ශබ්ද මාලාව

### සමුච්චිත වීම
එක් සමාගමක් සමග පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂික අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

### අත්කර ගැනීමේ වියදම්
අභිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අලුත් කිරීම (උදා:- කොමිස් මුදල්) යන අවස්ථාවල දී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියලු වියදම්.

### ජීවගණකඥ
රක්ෂණය, ආයෝජනය, මූල්‍ය කළමනාකරණය සහ ප්‍රජා විද්‍යාව ආශ්‍රිත ගැටලුවලට සම්භාවිතා සහ සංඛ්‍යානමය සිද්ධාන්ත යොදා ගන්නා විශේෂඥයෙකි.

### පරිපාලන වියදම්
දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

### ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්
රක්ෂකයාගේ ව්‍යවස්ථාපිත නුබුන්වත්භාවය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලබන වත්කම්. මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

### වාර්ෂිකය
යම්කිසි නිශ්චිත කාල සීමාවක් සඳහා හෝ වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්බිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. විලම්බිත වාර්ෂික වාර්ෂිකලාභියා වෙත ගෙවීම් කිරීම සඳහා පරිවර්තනය කිරීමට පෙර කාලාන්තරයක් මුළුල්ලේ විලම්බනය වන බදු මුදල් ප්‍රමාණ වැඩෙන්නට ඉඩ හරියි. ක්ෂණිකව ක්‍රියාත්මක වන ජීවිත රක්ෂණ මිල දී ගෙන වර්ෂයක පමණ කාලයක් තුළ ගෙවීම් කිරීමට ඉඩ ප්‍රස්තාව සලසා දෙයි.

### ප්‍රතිලාභියා
ඔප්පු හිමියාගේ මරණයේ දී රක්ෂිත මුදල සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

### ප්‍රතිරක්ෂිතයා
ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

### හිමිකම් පෑම
දේපළ විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම, රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත් වීම යනාදී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතුකර ගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

### දරන ලද හිමිකම්පෑම
වර්ෂය ආරම්භයේ දී සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම් සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම් සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

### දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම්පෑම්
දේපළ, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

### හිඟ සිටි හිමිකම්පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම්පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

### සහභාග රක්ෂණය
නිශ්චිත වාර මුදල් එකඟවුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිපදෙනකු රක්ෂිතයා සමග ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

### කොමිස්
රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

### විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

### ඉපැයූ වාරික
ගිණුම් කාලපරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් ගැලපුම් කළ ලිඛිත වාරික මුදල්.

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
ගිනි, මුහුදු, උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්දව පවත්වාගෙන යාම. ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය.

### රක්ෂණ අවදානම
රක්ෂණයට බඳුන් වූ සිද්ධිය වීම, හිමිකම්පෑම්වල වටිනාකම හෝ හිමිකම් ගෙවීම් සිදුවන කාලය පිළිබඳව පවතින අවිනිශ්චිතතා.

### රක්ෂකයා
2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

### දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු
මරණය හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කැරෙන ගිවිසුම් ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

### කල්පිරීම
දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව.

### ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය
රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම්පෑම}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \text{ X } 100$$

### ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - ජීවිත නොවන
ශුද්ධ අලාභ අනුපාතය සමග ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන ආදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම X 100}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} + \frac{\text{වියදම් X 100}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}}$$

### ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම.

### ශුද්ධ වියදම් අනුපාතය - ජීවිත නොවන
ආදායම අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදාඃ කොමිස්, බදු, සේවක පිරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදාගනු ලබන සූත්‍රයකි.

### ශුද්ධ අලාභ අනුපාතය - ජීවිත නොවන
ශුද්ධ ඉපැයූ වාරිකවලට (අදාළ ප්‍රතිරක්ෂණ අඩු කළ පසු) දරන ලද ශුද්ධ හිමිකම්පෑම් අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

### සහභාගිත්වය රහිතව ඔප්පුව - ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු
ජීවිත රක්ෂණ ව්‍යාපාරය කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම් ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

### ඔප්පුව
රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියැවිල්ලකි.

### ඔප්පු හිමියා
රක්ෂණකරු සමග අදාළ ගිවිසුමට පැමිණි අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

### ඔප්පු ණය
ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

### වාරික
රක්ෂණයක් සඳහා රක්ෂිතයා විසින් ගෙවනු ලැබිය යුතු ප්‍රතිශ්ඨාව.

### ප්‍රාථමික රක්ෂකයා
රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමග ඍජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන).

### මෙහෙයුම් ලාභය
ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

### ප්‍රතිරක්ෂණය
එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමග අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු) එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින්

කොටසක් හෝ මුළුමනින්ම හානිපූරණය කිරීමට ඇති කරගනු ලබන එකඟතාවකි.

**ප්‍රතිරක්ෂණ කොමිස්**
ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු - කොමිස් මුදල්.

**භාරගනු ලබන ප්‍රතිරක්ෂණ**
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාරගැනීම.

**භාරදෙනු ලබන ප්‍රතිරක්ෂණ**
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

**ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්**
ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

**රඳවා ගැනීම**
භාරගනු ලැබූ අවදානමින් රක්ෂණකරු / ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත**
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති 2002 නුබුන්වත් ආන්තිකය (දිගුකාලීන රක්ෂණය) පිළිබඳ රීතියෙන් නිර්වචනය කරනු ලැබ ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යනු ලැබීමට අවශ්‍ය වත්කම්වල අගය සහ බැරකම්වල අගය යන සංඛ්‍යා දෙකෙහි වෙනස.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත නොවන (සාමාන්‍ය රක්ෂණය)**
2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති 2004 නුබුන්වත් ආන්තිකය (සාමාන්‍ය රක්ෂණය) පිළිබඳව රීතියෙන් නිර්වචනය කර ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයෙකු විසින් පවත්වාගෙන යාමට අවශ්‍ය කෙරෙන වත්කම් වල අගය සහ බැරකම්වල අගය සහ සංඛ්‍යාවන් දෙකෙහි වෙනස.

**පවාරණ අගය**
ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල් පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල. පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3 ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

**ප්‍රාරක්ෂණ ලාභය**
ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මගින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

**නොඉපැයූ වාරිකය**
ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

**නොඉපැයූ වාරික සංචිතය**
දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම්පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරභයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

**කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය**
ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇතිවිය හැකි හිමිකම්පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවන ප්‍රමාණය

# සටහන්

සටහන්

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
එච්ලන් චතුරස්‍රය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.

දුරකථන : +9411 2396184-9
ෆැක්ස් : +9411 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

## නෛතික ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

## අධ්‍යක්ෂක මණ්ඩලයේ අරමුණු සහ වගකීම්

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යාම අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් ඒවා පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ භව්‍ය ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය

දෙසැම්බර් 31

## විගණකවරු

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

ඩී. විදානගමාච්චි මහතා - සභාපති
නවාස් රාජාබ්ඩීන් මහතා
ගාමිණී කොහොන මහතා

10 YEARS

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

වාර්ෂික වාර්තාව 2011



## අපේක්ෂිත අරමුණු වෙත...

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**
11, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථනː +94 11 2396184-9 ෆැක්ස්ː +94 11 2396190
www.ibsl.gov.lk